ඉහළ විශ්වාසනීයත්වයක් උදෙසා

SLAASMB

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන
ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

# 2024

# වාර්ෂික වාර්තාව

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත මගින් සංස්ථාපනය කරන ලදී.

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ඉදිරිපත් කිරීමේදී හා විගණනය කිරීමේදී, ශ්‍රී ලංකා ගිණුම් හා ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට එකඟව ක්‍රියාකරන බවට අධීක්ෂණය කිරීම මණ්ඩලයේ කාර්යභාරය වේ. (60 පිටුව බලන්න)

# පටුන


මණ්ඩලයේ සාමාජිකයන්.....01
මණ්ඩලයේ සාමාජිකයන් 2024 දෙසැම්බර් 31 දිනට.....03
මණ්ඩලයේ නිරීක්ෂකයින් / ආරාධිතයන් 2024 දෙසැම්බර් 31 දිනට.....06
2024 වර්ෂය තුළදී මණ්ඩලය මගින් පත් කළ අනු කමිටු.....08
2024 වර්ෂය තුළදී මණ්ඩලයේ කාර්ය මණ්ඩලය.....09
මණ්ඩලයේ තාක්ෂණික කාර්ය මණ්ඩලය - 2024 දෙසැම්බර් 31 දිනට.....10
ක්‍රියාකාරකම් වාර්තාව - 2024.....11
2024 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම්.....19
2024 2024 වසර තුළ නීති උපදෙස් සඳහා යොමු කිරීම්.....21
2024 වර්ෂයේ විගණන පරීක්ෂණ වල සොයා ගැනීම්.....23
ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයෙහි 2025 වර්ෂයේ කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා අනුගමනය කළ යුතු කෙටි කාලීන සහ මධ්‍ය කාලීන පියවර.....26
කාර්යසාධන ලකුණු පත.....27
2024 වර්ෂයේ දී සමාලෝචනය කරන ලද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් (SBE) ලැයිස්තුව.....29
2024 වර්ෂයේ දී සමාලෝචනය කරන ලද, මූල්‍ය ප්‍රකාශන ප්‍රමිතීන්ට අනුකූල වූ නමුත් හඳුනාගැනීම් නිරීක්ෂණ ලිපි මගින් සන්නිවේදනය කරන ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් (SBEs) ලැයිස්තුව.....32
2024 දෙසැම්බර් 31 දිනට විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ ලැයිස්තුගත සමාගම් සහ රාජ්‍ය අංශයේ ආයතන.....35
2024 වර්ෂයේ දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රමිති සැකසීමට අදාළ ක්‍රියාකාරකම්.....36
විගණකාධිපති වාර්තාව.....38
විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී ඇති ගැටළු සම්බන්ධයෙන් පවතින වත්මන් තත්ත්වය පිළිබඳව ලබා දෙන ලද පිළිතුරු.....40
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.....46
මූල්‍ය කාර්යසාධනය සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය.....47
ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය.....48
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.....49
මූල්‍ය ප්‍රකාශන වලට සටහන්.....50
කාර්යසාධනයේ දස වසරක සාරාංශය.....58
නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන්.....60

# වාර්ෂික වාර්තාව - 2024

# මණ්ඩලයේ සාමාජිකයන්

| | | |
|---|---|---|
| **කේ එම් ඒ එන් දවුලාගල මිය** *FCMA (UK), MBA (USJP) MSc in Financial and Business Economics (Essex)*<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිනිය - ශ්‍රී ලංකා මහ බැංකුව | සභාපතිනිය | |
| **එස්. දිසානායක** *LLM, Attorney-at-Law*<br>සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් | නිල බලයෙන් පත් වූ සාමාජික<br>*(2024 අප්‍රේල් 30 දක්වා)* | |
| **ඩබ්ලිව්.ඒ.එස්. චන්ද්‍රසේකර මිය** *B.Sc Business Admin (USJP), MA Econ (UoK)*<br>දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | නිල බලයෙන් පත් වූ සාමාජික | |
| **සී. මෙන්ඩිස්** *Attorney-at-Law*<br>අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ | නිල බලයෙන් පත් වූ සාමාජික | |
| **ඩබ්ලිව්.ඩබ්ලිව්.ජේ.සී. පෙරේරා** *FCA, FCMA, B.Sc Business Admin (USJP), CFE*<br>හවුල්කරු - කේපීඑම්ජී | පත් කළ සාමාජික<br>*(2024 පෙබරවාරි 16 දක්වා)* | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය |
| **එච්.එම්.ඒ. ජයසිංහ** *FCA, FCMA, CIPFA*<br>හිටපු සභාපති - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, හිටපු දේශීය කළමනාකරණ හවුල්කරු - අර්නස්ට් ඇන්ඩ් යන්ග්, ශ්‍රී ලංකාව සහ මාලදිවයින | පත් කළ සාමාජික<br>*(2024 පෙබරවාරි 16 දක්වා)* | |
| **එස්.එම්.එස්.එස්. බණ්ඩාර** *FCA, MBA (Col.), B.Sc (Acc. and Fin. Management) (USJP)*<br>ආසන්නතම හිටපු සභාපති - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, හවුල්කරු - බී ආර් ද සිල්වා සහ සමාගම | පත් කළ සාමාජික | |
| **කේ.ඒ.එච්. කුරුප්පු** *FCA, MBA (PIM) (MSc Fin. Economics. (Col), B.Sc Accountancy (USJP)*<br>සභාපති, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, උපදේශක දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනය *(SAFA)*, සමූහ මූල්‍ය අධ්‍යක්ෂ - ඩේවිඩ් පීරිස් සමාගම් සමූහය | පත් කළ සාමාජික<br>*(2024 මාර්තු 14 සිට)* | |
| **ටී.එච්. සුබසිංහ** *FCA, CPFA (UK), FCMA, CISA (USA), MBA (Fin) (Col), LLB (Hons), Attorney-at-Law*<br>උප සභාපති, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය<br>සාමාජික, දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනය *(SAFA)*<br>සාමාජික, ආසියානු සහ ශාන්තිකර ගණකාධිකාරී සම්මේලනය *(CAPA)*<br>කළමනාකරණ හවුල්කරු - මුවර් අයියර් | පත් කළ සාමාජික<br>*(2024 මාර්තු 1 සිට)* | |
| **පී.ආර්.ඒ.අයි. ගුණරත්න** *ACMA (UK), CGMA, ACCA Affiliate, Dip. in Banking and Fin., B.Sc. Eng. (Hons), MBA (UK)*<br>අධ්‍යක්ෂ, ආයතනික මූල්‍ය - සිනමන් හෝටල් සහ නිවාඩු නිකේතන | පත් කළ සාමාජික<br>*(2024 මාර්තු 1 දක්වා)* | එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය *(CIMA)* ශ්‍රී ලංකා අංශය |
| **එම්. අමරසිරි** *MBA, FCMA (UK), CGMA, B.Sc (Eng.)*<br>සමූහ ප්‍රධාන මූල්‍ය නිලධාරී, ඒසීඑල් කේබල්ස් පොදු සමාගම | *(2024 අප්‍රේල් 18 සිට)* | |
| **ආර්.ටී. අමරසූරිය** *LLB* (ගෞරව) *(Col.), FCMA (UK), FCMA (SL), CGMA, AFGG- Raisina Fellow, Attorney-at-Law*<br>හිටපු ලේකම්, ශ්‍රී ලංකා නීතිඥ සංගමය<br>හිටපු කොමිෂන් සභික, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව<br>විධායක කමිටු සාමාජික *LAWASIA* | පත් කළ සාමාජික<br>*(2024 ජූනි 9 දක්වා)* | ශ්‍රී ලංකා නීතිඥ සංගමය |
| **එන්. ගුණවර්ධන**<br>*Attorney-at-Law, CFA, ACA, ACMA*<br>පුරෝගාමී හවුල්කරු - නිත්‍යා පාට්නර්ස් | *(2024 ජූලි 11 දින සිට)* | |

# මණ්ඩලයේ සාමාජිකයන්

| | | |
|---|---|---|
| **එම්.පී. අබේසේකර මිය** *FCMA (UK), CGMA, FCA, B.Sc (Hons.) (Col.), MBA (Col.), GSLID*<br>ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ - කප්රුක හෝල්ඩිංග්ස් පොදු සමාගම | පත්කළ සාමාජික<br>*(2024 මාර්තු 1 දක්වා)* | ලංකා වාණිජ මණ්ඩලය |
| **ආර්.එම්.ආර්.ඩී. රාජපක්ෂ මිය** *FCMA (UK), CGMA, CFA*<br>ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ - ෆස්ට් කැපිටල් හෝල්ඩින්ග්ස් පොදු සමාගම | *(2024 ජුලි 11 දින සිට)* | |
| **කේ.කේ.එස්. ගුණවර්ධන** *BA (Hons.) Econ. Sp., Dip.in Hypermedia Eng. (Col.), Dip.in Multimedia Technology (Col.), PGDip in Busi. and Fin. - ICA (SL)*<br>කළමනාකාර අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී ග්‍රැෆික් සිස්ටම්ස් (පුද්ගලික) සමාගම | පත් කළ සාමාජික<br>*(2024 ජුලි 02 දක්වා)* | ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය |
| **ඩබ්ලිව්.පී.ආර්.පී.එච්. ෆොන්සේකා** *FCA, SFIBs (SL), B.Sc Busi. Admin (Hons.) (USJP), PGDip in Mgmt. (PIM), MBA (Ausi.)*<br>සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී ලංකා බැංකුව | පත් කළ සාමාජික<br>*(2024 පෙබරවාරි 16 දක්වා)* | ශ්‍රී ලංකා බැංකු සංගමය |
| **ඒ.යූ. දැලගේ මිය**<br>*FCA, ACMA, CGMA, B Sc. (Acc. and Fin Mgmt.) Hons (USJP), CPA*<br>ප්‍රධාන මූල්‍ය නිලධාරී - හැටන් නැෂනල් බෑන්ක් පොදු සමාගම, | *(2024 මාර්තු 14 සිට)* | |
| **මහාචාර්ය ඒ. ජයමහ** *FCA, PhD (USQ-Aus.), M.Com (UoK), B.Com (UoK),*<br>පීඨාධිපති - පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය | පත් කළ සාමාජික<br>*(2024 මැයි 25 දක්වා)* | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |
| **ඩී. විරතුංග මහත්මිය** *CCS*<br>*Secretarius (Pvt) Ltd* | අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | |

# මණ්ඩලයේ සාමාජිකයන්

2024 දෙසැම්බර් 31 දිනට



**කේ එම් ඒ එන් දවුලාගල මිය**
*FCMA (UK), MBA (USJP),*
*MSc in Financial and Business*
*Economics University of Essex*

මණ්ඩලයේ සභාපතිනිය වශයෙන් කටයුතු කරන දවුලාගල මිය ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිනියයි. ඇය ශ්‍රී ලංකා මහ බැංකුවේ වසර 33 කට අධික කාලයක් සේවය කර ඇති අතර, මූල්‍ය, විගණනය, සංචිත කළමනාකරණය, නියාමනය සහ අධීක්ෂණය, සාර්ව විචක්ෂණශීලී අධ්‍යයන, මානව සම්පත් කළමනාකරණය සහ අවදානම් කළමනාකරණය යන ක්ෂේත්‍රවල අත්දැකීම් ලබා තිබේ.



**ඩබ්ලිව් ඒ එස් චන්ද්‍රසේකර මහත් මිය**
*B.Sc, Business Administration (Sp.) (USJP),*
*MA Econ (UoK)*

ශ්‍රී ලංකා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරිය ලෙස චන්ද්‍රසේකර මහත්මිය කටයුතු කරයි. ඇය ශ්‍රී ලංකා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වසර 31 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර තිබේ.



**සී මෙන්ඩිස්**
*Attorney-at-Law*

මෙන්ඩිස් මහතා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වේ.



**කේ.ඒ.එච්. කුරුප්පු මහතා**
*FCA, MBA (PIM), MSc Financial*
*Economics (Colombo), B.Sc*
*Accountancy (USJP)*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA Sri Lanka) සභාපති වන කුරුප්පු මහතා, දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ (SAFA) උපදේශකයෙකු ලෙසද සේවය කරයි. ඔහු වර්තමානයේ ඩේවිඩ් පීරිස් සමාගම් සමූහයේ සමූහ මූල්‍ය අධ්‍යක්ෂ ධුරය දරන අතර එහි අනුබද්ධිත සමාගම් කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ද සේවය කරයි.

කුරුප්පු මහතා 2024 දී SAFA සභාපති සහ 2023 දී උප සභාපති යන කීර්තිමත් තනතුරු හෙබවීය. ඊට අමතරව, ඔහු ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ කොමසාරිස්වරයෙකු ලෙස ද කටයුතු කරයි.

# මණ්ඩලයේ සාමාජිකයන්

2024 දෙසැම්බර් 31 දිනට



**ටී.එච්. සුබසිංහ මහතා**

*FCA, CPFA (UK), FCMA, CISA (USA)*
*MBA (Fin.) Col.), LL.B (Hons.),*
*Attorney-at-Law*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ උප සභාපති වන සුබසිංහ මහතා දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ (SAFA) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසත්, ආසියානු සහ ශාන්තිකර ගණකාධිකාරී සම්මේලනයේ (CAPA) තේරී පත් වූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසද කටයුතු කරයි.

වර්තමානයේ ඔහු මුවර් කන්සල්ටින් පෞද්ගලික සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයා සහ මුවර් අයියාර් හි ඒකාබද්ධ කළමනාකාර හවුල්කරු වේ. ඊට අමතරව, ඔහු සණස ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් හි සභාපතිවරයා ලෙස ද, අමානා බැන්ක් පොදු සමාගමේ ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයා ලෙස ද කටයුතු කරයි. මොරටුව විශ්වවිද්‍යාලයේ පාලක සභා සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරන ඒ මහතා රජයේ විශ්වවිද්‍යාල කිහිපයක බාහිර කථිකාචාර්යවරයෙකු ද විය.

සුබසිංහ මහතා නීති සහ රෙගුලාසි සරල කිරීම පිළිබඳ ජනාධිපති කොමිසමේ සාමාජිකයෙකු ලෙසත්, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පිහිටුවන ලද අසාර්ථක බලපත්‍රලාභී මූල්‍ය සමාගම් පුනර්ජීවනය සඳහා වූ උපදේශන කමිටුවේ සාමාජිකයෙකු ලෙසත් සේවය කර තිබේ.



**එස් එම් එස් එස් බණ්ඩාර මහතා**

*FCA, MBA (Colombo), B.Sc*
*Accountancy and Financial*
*Management (USJP)*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආසන්නතම හිටපු සභාපතිවරයා වන බණ්ඩාර මහතා, බී. ආර්. ද සිල්වා වරලත් ගණකාධිකාරීවරුන්ගේ සමාගමේ හවුල්කරුවෙකු ලෙස වසර 25කට අධික කාලයක් සේවය කරන අතර එහි රක්ෂණ සේවා සහ මූල්‍ය වාර්තාකරණය පිළිබඳව ප්‍රායෝගිකව කටයුතු කරන විශේෂඥයෙකු වේ.

ඔහු ආසියා ශාන්තිකර ගණකාධිකාරී සම්මේලනයේ (CAPA) සහ දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ (SAFA) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ද වේ. තවද, ඔහු කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ කොමසාරිස්වරයෙකු ලෙස සේවය කර ඇත.



**මහේෂ් අමරසිරි මහතා**

*MBA, FCMA, CGMA, B.Sc (Eng)*

ඩීසීඑල් කේබල්ස් පොදු සමාගමේ සමූහ ප්‍රධාන මූල්‍ය නිලධාරී ලෙස සේවය කරන මහේෂ් අමරසිරි මහතා උපායමාර්ගික සැලසුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ වසර 20 කට අධික පළපුරුද්දක් ලබා ඇත.

එයට පෙර, අමරසිරි මහතා ඩීඑස්අයි සමූහ ව්‍යාපාරයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ එන්ඩීබී කැපිටල් හෝල්ඩින්ග්ස් පොදු සමාග මේ පුද්ගලික හිමිකම් කළමනාකරණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ උප සභාපති ඇතුළු ජ්‍යෙෂ්ඨ නායකත්ව භූමිකාවන් හොබවන ලදී. ඔහු එට්සලාට් ලංකා (පුද්ගලික) සමාගමේ, එන්ඩීබී ඉන්වෙස්ට්මන්ට් බෑන්ක් (NDBIB) සහ මාස් හෝල්ඩින්ග්ස් සමාග මේ උපායමාර්ගික සැලසුම් ප්‍රධානියා ලෙසද සේවය කර තිබේ.

ඔහුගේ ආයතනික භූමිකාවන්ට අමතරව, අමරසිරි මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යවස්ථාපිත ගිණුම්කරණ ප්‍රමිත කමිටුවේ ද සේවය කරයි. මෙයට පෙර ඔහු ශ්‍රී ලංකා පාරිභෝගික කටයුතු කවුන්සිලයේ සාමාජිකයෙකු සහ එක්සත් රාජධානියේ වරලත් ගණකාධිකාරී ආයතනයේ ශ්‍රී ලංකා අංශයේ කවුන්සිලියේ සාමාජිකයෙකු ද විය.

# මණ්ඩලයේ සාමාජිකයන්
2024 දෙසැම්බර් 31 දිනට



**නයෝමාල් ගුණවර්ධන මහතා**
*Attorney-at-Law, CFA, ACA, ACMA*

නිත්‍යා පාර්ට්නර්ස්, නීතිඥ සමාගමේ පූර්වගාමී හවුල්කරු වන ගුණවර්ධන මහතා ණය නිකුත් කිරීම්, බැංකු නියාමනය, ව්‍යුත්පන්නයන්, සුරැකුම්පත්කරණය සහ සමාගම් ප්‍රතිව්‍යුහගත කිරීම සහ බදු නීතිය වැනි මූල්‍ය නීති ආශ්‍රිත ක්ෂේත්‍රවල විශේෂඥයකු වේ.

ඒ මහතා වර්තමානයේ සමාගම් නීති උපදේශක කොමිසමේ සාමාජිකයෙකු, ලංකා වාණිජ මණ්ඩලයේ බදු කමිටුවේ සාමාජිකයෙකු සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA Sri Lanka) ආයතනික පාලන කමිටුවේ (Corporate Governance) සාමාජිකයෙකු ලෙස ද කටයුතු කරයි.



**ඒ.යූ. දැලගේ මහත් මිය**
*FCA, ACMA, CGMA, B.Sc Accountancy and Financial Management (Hons.) (USJP), CPA*

හැටන් නැෂනල් බැන්ක් පොදු සමාගමේ ප්‍රධාන මූල්‍ය නිලධාරිනි දැලගේ මහත්මිය, මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 22 කට අධික පළපුරුද්දක් ලබා තිබේ. ඇය සිත්මා ඩෙවලොප්මන්ට් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකාවක් ද වෙයි.



**ආර්.එම්.ආර්.ඩී. රාජපක්ෂ මහත් මිය**
*FCMA(UK), CGMA, CFA*

ෆස්ට් කැපිටල් හෝල්ඩින්ග්ස් පොදු සමාගමේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරියක වන රාජපක්ෂ මහත්මිය අරමුදල් කළමනාකරණය සහ මූල්‍ය ක්ෂේත්‍රවල වසර 30 කට අධික පළපුරුද්දක් ලබා ඇත.

ඇය ටෙනිසන් සහ විනීතා රොද්‍රිගෝ භාරයේ ස්වාධීන මූල්‍ය උපදේශකවරියක් සහ උපදේශක කමිටු සාමාජිකාවක් ලෙස ද සේවය කරයි.

රාජපක්ෂ මහත්මිය CFA සංගමයේ ශ්‍රී ලංකා අංශයේ ආරම්භක සාමාජිකාවක් වූ අතර වසර ගණනාවක් අධ්‍යක්ෂවරියක් ලෙස ද සේවය කළාය. ඇය ශ්‍රී ලංකාවේ ප්‍රයිස්වෝටර්හවුස් කූපර්ස් හිදී සිය වෘත්තීය ගමන ආරම්භ කළ අතර, ඉන් පසුව සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් හි ජ්‍යෙෂ්ඨ අරමුදල් කළමනාකාරිනියක් ලෙස සිය සේවා කාලයෙන් වැඩි කාලයක් ගත කළාය. ඇය IBM ශ්‍රී ලංකාවේ සහ බංග්ලාදේශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරිනිය ලෙසද සේවය කර ඇත.

# මණ්ඩලයේ නිරීක්ෂකයින් / ආරාධිතයින්

2024 දෙසැම්බර් 31 දිනට

**ව්‍යවස්ථාපිත විගණන ප්‍රමිත කමිටුවේ සභාපති**

**ටී ජේ එස් රාජකාරිය**

*FCA, FCCA, FCMA, CGMA*



ශ්‍රී ලංකාවේ කේපීඑම්ජී හි ජ්‍යෙෂ්ඨ හවුල්කරු වන රාජකාරිය මහතා, පොදු ගිණුම්කරණ පරිචයේ වසර 38 කට අධික කාලයක් සේවය කර ඇත. ඔහු කේපීඑම්ජී හි ප්‍රධාන මෙහෙයුම් නිලධාරියා වේ. ඔහු කේපීඑම්ජී හි මැදපෙරදිග සහ දකුණු ආසියානු කලාපයේ මූල්‍ය සේවා ප්‍රධානියා ලෙස කටයුතු කර ඇති අතර, දැනට ශ්‍රී ලංකාවේ විගණන පරිචයේ ප්‍රධානියා ලෙස අඛණ්ඩව කටයුතු කරයි. ඔහුගේ සේවා අත්දැකීම් තුළ, ඕමානය, ඩුබායි, මාලදිවයින සහ ලන්ඩනයේ දී ලබා ඇති විදේශ අත්දැකීම් ද ඇතුළත් වේ. ඔහු 2018 - 2020 කාලය තුළ වරලත් සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (ACCA) ශ්‍රී ලංකා අංශයේ සභාපතිවරයා ලෙස ද කටයුතු කර ඇත.

රාජකාරිය මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යවස්ථාපිත විගණන ප්‍රමිත කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කරන අතර ව්‍යවස්ථාපිත ගිණුම්කරණ ප්‍රමිත කමිටුවේ සාමාජිකයෙකු ද වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ තවත් කමිටු සහ පීඨ කිහිපයක සේවය කරමින් ප්‍රතිපත්ති සැකසීමට සහ මඟපෙන්වීමට ඔහු ක්‍රියාකාරීව දායක වී ඇත.

**ගිණුම්කරණ ප්‍රමිත කමිටුවේ සභාපති**

**එච්.එම්.ඒ. ජයසිංහ**

*FCA, FCMA, CIPFA*



ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හිටපු සභාපතිවරයෙකු වන ජයසිංහ මහතා, අර්නස්ට් ඇන්ඩ් යන්ග්, ශ්‍රී ලංකාව සහ මාලදිවයින ආයතනයේ හිටපු දේශීය කළමනාකරණ හවුල්කරු විය. ඔහු අර්නස්ට් ඇන්ඩ් යන්ග් හි බැංකු සහ මූල්‍ය සේවා පරිචය භාර සහතික වීමේ ප්‍රධානියා ලෙසද කටයුතු කර ඇත.

ගිණුම්කරණය සහ විගණනය පිළිබඳ වසර 41 ක පුළුල් අත්දැකීම් ලබා ඇති ජයසිංහ මහතා, දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ (SAFA) ගිණුම්කරණ ප්‍රමිත කමිටුවේ සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යවස්ථාපිත ගිණුම්කරණ ප්‍රමිත කමිටුවේ සභාපති ලෙස සේවය කරයි. එමෙන්ම, ඔහු තවත් බොහෝ ව්‍යවස්ථාපිත ආයතන සහ වෘත්තීය සංගම්වල සාමාජිකයෙකු ලෙස ද සේවය කරයි. ඔහු ජාත්‍යන්තර ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (IFAC හි) ගණකාධිකාරී අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර මණ්ඩලයේ ද සේවය කරයි.

**ඒ අයි මොහොට්ටි**

*FCA, FCMA (UK), CGMA, BBA (Hons.) (Colombo), MBA (Leicester)*

### මණ්ඩලයේ නිරීක්ෂක - භාණ්ඩාගාර නියෝජිත

**එම්.ටී.වී.අයි. අමරසේකර මිය**
*B.Sc. (Hons) Economics & Management, MA*



අමරසේකර මහත්මිය, මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරියක් ලෙස සේවය කරන අතර රාජ්‍ය අංශයේ වසර 22 කට අධික පළපුරුද්දක් ලබා ඇත. ඇය ආයතන ගණනාවක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස සේවය කර ඇති අතර වර්තමානයේ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ජයවර්ධනපුර රෝහල සහ ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ ආයතනය ඇතුළු මණ්ඩලවල සාමාජිකාවක් ලෙස කටයුතු කරයි.

### අධ්‍යක්ෂ ජනරාල්

**ඒ.අයි. මොහොට්ටි මිය**
*FCA, FCMA (UK), CGMA, BBA (Hons.) (Colombo), MBA (Leicester)*



ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ (SLAASMB) අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කරන මොහොට්ටි මහත්මිය, මූල්‍ය හා ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයේ සහ විගණන ක්ෂේත්‍රවල වසර 36 කට අධික පළපුරුද්දක් ලබා ඇත. ඇය එම කාලයෙන් වසර 24කට අධික කාලයක් SLAASMB හි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන්නන් නියාමනය කිරීමේ කටයුතු සහ ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන්ට අනුකූලවීම සම්බන්ධයෙන් සිදු කරන විගණන කටයුතු නියාමනය කිරීමේ කටයුතුවල නිරත වී ඇති අතර වර්තමානයේ එම කටයුතු මෙහෙයවීමේ නියැලී ඇත. SLAASMB නියාමනය කණ්ඩයමේ සාමාජිකාවක් වීමට ප්‍රථම, ඇය කාසන් කම්බබැච් පොදු සමාගම් සමූහයේ මූල්‍ය පාලක ලෙස සේවය කළ අතර අර්න්ස්ට් සහ යං සමාගමේ දී සිය වෘත්තීය ගමන අරඹා ඇත.

# 2024 වර්ෂයේ තුලදී මණ්ඩලය විසින් පත් කළ කමිටු සහ අනු කමිටු

### විගණන කමිටුව

එස්.එම්.එස්.එස්. බණ්ඩාර මහතා - සභාපති
ඒ.යූ. දැලගේ මිය - සාමාජික
එම්.ටී.අයි.වී. අමරසේකර මිය- සාමාජික
එල්.ඩී.ආර්.එල්. ලියනගේ මිය - විගණකාධිපතිවරයාගේ නියෝජිත - නිරීක්ෂක
සාමාජික නොවන ලේකම් - එච්.බී. රසාක් මිය (අධ්‍යක්ෂ තාක්ෂණ)

### පාරිශ්‍රමික කමිටුව

කේ.එම්.ඒ.එන්. දවුලාගල මිය - සභාපතිනි
එන්. ගුණවර්ධන මහතා
ටී.එච්. සුබසිංහ මහතා - සාමාජික
ආර්.එම්.ආර්.ඩී. රාජපක්ෂ මිය - සාමාජික
එම්.ටී.අයි.වී. අමරසේකර මිය - සාමාජික
සාමාජික නොවන ලේකම් - ඒ.අයි. මොහොට්ටි මහත්මිය (අධ්‍යක්ෂ ජනරාල්)

### තාක්ෂණ උප කමිටුව

ආර්.එම්.ආර්.ඩී. රාජපක්ෂ මිය - සභාපති
එස්.එම්.එස්.එස්. බණ්ඩාර මහතා - සාමාජික
ඒ.යූ. දැලගේ මිය - සාමාජික
එම්. අමරසිරි මහතා - සාමාජික
සාමාජික නොවන ලේකම් - ඒ. අහමත් මිය (නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්)

### ආචාර ධර්ම කමිටුව

එන්. ගුණවර්ධන මහතා - සභාපති
කේ.එම්.ඒ.එන්. දවුලාගල මිය - සාමාජික
සී. මෙන්ඩිස් මහතා - සාමාජික
ටී.එච්. සුබසිංහ මහතා - සාමාජික
ටී.ජේ.එස්. රාජකාරිය මහතා
සාමාජික නොවන ලේකම් - ඒ. අහමත් මිය (නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්)

### සේවාදායකයන් ආයතනයෙන් ඉවත් වී යෑමේ දී අවසන් සම්මුඛ පරීක්ෂණය මෙහෙයවීම

ආර්.එම්.ආර්.ඩී. රාජපක්ෂ මිය

# 2024 වර්ෂය තුළදී මණ්ඩලයේ කාර්ය මණ්ඩලය






1. එච් ඒ කලණි එස් හෙට්ටිආරච්චි මිය
2. ආශා අහමත් මිය
3. අනුෂා අයි මොහොට්ටි මිය
4. හෆ්සා බී රසාක් මිය
5. අග්‍රා එම් දොඩම්ගොඩ මිය
6. එම් නුස්කා එෆ් නලීම් මෙනවිය
7. එෆ් ඒ පි ශිරෝමි අබේකෝන් මිය
8. ඩී පී සංඛ එස් කුමාරසිරි
9. තාරක ආර් ජයසේකර
10. බී ටි ඒ පැතුම් බණ්ඩාර
11. කේ එච් පි බිනර එල් අමරසිංහ
12. කේ රසික එස් බණ්ඩාර
13. යු ඩී එන් මල්ෂානි මිය
14. දුමින්දා කේ ගුරුවත්ත මිය

## මණ්ඩලයේ තාක්ෂණික කාර්ය මණ්ඩලය - 2024 දෙසැම්බර් 31 දිනට

**අනූෂා අයි. මොහොට්ටි මිය**
*FCA, FCMA (UK), CGMA, MBA (Leicester) UK, BBA (Hons) (Col)*
*අධ්‍යක්ෂ ජනරාල්*

**ආශා අහමත් මිය**
*FCA, MBA (Col)*
*නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්*

**හර්ෂා බී. රසාක් මිය**
*FCA, ACMA (UK), CGMA, MBA (USJP)*
*නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්*

**එච්.ඒ. කලණි එස් හෙට්ටිආරච්චි මිය**
*FCA, ACCA, MBA (PIM-USJ), B.SC. (Acc) Sp (Hons) (USJP)*
*අධ්‍යක්ෂ අධීක්ෂණ*

**අග්‍රා එම්. දොඩංගොඩ මිය**
*FCA, MBA (USQ), PGDBF, BBA (Hons) (Col)*
*අධ්‍යක්ෂ අධීක්ෂණ*

**කේ.එච්.පී. බිනර එල්. අමරසිංහ මයා**
*ACA, B.Com (Sp in Acc. & Finance) (EUSL)*
*සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ*

**ටී.ආර්. ජයසේකර මයා**
*වරලත් ගණකාධිකාරී අවසන් විභාගය සමත්, B.Com (Special) (USJ)*
*සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ*

**ටී.අයි. සමරසිංහ මයා**
*CA Passed Finalist, B.B.A. (Special) (UoP)*
*සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ*

# ක්‍රියාකාරකම් වාර්තාව - 2024

## 1. හැඳින්වීම

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනත යටතේ නියාමන ආයතනයක් වශයෙන් ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය (ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.) එහි ක්‍රියාකාරී මෙහෙයුම් 2000 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. පනත මගින් ඇතැම් ආයතන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් (SBE) ලෙස නිර්වචනය කරනු ලබන අතර (නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගේ නිර්වචනය සඳහා 60 පිටුව බලන්න) එවැනි නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය සිය මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLASs) අනුකූල විය යුතු අතර මෙම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායවල විගණන කටයුතු සිදු කිරීමේ දී, ඔවුන්ගේ විගණකවරුන් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (SLAuS) අනුකූල විය යුතුය. පනතට අනුව, එම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් විසින් ඔවුන්ගේ වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. වෙත ඉදිරිපත් කළ යුතු අතර එමඟින් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. හට එම ගිණුම් හා එහි විගණන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූල වීම පිළිබඳව අධීක්ෂණය කිරීමට හැකි වේ.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් ලැබුණු මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි විගණන පරීක්ෂා කිරීම, ප්‍රමිතීන්ට අනුකූල වීමට අපොහොසත් වීම සම්බන්ධ විමර්ශන පැවැත්වීම සහ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සහ ඔවුන්ගේ විගණකවරුන් විසින් ප්‍රමිතීන්ට අනුකූල නොවීම සම්බන්ධයෙන් යෝග්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම මගින් සිය කාර්යයන් ඉටු කරනු ලබයි. පනත යටතේ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාශයට පත් කිරීම හෝ සම්මත කිරීම සිදු කරනු ලැබේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට නිර්දේශ ඉදිරිපත් කිරීම සහ එවැනි ප්‍රමිතීන් අනුගමනය කිරීමට සහාය වීම සඳහා, පනත යටතේ ගිණුම්කරණ ප්‍රමිති කමිටුවක් සහ විගණන ප්‍රමිති කමිටුවක් ස්ථාපනය කර ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (IFRSs) සහ ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය (IASB) මගින් සකස් කරන ලද ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන් (IASs) මත පදනම්ව ගිණුම්කරණ ප්‍රමිති සම්මත කරයි. එසේම සම්මත කර ගන්නා ලද විගණන ප්‍රමිතීන් ජාත්‍යන්තර විගණන සහ සහතික කිරීමේ ප්‍රමිති මණ්ඩලය (IAASB) විසින් සකස් කරන ලද ජාත්‍යන්තර විගණන ප්‍රමිති (ISAs) මත පදනම් වේ. වර්තමානයේ දී, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, එම ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම්කරණ ප්‍රමිති 41ක් සහ විගණන ප්‍රමිති 38ක් පමණ සම්මත කරගෙන ඇති අතර නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් සහ ඔවුන්ගේ විගණකවරුන් විසින් එම ගිණුම්කරණ ප්‍රමිති සහ විගණන ප්‍රමිති පිළිපැදිය යුතුය.

## 2. මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය

### 2.1. සමාලෝචන සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේදය

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ඔවුන්ගේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරයි. ඒ අනුව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල හඳුනාගැනීම් සහ මැනීමේ අවශ්‍යතා මෙන්ම ඉදිරිපත් කිරීමේ සහ හෙළිදරව් කිරීමේ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරමින් මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරයි. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් ප්‍රමිතීන්ට අනුකූල නොවන බව අනාවරණය කර ගත් විට, එවැනි අනුකූල නොවීම්වල ප්‍රමාණවත්භාවය මත පදනම්ව අදාළ ක්‍රියාමාර්ග ආරම්භ කරනු ලැබේ. ඒ අනුව, ප්‍රමාණාත්මකතාවයෙන් යුතු ප්‍රමිතීන්ට අනුකූල නොවීම් ඇතිවීමට හේතු නිරීක්ෂණය නොවූ අවස්ථාවල, එම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල ලෙස සලකනු ලැබේ. කෙසේ වෙතත් මූල්‍ය ප්‍රකාශනවලට ප්‍රමාණාත්මක වන ප්‍රමිතීන්ට අනුකූල නොවීම් හඳුනාගත් විට, එවැනි හඳුනාගැනීම් ව්‍යවස්ථාපිත විධි විධාන භාවිතා කිරීමට හේතු නොවන අවස්ථාවල එවැනි මූල්‍ය ප්‍රකාශන නිරීක්ෂණවලට අනුකූල ලෙස සලකනු ලබන අතර එම සොයා ගැනීම් අනාගතයේ අනුකූලතාවන් වැඩිදියුණු කිරීම සඳහා සහය වීමට සහයක ලිපි ආකාරයෙන් අදාල නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය වෙත යවනු ලැබේ.

ප්‍රමිතීන්ගෙන් බැහැරවීම් මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්යසාධනය ප්‍රමාණාත්මක ලෙස වෙනස් කරන අවස්ථාවන්හිදී, මීළඟ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීම සඳහා එවැනි නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය වෙතින් එකඟතාවන් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලය අපේක්ෂා කරයි. මේ ක්‍රියාවලියේදී අනුකූල නොවීම් පුනරාවර්තන ස්වභාවයක් ගන්නා අවස්ථාවල අපේක්ෂා කරන වැඩිදියුණු කිරීම් සිදු නොවන විටදී සහ නියාමකයා ලෙස ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. වෙත ලබා දී ඇති තොරතුරු නොමඟ යන සුළු අවස්ථාවලදී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් එවැනි නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් වෙත ලිපියක් නිකුත් කරමින් වැරදි භාවිතයන් පිළිබඳ අනතුරු අඟවා අනාගතයේදී ඔවුන්ගේ මූල්‍ය වාර්තාකරණය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ඔවුන්ට තරයේ දැනුම් දෙනු ලැබේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලින් බැහැරවීම්, ව්‍යවස්ථාවේ විධිවිධානවලට පටහැනි වන නමුත්, එම උල්ලංඝනයන්ගේ බරපතල ස්වභාවයක් නොමැති විට, මණ්ඩලය විසින් නියෝගයක් නිකුත් කරනු ලැබේ. කෙසේ වුවද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලින් බැහැරවීම් මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ ඉදිරිපත් කිරීම කෙරෙහි පුළුල් බලපෑමක් ඇති කරන අතර එමඟින් මූල්‍ය ප්‍රකාශන නොමඟ යවන සුළු අවස්ථාවල, ව්‍යවස්ථාව මත පදනම්ව නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

### 2.2. මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයේ විශේෂ අවස්ථා

2024 දෙසැම්බර් 31 දින වන විට, පනත මගින් නියම කර ඇති නිර්ණායක සපුරා ඇති බවට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් ආයතන 1,708 ක් හඳුනාගෙන ඇත. ඒවා, 1995 අංක 15 දරන පනත යටතේ නිරීක්ෂණය කළ යුතු නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය ලෙස හැඳින්වේ. වසර තුළ, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 1,708ක්, මූල්‍ය ප්‍රකාශන කට්ටල 1,718ක් ඉදිරිපත් කර ඇති අතර ඉන් සමහරක් පෙර වර්ෂවලට අදාළ විය. ඒ හා සමානව, ඉකුත් වර්ෂය තුළ, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් 1,566 ක් විසින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 1,732ක් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. වෙත ඉදිරිපත් කර තිබුණි.

2023 වසරේ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. මුහුණ දුන් සමාලෝචන කාර්යයන් මැනවින් ඉටු කිරීමට හැකි සහ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන්හි මූල්‍ය ප්‍රධානීන් හා විගණන ආයතන වල විගණන හවුල්කරුවන් හා සමව තාක්ෂණික දැනුමෙන් කටයුතු කිරීමට නිපුණතා ඇති කාර්ය මණ්ඩලයක උග්‍ර හිඟය, 2024 ද පැවතුණි. එයට වෘත්තීය කාර්ය මණ්ඩලයට අදාළ වන වැටුප් පරිමාණයන් ගේ පවතින ඌන මට්ටම සහ වැටුප් සංශෝධනයන්ට අනුමැතියන් ලබාගැනීමට කරන ලද ප්‍රයත්නවල දී මුදල් අමාත්‍යාංශය ගන්නා ලද මන්දගාමී ක්‍රියා පිළිවෙත හේතු විය. මෙම කරුණට දීර්ඝ කාලයක සිට පවතින විසඳුම් ලැබීමේ ප්‍රමාදය හේතුවෙන් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලයේ දීර්ඝ කාලීනව සේවය කළ තාක්ෂණික අංශයෙන් කුසලතා පූර්ණ කාර්ය මණ්ඩලයේ සැලකිය

# ක්‍රියාකාරකම් වාර්තාව - 2024

යුතු සංඛ්‍යාවක් සේවයෙන් ඉවත් වූ අතර, වසර තුළ ප්‍රධාන අධීක්ෂණ කාර්ය මණ්ඩල තනතුරු පිරවීමට ශ්‍රී ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලයට නොහැකි විය.

කෙසේ වුවද, මූලික බඳවා ගැනීමේ සුදුසුකම් ලිහිල් කිරීම නිසා, අධීක්ෂණ කාර්ය මණ්ඩලයට සිව්දෙනෙකු සම්බන්ධ කර ගැනීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. ට හැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2023 වසර තුළ, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් 261කට අදාළ මූල්‍ය ප්‍රකාශන කට්ටල 261ක සමාලෝචනයන්ට සාපේක්ෂව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් 381කට අදාළ මූල්‍ය ප්‍රකාශන කට්ටල 388ක සමාලෝචන සම්පූර්ණ කරන ලදී.

මූල්‍ය ප්‍රකාශන සමාලෝචන වඩාත් ඵලදායි ලෙස ආවරණය කිරීම සඳහා පෙර වසරකදී බඳවා ගත් විදේශීය උපදේශකයෙකු විසින් කරන ලද නිර්දේශ මත පදනම්ව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් ප්‍රවර්තන වර්ෂය තුළ ද, සමාලෝචනය සඳහා මූල්‍ය ප්‍රකාශන තෝරා ගැනීමේ දී මූල්‍ය ප්‍රකාශනවල සංයුතියේ මිශ්‍ර ආකෘතියක් අනුගමනය කරමින් සමාලෝචන සිදුකරන ලදී. එය අවදානම් පාදක ප්‍රවේශයක් සහ අහඹු සහ මාරුවෙන් මාරුවට යොදාගන්නා ප්‍රවේශයන් ඒකාබද්ධ කරමින් සිදු විය. ඉහත සඳහන් වාර්තා තෝරාගැනීමේ දී, ඉහළ අවදානම් සහිත ආයතන තෝරා ගැනීමට තීරණය කිරීමේදී, ආයතනවල මහජන වගවීම ද සලකා බලන ලද අතර, එමඟින් කලින් සඳහන් කළ පරිදි, සම්පූර්ණ කරන ලද සමාලෝචනවලින් 60% ක් නියාමනය කරන ලද ආයතනවලින් සමන්විත වූ අතර ඉතිරිය ආර්ථික වශයෙන් වැදගත් පෞද්ගලික ආයතන නියෝජනය කරන ලදී. මෙම සමාලෝචනය කරන ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායවල සංයුතිය මගින් පුද්ගලික ආයතනවල මූල්‍ය ප්‍රකාශන වසර 3-5 චක්‍රය තුළ ආවරණය කිරීමට හැකි වේ යැයි අපේක්ෂා කෙරේ.

අවදානම් පාදක ප්‍රවේශය යටතේ සමාලෝචනය සිදු කරන ලද්දේ කර්මාන්තය කේන්ද්‍ර කර ගත් අවදානම් නිර්ණායක මත පදනම්වය. මෙම තේමා කේන්ද්‍රිය සමාලෝචන ප්‍රවේශය, කාර්ය මණ්ඩලයට උසස් තත්ත්වයේ ආයතනික වාර්තාකරණයක් සඳහා වැදගත් වන අංශ හඳුනා ගැනීමට මග පෑදූ ප්‍රමිතීන්හි නිශ්චිත අංශ කෙරෙහි වඩාත් ගැඹුරින් අවධානය යොමු කිරීමට අවකාශ දුන්නේය.

වසර තුළ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් අවධානය යොමු කරන ලද ප්‍රධාන තේමාවන් අතරට බැංකු සහ මූල්‍ය සමාගම්වල මූල්‍ය වත්කම් මෙන්ම ලැයිස්තුගත සමාගම්වල මූල්‍ය නොවන වත්කම්වල හානිකරණවලට අදාළව හඳුනා ගැනීම, මැනීම සහ හෙළිදරව් කිරීම සහ පෞද්ගලික ආයතනවල මුදල් ප්‍රවාහ ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ පෞද්ගලික ආයතනවල දේපළ, පිරියත සහ උපකරණවල ආයෝජන දේපළ සම්බන්ධයෙන් හඳුනා ගැනීම, මැනීම සහ හෙළිදරව් කිරීම ඇතුළත් විය.

# ක්‍රියාකාරකම් වාර්තාව - 2024

### 2.3. මණ්ඩලයේ කාර්යසාධන සංඛ්‍යාලේඛන

| | | 2024 | 2023 |
|---|---|---|---|
| 1. | **හඳුනාගන්නා ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සංඛ්‍යාව (කාලච්ඡේදයේ අවසාන දිනට)** | 1,708 | 1,707 |
| 2. | **ලැබුණු මූල්‍ය ප්‍රකාශන** | | |
| | මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව (මුදල් වර්ෂ කිහිපයකට අදාළව ලද මූල්‍ය ප්‍රකාශන ඇතුළුව) | 1,718 | 1,732 |
| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සංඛ්‍යාව | 1.708 | 1.566 |
| 3. | **සමාලෝචන නිම කරන ලද මූල්‍ය ප්‍රකාශන (සම්පූර්ණ කරන ලද)** | | |
| | සමාලෝචන සංඛ්‍යාව | 388 | 261 |
| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සංඛ්‍යාව | 381 | 261 |
| 4. | **සමාලෝචනවලින් සොයාගත් දෑ** | | |
| | **4.1 අනුකූලවීම්** | | |
| | මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 198 | 192 |
| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සංඛ්‍යාව* | 197 | 192 |
| | **4.2 නිරීක්ෂණ සහිතව අනුකූල වීම්** | | |
| | මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 190 | 66 |
| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සංඛ්‍යාව* | 184 | 66 |
| | **4.3 අනුකූල නොවීම්** | | |
| | (එකඟතා, විධාන, අනතුරු ඇඟවීම්) | | |
| | මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | - | 3 |
| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සංඛ්‍යාව* | - | 3 |
| 5. | **සමාලෝචනය කළ මූල්‍ය ප්‍රකාශනවල % ලෙස මූල්‍ය ප්‍රකාශන වලින් සොයා ගැනීම්** | | |
| | අනුකූලවීම් | 51% | 74% |
| | නිරීක්ෂණ සහිතව අනුකූල වීම් | 49% | 25% |
| | | 100% | 99% |
| | අනුකූල නොවීම් (එකඟතා, විධාන, අනතුරු ඇඟවීම්) | - | 1% |
| 6. | **නිම කරන ලද විගණන පරීක්ෂණ** | | |
| | පරීක්ෂණ සංඛ්‍යාව | 22 | 16 |
| | විගණන සමාගම් සංඛ්‍යාව | 6 | 6 |
| 7. | **විගණන පරීක්ෂණවල සොයාගැනීම්** | | |
| | **7.1 අනුකූලවීම්** | | |
| | පරීක්ෂණ සංඛ්‍යාව | 19 | 13 |
| | විගණන සමාගම් සංඛ්‍යාව | 4 | 5 |
| | **7.2 නිරීක්ෂණවලට අනුකූලවීම්** | | |
| | පරීක්ෂණ සංඛ්‍යාව | 3 | 3 |
| | විගණන සමාගම් සංඛ්‍යාව | 3 | 3 |
| 8. | **පරීක්ෂණවල නිරත වූ පරීක්ෂණ කාර්යමණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව (වර්ෂය අවසානයේ දී) ** ** | 7 | 4 |

* සමාලෝචනය කරන ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායට අදාළ විවිධ වර්ෂ ගණන බැහැර කර ඇත.

** නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් දෙදෙනා ඇතුළුව

# ක්‍රියාකාරකම් වාර්තාව - 2024

*සමාලෝචන නිමකරන ලද මූල්‍ය ප්‍රකාශන වලින් නියෝජනය වන අංශ*




2024 වර්ෂය තුළ සමාලෝචල සොයා ගැනීම්වලින් පෙනී ගියේ, සමාලෝචනවල අවධානය යොමු කරන ලද ක්ෂේත්‍ර මත පදනම්ව, සමාලෝචනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් 51%ක් ගිණුම් ප්‍රමිත වලට අනුකූල වූ බවත්, මූල්‍ය ප්‍රකාශනවලින් 49%ක් අනුකූල වූ නමුත් ඒවායේ නිරීක්ෂණ සහාය ලිපි මගින් සන්නිවේදනය කරන ලද බවත්ය.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ගෙන් අනාවරණය වූ අපගමනයන්, ව්‍යවස්ථාපිත විධිවිධාන භාවිත කරමින් ක්‍රියා පටිපාටි භාවිතා කිරීමට අවශ්‍ය නොවූ විට, විමසීම්වලින් තොරව නිරීක්ෂණ ලෙස ලිපි මගින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් වෙත දැනුම් දෙනු ලදී, එවිට, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන්වලට අවශ්‍ය අවස්ථාවන්හිදී, ඔවුන්ගේම අනුකූලතාවය වැඩිදියුණු කළ හැකිය. වර්ෂය තුළ දී, මූල්‍ය ප්‍රකාශන කට්ටල 190ක් සම්බන්ධයෙන් නිරීක්ෂණ ලිපි නිකුත් කරන ලදී.

(2024 වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම් සම්බන්ධ විස්තර සඳහා 32 පිටුව බලන්න.)

## 3. විගණන පරීක්ෂාව

ඉකුත් වර්ෂය තුළදී පරීක්ෂා කරන ලද සමාගම් 6ක් විසින් සිදු කරන ලද විගණන 16 සමඟ සැසඳීමේ දී, මෙම වර්ෂය තුළ වරලත් ගණකාධිකාරී සමාගම් 6ක් විසින් සිදු කරන ලද විගණන 22ක් පරීක්ෂාවට ලක් කරන ලදී. පහත 7.1 හි විස්තර කර ඇති පරිදි, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. හි ඇති පරීක්ෂණ කාර්ය මණ්ඩල සංඛ්‍යාවේ අඩුවීම හේතුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් දෙදෙනා ද විගණන පරීක්ෂණවල නිරත වීම නිසා පරීක්ෂණ සංඛ්‍යාව වැඩි වීමට හේතු විය.

වර්ෂය තුළ පරීක්ෂණ සිදු කරන ලද විගණන ලිපිගොනු අවදානම පාදක ප්‍රවේශයක් මත තෝරා ගන්නා ලදී. පරීක්ෂණවල සොයාගැනීම් මත පදනම්ව, විගණන 19ක්, පරීක්ෂණවලදී අවධානය යොමු කරන ලද ක්ෂේත්‍රවලට අදාළව ශ්‍රී.ලං.වි.ප්‍ර. (SLAuS) සමඟ අනුකූල වී තිබුණි. ඉතිරි පරීක්ෂණ 3 හි සොයාග ැනීම් සඳහා ව්‍යවස්ථාව යටතේ වැඩිදුර ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය නොවූ අතර එම සොයාගැනීම් නිරීක්ෂණ ලිපි මගින් අදාළ විගණකවරුන්ට දන්වන ලදී. මෙම සොයාගැනීම් විගණන සැලසුම් කිරීම, අවදානම් තක්සේරුව, විගණන සාක්ෂි රැස් කිරීම, නියැදි තෝරා ගැනීම, පාලනයට සම්බන්ධ පාර්ශ්ව (TCWG) සමඟ සන්නිවේදනය කිරීම, තත්ත්ව පාලන සමාලෝචකයින් සම්බන්ධ කර ගැනීම, විගණක වාර්තාව සහ අඛණ්ඩ පැවැත්ම යන ක්ෂේත්‍රවල විගණන අඩුපාඩු හා සම්බන්ධ විය.

2023 වර්ෂය තුළ නිරීක්ෂණ සන්නිවේදනය කරන ලද සමාගම් 3ක් විසින් පවත්වන ලද විගණන 3 ට සාපේක්ෂව, 2024 වසරේ නිරීක්ෂණ සන්නිවේදනය කරන ලද විගණන 3 සමාගම් 3ක් විසින් සිදු කරන ලදී.

(2024 වර්ෂය තුළ විගණන පරීක්ෂාව පිළිබඳ සොයාගැනීම් සඳහා 23 පිටුව බලන්න.)

## 4. පරීක්ෂණ සහ නීතිපති වෙත යොමු කරන ලද කරුණු

### 4.1 ඇඩම් කැපිටල් පීඑල්සී

ඇඩම් කැපිටල් පීඑල්සී විසින් නිසි ගිණුම් පොත් සහ වාර්තා පවත්වා ගැනීමට අපොහොසත් වූ අවස්ථාවේ එම මූල්‍ය ප්‍රකාශන විගණනය කළ විගණකවරයා තත්ත්වාගණනය නොකළ විගණන මතයක් නිකුත් කිරීම හේතුවෙන් 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නැවත විගණනය කරන ලෙස ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලය විසින් ඇඩම් කැපිටල් පීඑල්සී වෙත නියෝගයක් නිකුත් කිරීමට ප්‍රතිචාර ලෙස නැවත විගණනයක් සිදු කිරීමට අමතර පිරිවැය දැරීමට සමාගම අකමැති බව දැන්වීය.

එයට ප්‍රතිචාර වශයෙන්, එම විගණකවරයා විසින් විගණන ප්‍රමිතීන් අඛණ්ඩව උල්ලංඝනය කිරීම සහ ඊළඟ වසරේ මූල්‍ය ප්‍රකාශන විගණනයේ දී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලය විසින් සන්නිවේදනය කරන ලද කරුණු විසඳීමට එම විගණකවරයා අපොහොසත්වීම නිරීක්ෂණය කිරීමෙන් පසු, නීතිපතිවරයාගේ උපදෙස් මත පදනම්ව, විගණකවරයාට සහ සමාග මට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. කටයුතු කර ඇත.

# ක්‍රියාකාරකම් වාර්තාව - 2024

### 4.2. බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී

බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී විසින් 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඔවුන්ගේ මූල්‍ය ප්‍රකාශනවල අසම්පූර්ණ සහ වැරදි තොරතුරු ප්‍රකාශයට පත් කර ඇති බවත්, එමඟින්, 1995 අංක 15 දරන පනතේ 6 (1) වගන්තිය මගින් අවශ්‍ය පරිදි 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා නිසි ගිණුම් පොත් පවත්වා ගැනීමට අපොහොසත් වී ඇති බවත්, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් නිරීක්ෂණය කරන ලද අතර, ඔවුන්ගේ විගණකවරයා එම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතය ව්‍යවනය කර තිබුණි.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, නීතිපතිවරයාගේ උපදෙස් මත පදනම්ව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් සිටියි.

### 5. ප්‍රමිති සකස් කරන ආයතනයට සහාය දැක්වීම

1995 අංක 15 දරන පනත යටතේ ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ  ගිණුම්කරණ ප්‍රමිති කමිටුව සහ විගණන ප්‍රමිති කමිටුව, ශ්‍රී ලංකාව තුළ ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් සම්මත (නීතිගත) කිරීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ කවුන්සලයට නිර්දේශ ඉදිරිපත් කරන අතර ඒ සඳහා සහාය වේ.

වර්ෂය තුළ, ඉහත කමිටු විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වලට පහත සඳහන් දෑ ඇතුළත් විය.

- ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය (IASB) විසින් නිකුත් කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKASs) බන්ධිත වෙළුම 2024 ප්‍රකාශයට පත් කිරීම.
- සම්මත කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ ගැසට් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම;
  - o තිරසාරභාවය හෙළිදරව් කිරීමේ ප්‍රමිතීන් SLFRS S1- පොදු අවශ්‍යතා
  - o තිරසාරභාවය හෙළිදරව් කිරීමේ ප්‍රමිතීන් SLFRS S2 - දේශගුණයට අදාළ හෙළිදරව් කිරීම
- පහත සඳහන් ජාත්‍යන්තර විගණන ප්‍රමිතීන් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් ලෙස අනුගමනය කිරීම:
  - o සංකීර්ණතාව අඩු අස්තිත්ව සඳහා ජාත්‍යන්තර විගණන ප්‍රමිතිය (LCE සඳහා ISA),
  - o ජාත්‍යන්තර විගණන ප්‍රමිතිය ISA 600, විශේෂ සලකා බැලීම් - සමූහයේ මූල්‍ය ප්‍රකාශන විගණන (සංරචක විගණකවරුන්ගේ කාර්යය ඇතුළුව), සහ
  - o ජාත්‍යන්තර විගණන ප්‍රමිතිය ISA 250, මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා බලපැවැත්වෙන මූල්‍ය ප්‍රකාශන විගණනයක නීති සහ රෙගුලාසි සලකා බැලීම.
- හඳුනාගත් මූල්‍ය ආයතනවල මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී මූල්‍යකරණ (ML/TF) අවදානම් කළමනාකරණ රාමුව සහ පරිවයන් විගණන ස්වභාවයේ ක්‍රියා පටිපාටිවලට යටත් වන බව සහතික කිරීම සඳහා වඩා හොඳ පැහැදිලි බවක් සඳහා අවම අවශ්‍යතා නියම කරන එකඟ වූ ක්‍රියා පටිපාටිවල මාර්ගෝපදේශ පිරික්සුම් ලැයිස්තුව පිළිබඳ ශ්‍රී ලංකා ආශ්‍රිත සේවා ප්‍රායෝගික ප්‍රකාශන (SLRSPS) 4755 හි ඇමුණුම යාවත්කාලීන කරන ලදී.
- රජයේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට අඛණ්ඩව සහාය ලබා දීම.
- SLFRS 9 මූල්‍ය උපකරණවලට අනුකූලව ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර සඳහා ගිණුම්කරණ ක්‍රමවේදය පිළිබඳ නිතර අසනු ලබන ප්‍රශ්න (FAQ) නිකුත් කරන ලදී.
- සංශෝධිත SLFRSs/LKASs සහ SLAuSs සංශෝධනය කිරීම සහ ගැසට් කිරීම. එවැනි ප්‍රකාශන සිංහල සහ දෙමළ භාෂාවලට පරිවර්තනය කිරීම.
- නිරාවරණ කෙටුම්පත්වලට ප්‍රතිචාර දැක්වීම සහ ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය සහ ජාත්‍යන්තර විගණන සහ සහතික කිරීමේ ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කරන ලද IFRSs/ISAs සහ සංශෝධන පිළිබඳව සාකච්ඡා කිරීම සහ,
- නව හෝ සංශෝධිත ප්‍රමිතීන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන්/සැසි සහ වෙබිනාර් පැවැත්වීම.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලය කමිටු දෙකෙහි පිරිවැය පියවා ගැනීම සඳහා සහ SLFRSs/ LKASs සම්මත කර ගැනීම සඳහා ප්‍රමිත සැකසීමේ ක්‍රියාකාරකම් සඳහා සහාය වීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට වාර්ෂික ප්‍රදානයක් ලබා දීමට මුදල් අමාත්‍යාංශය සමඟ පැවති ගිවිසුම අඛණ්ඩව පවත්වාගෙන යයි.

වසරක් තුල මණ්ඩලය මෙම කාර්ය සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට රු. මිලියන 2ක ප්‍රදානයක් ලබා දී තිබේ.

(2024 වර්ෂයේ දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රමිත සැකසීමට අදාළ ක්‍රියාකාරකම් සඳහා 36 පිටුව බලන්න).

### 6. ජාත්‍යන්තර සබඳතා

මූල්‍ය වාර්තාකරණය, විගණනය සහ අනුකූලතා අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් ලොව පුරා සිදුවන වර්ධනයන් පිළිබඳ දැනුවත් වීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.මණ්ඩලය බොහෝ ජාත්‍යන්තර සංවිධානවල සාමාජිකත්වය දරයි. එමගින් අනෙකුත් ගෝලීය නියාමන ආයතනවලින් තොරතුරු සහ සහාය ලබා ගැනීමටත්, ඒකාබද්ධ ක්‍රියාකාරකම් ලෙස බොහෝ නියාමන ආයතනවලට ප්‍රයෝජනවත් වන ක්‍රියාකාරකම් සිදු කිරීමටත් මණ්ඩලයට අවස්ථාව විවර වී ඇත.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලය විසින් 2007 වර්ෂයේ පැවති ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදයේ (IFIAR) පළමු පූර්ණ (Plenary) රැස්වීමේ සිට එහි සාමාජිකත්වය ලබාගෙන ඇත. මීට අමතරව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලයේ කාර්ය මණ්ඩලය එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් වාර්ෂිකව පවත්වනු ලබන ජාත්‍යන්තර ගිණුම්කරණ සහ වාර්තාකරණ ප්‍රමිතීන් පිළිබඳ අන්තර් රාජ්‍ය විශේෂඥයින්ගේ (ISAR) සැසිවාරවලදී ශ්‍රී ලංකාව නියෝජනය කරයි. තවද, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් 2018 වර්ෂයේ සිට නිරීක්ෂකයෙකු වශයෙන් ASEAN විගණන නියාමක කණ්ඩායම (AARG) නියෝජනය කරයි.

රට තුළ පවතින අභියෝගාත්මක ආර්ථික තත්ත්වය හේතුවෙන් රජය විසින් ක්‍රියාත්මක කරන ලද දැඩි අයවැය පාලනයන් හේතුවෙන් ඉහත ජාත්‍යන්තර සංවිධාන විසින් පවත්වනු ලබන කිසිදු භෞතික සැසිවාරයකට සහභාගී වීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලයට නොහැකි විය. කෙසේ වුවද, වසර තුළ අතථ්‍ය ආකාරයෙන් සමහර සැසි පැවැත්වීම හේතුවෙන්, IFIAR විසින් පවත්වන ලද "විගණන හා අධීක්ෂණ කටයුතුවලදී පුද්ගලයන් හා සහයෝගය නොදෙන ක්‍රියාදාමයන්ට අභියෝග කිරීම පිණිස කෘත්‍රිම බුද්ධිය (AI) හඳුන්වා දීම සහ ක්‍රිප්ටෝ සම්බන්ධ විගණන" යන මැයෙන් පැවැත් වූ වෙබිනාර් සඳහා සහභාගී වීමට කාර්ය මණ්ඩලයට හැකි විය.

# ක්‍රියාකාරකම් වාර්තාව - 2024

ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදය (IFIAR) විසින් පවත්වනු ලබන සැසි සඳහා ලොව පුරා ස්වාධීන විගණන නියාමකයින් සහභාගී වන බැවින්, මෙම රැස්වීම් සහ සම්මන්ත්‍රණ සාමාන්‍යයෙන් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලය සඳහා තොරතුරු බෙදා ගැනීමේ වේදිකාවක් නිර්මාණය කරයි. කෙසේ වුවද, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලයෙහි කාර්ය මණ්ඩලයට දැනට භෞතිකව පවත්වනු ලබන සැසිවලට සහභාගී වීමට නොහැකි වීම හේතුවෙන් සැසිවාරවල ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී ඇත.

මෙම ගෝලීය සැසිවාර සඳහා සහභාගී වීම ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලයේ ධාරිතා වැඩි කිරීමට ඉතා වැදගත් වී ඇති අතර අතීතයේ දී මෙන්ම රැස්වීම්, පරීක්ෂණ වැඩමුළු සහ සම්මන්ත්‍රණවලට සහභාගී වීම නිසා ලොව පුරා සිටින සෙසු විගණන නියාමකයින් සමග සාකච්ඡා කිරීමට සහ ජාලගත වීමට හැකියාව ලැබී තිබේ. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලය විසින් රට තුළ නියාමන පරිසරය ශක්තිමත් කිරීම සඳහා එහි නියාමන යාන්ත්‍රණය නවීකරණය කිරීමට අතීත ගෝලීය මනා භාවිතයන් පිළිබඳ අධ්‍යයන ඉවහල් වී ඇත. ඒ හා සමානව, මෙම ජාලගත යාන්ත්‍රණ හරහා, වසර ගණනක් තිස්සේ අනුගමනය කරන ලද නියාමන ක්‍රමවේද වැඩිදියුණු කිරීම සඳහා මූල්‍ය වාර්තාකරණය සහ විගණන නියාමනය කිරීමේ ක්ෂේත්‍රවල විශේෂඥයන් හඳුනා ගැනීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලයට හැකි වී ඇත.

## 7. මානව සම්පත්

### 7.1. කාර්ය මණ්ඩලය

2024 දෙසැම්බර් 31 දින වන විට, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලයේ සේවක මණ්ඩල තනතුරු තිස් තුන (33) අතරින් සම්පූර්ණ කාර්ය මණ්ඩලය පහළොස් (15) දෙනෙක් සේවයේ යෙදී සිටියහ. වසර තුළ දෙදෙනෙකු (02) ඉල්ලා අස්වීමත් සමඟ, පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. බොහෝ ප්‍රයත්න දරන ලද නමුත් එය සාර්ථක නොවූ අතර එමඟින්, වසර පුරා උග්‍ර කාර්ය මණ්ඩල හිඟයක් සහිතව කටයුතු කිරීමට මණ්ඩලයට සිදු විය. වසර අවසානය වන විට, සමස්ත තාක්ෂණික කාර්ය මණ්ඩලය වරලත් ගණකාධිකාරිවරුන් 6 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, ඔවුන් සියලු දෙනා ස්ථිර පදනම මත සේවයේ යොදවා ඇති අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් දෙදෙනෙකු සහ අධ්‍යක්ෂ අධීක්ෂණ දෙදෙනෙකු (02) සහ සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ එක් (01) අයෙකු ඇතුළත් විය. ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. සතුව තව සහකාර අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සිටින අතර ඔවුන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසන් විභාගයට පෙනී සිටී.

2019 සිට අධීක්ෂණ කාර්ය මණ්ඩල තනතුරුවල පුරප්පාඩු සහිතව ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. මණ්ඩලය වසර ආරම්භ කළ අතර, එම පුරප්පාඩු පිරවීමට බොහෝ උත්සාහයන් දැරුවද, සාර්ථක නොවීය. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. හි නියාමන කාර්යයන් සඳහා වසර දහයකට වැඩි කාලයක් නිරතව සිටි අධ්‍යක්ෂ අධීක්ෂකවරයෙකු ඉල්ලා අස්වීම හේතුවෙන් මුළු තාක්ෂණික කාර්ය මණ්ඩලයේ පිරිස් බලය 12 සිට 2 දක්වා අඩු විය. මෙම තත්ත්වය තුළ, මණ්ඩලය තනතුරු පිරවීම සඳහා සාමූහික උත්සාහයක් ගත් අතර, එමඟින් එක් අධ්‍යක්ෂ අධීක්ෂණ තනතුරක් පිරවීමට හැකි විය. ඒ හා සමානව, බඳවා ගැනීමේ මූලික සුදුසුකම් අඩු කිරීම මගින්, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ තනතුරු තුනක් (03) සඳහා බඳවා ගැනීම් සිදු කළ අතර, මුළු තාක්ෂණික කාර්ය මණ්ඩලය හතක් (07) දක්වා වැඩි විය. එහි ප්‍රතිඵලයක් ලෙස, වසර අවසානයේදී, අධීක්ෂණ කාර්ය මණ්ඩලයේ මුළු පුරප්පාඩු සංඛ්‍යාව හතක් (7) විය. එම පුරප්පාඩු තනතුරු හත (7) අතර අධ්‍යක්ෂ අධීක්ෂණ තනතුරු හතරක් (04) සහ සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ තනතුරු තුන (03) කින් සමන්විත විය. මෙම පුරප්පාඩු පැවතීම, පිරිනමන වැටුප් පරිමාණයන්හි මනා පළපුරුද්දක් සහිත, තාක්ෂණික වශයෙන් කුසලතා සහිත වරලත් ගණකාධිකාරිවරුන් ආකර්ෂණය කර ගැනීමේදී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. මුහුණ දෙන ලද දුෂ්කරතා පිළිබිඹු කරයි. පුරප්පාඩු පිරවීම සඳහා වෘත්තීය කාර්ය මණ්ඩලය ආකර්ෂණය කර ගැනීම සහ රඳවා ගැනීම සඳහා පවතින එකී වැටුප් ගැටළුව සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය සමඟ දශකයකට වැඩි කාලයක් තිස්සේ සාකච්ඡා කරන ලදී. වර්තමානයේ, වෘත්තීය කාර්ය මණ්ඩලයේ දිගුකාලීන වැටුප් ගැටළුව විසඳීමට පහසුකම් සැලසීම සඳහා ගරු මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් 2023 අගෝස්තු මාසයේදී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. වෙත ලබා දුන් විශේෂ අනුමැතිය මත, 2021 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද වැටුප් පරිමාණයන් අදාළ කළ බැවින් වෘත්තීයමය වශයෙන් දක්ෂ කාර්ය මණ්ඩලයක් ආකර්ෂණය කර ගැනීමට මෙය ප්‍රමාණවත් වී නොමැත.

වසර තුළ ඉල්ලා අස්වීම් හේතුවෙන් මූල්‍ය හා පරිපාලන අංශයේ අංශ ප්‍රධානියෙකු නොමැතිව මාස 6 කට ආසන්න කාලයක් ක්‍රියාත්මක වූ අතර, එම අංශයේ අනෙකුත් ප්‍රධාන තනතුරු කිහිපයක් පුරවන ලදී.

සමාලෝචන කාර්යයන්හි නියැලී සිටින කුසලතා සහිත තාක්ෂණික කාර්ය මණ්ඩලයේ අඛණ්ඩ හිඟය හේතුවෙන් අපේක්ෂිත මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සංඛ්‍යාව සීමා විය. කෙසේ නමුත් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරියන් දෙදෙනා ගේ සෘජු සහභාගිත්වයේ ප්‍රතිඵලයක් ලෙස කරන ලද විගණන පරීක්ෂණ ප්‍රමාණය වැඩි විය. එහි අතුරු ප්‍රතිඵලයක් වූයේ එම නිලධාරීන්ගේ විෂය පථයට අදාළ තීරණ ගැනීමේ කාර්යභාරයන්ට වෙන් කළ හැකි වූ කාලය සීමා වීමයි. තවද පුරප්පාඩු වූ ප්‍රධාන මූල්‍ය හා පරිපාලන කාර්යයන් සෙසු තාක්ෂණික කාර්ය මණ්ඩලය විසින් කළයුතු වීමෙන් කළ හැකි වූ සමාලෝචන සංඛ්‍යාව අඩු විය.

මෙම පසුබිම තුළ, සමාලෝචන ආවරණය වැඩි දියුණු කිරීමේ පියවරක් ලෙස, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. විසින් මූල්‍ය ප්‍රකාශන සමාලෝචනවල මූලික සමාලෝචන කාර්යය ඉටු කිරීම සඳහා වසර ගණනාවක් පුරා සම්බන්ධ වී සිටි බාහිර සමාලෝචක මණ්ඩලයේ සේවාවන් අඛණ්ඩව ලබා ගන්නා ලදී. කෙසේ වුවද, දැනට සිටින තාක්ෂණික කාර්ය මණ්ඩලය විසින් සම්පූර්ණයෙන් සිදු කරන ලද සමාලෝචනවලට අමතරව, බාහිර සමාලෝචක මණ්ඩලය විසින් මූලික සමාලෝචන සිදු කරන ලද සමාලෝචන නිම කිරීමේ කාර්යයන් ද තාක්ෂණික කාර්ය මණ්ඩලය විසින් සිදු කළ යුතු වූ බැවින් කළ හැකි සමාලෝචන ආවරණ ප්‍රමාණය සීමා කිරීමට සිදු විය. ඒ හා සමානව, දැනට සිටින තාක්ෂණික කාර්ය මණ්ඩලය විසින් විගණන පරීක්ෂණ ද සිදු කළ යුතුය.

### 7.2. බාහිර සමාලෝචක මණ්ඩලය

2012 වසරේ දී කෝප් කමිටුවේ නිර්දේශවලට අනුකූලව, සමාලෝචනය කරනු ලබන මූල්‍ය ප්‍රකාශන වැඩි කිරීමේ උත්සාහයක් ලෙස ලැබුණු මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් වසර පුරා බාහිර සමාලෝචකයින්ගේ සේවය ලබා ගැනීම අඛණ්ඩව සිදු කරන ලදී. උග්‍ර කාර්ය මණ්ඩල හිඟයක් පැවතියදී, බාහිර සමාලෝචකයින් 15 දෙනෙකු බඳවා ගනිමින් වසරේ අවසාන මාසය තුළ බාහිර සමාලෝචකයින් සංඛ්‍යාව වැඩි කරන ලදී. ඒ අනුව, 2023 වසරේ සමාලෝචකයින් දොළොස් දෙනා (12) සමඟ සැසඳීමේ දී, වසර අවසානයේ ශ්‍රී..ල.ගි.වි.ප්‍ර.ස.ම. සතුව බාහිර සමාලෝචකයින් විසිපස් දෙනෙකු (25) සිටියහ.

බාහිර සමාලෝචකයින් විසින් පවත්වනු ලබන සමාලෝචනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින්, සමාලෝචන

# ක්‍රියාකාරකම් වාර්තාව - 2024

ක්‍රියාවලිය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සඳහා වැඩමුළුවක් පවත්වන ලද අතර, ඒ සඳහා නව බාහිර සමාලෝචක මණ්ඩලයේ සාමාජිකයින් සහභාගී විය. ඒ හා සමානව, බාහිර සමාලෝචකයින් විසින් සිදු කරන ලද සමාලෝචනවල ගුණාත්මකභාවය පිළිබඳ ඇගයීමක් වරින් වර පවත්වනු ලැබේ. සමාලෝචකයන්ගේ ඇගයීමේ ප්‍රතිඵල මත පදනම්ව, සමාලෝචකයන්ගේ සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යෑම හෝ අත්හිටුවීම සිදු කරනු ලැබේ. මෙයින් සමාලෝචකයින්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා ක්ෂේත්‍ර හඳුනා ගැනීමට හැකි වන අතර, බාහිර සමාලෝචකයින් විසින් පවත්වනු ලබන සමාලෝචනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට ද එමඟින් පහසුකම් සැලසේ.

වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද සමාලෝචනවලින්, බාහිර සමාලෝචකයින් විසින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 43ක මූලික සමාලෝචන සිදු කරන ලද අතර, ඔවුන්ගේ සේවාවන් ලබා ගැනීම සඳහා රු. මිලියන 0.58 ක් වැය කරන ලදී.

බාහිර සමාලෝචකයන්ගේ සොයාග ැනීම් මත පදනම්ව, ඉහත මූල්‍ය ප්‍රකාශන කට්ටල 43 හි සමාලෝචන සම්පූර්ණ කිරීමේදී, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සොයාග ැනීම් විශ්ලේෂණයට, අතිරේක තොරතුරු ලබා ගැනීමට, නිරීක්ෂණ ලිපි නිකුත් කිරීමට සහ ව්‍යවස්ථාව යටතේ අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට සිදු විය. මීට අමතරව, වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචන අතරින්, මූල්‍ය ප්‍රකාශන කට්ටල 345 ක මූලික සමාලෝචනය ද මණ්ඩලයේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලදී.

### 8. ආයතනික පාලනය

ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. යේ ව්‍යවස්ථාවේ නියමයට අනුව, සාමාජික මණ්ඩලයක් විසින් පාලනය කරනු ලැබේ. ඒ අනුව, මණ්ඩලය නිල බලයෙන් පත්වන සාමාජිකයින් 3 දෙනෙකුගෙන් සහ හඳුනා ගත් ආයතනවලින් ලැබුණු නාමයෝජනා අතරින් මුදල් අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයින් 10 දෙනෙකුගෙන් සමන්විත වේ. සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් යන නිලධාරීන් නිල බලයෙන් පත්වන සාමාජිකයින් වේ. පත් කළ සාමාජිකයන් ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (සාමාජිකයින් 3), එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ශ්‍රී ලංකා අංශය, ශ්‍රී ලංකා නීතීඥ සංගමය, ලංකා වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය, ශ්‍රී ලංකා බැංකු සංගමය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යන ආයතනවල නියෝජිතයන් වේ. සාමාජිකයෙකුගේ ධුර කාලය වසර හතරකි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිනිය වූ කේ.එම්.ඒ.එන්. දවුලාගල මහත්මිය සභාපතිනිය වශයෙන් වර්ෂය පුරා කටයුතු කළාය.

ව්‍යවස්ථාපිතව පත් කරන ලද මණ්ඩලයේ සාමාජිකයින් වන එම්.පී. අබේසේකර මහත්මිය, ඒ.යූ. දෑලගේ මහත්මිය සහ ආර්. රාජපක්ෂ මහත්මිය සහ පී.එම්. අමරසිරි, ඩබ්.පී.ආර්.පී.එච්. ෆොන්සේකා, පී.ආර්.ඒ.අයි. ගුණරත්න, එන්. ගුණවර්ධන, කේ.කේ.එස්. ගුණවර්ධන, මහාචාර්ය ඒ. ජයමහ, කේ.ඒ.එච්. කුරුප්පු සහ ටී.එච්. සුබසිංහ යන මහත්වරු වර්ෂය තුළ ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි අධ්‍යක්ෂවරුන් හෝ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ලෙස සේවය කළහ. එසේම, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් වූ එස්.එම්.එස්.එස්. බණ්ඩාර, ඩබ්ලිව්.ඩබ්ලිව්.ජේ.සී. පෙරේරා සහ ටී.එච්. සුබසිංහ යන මහත්වරු ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විගණනය කරනු ලබන වෘත්තීය ගණකාධිකාරී සමාගම්වල හවුල්කරුවන් ලෙස කටයුතු කළ අතර, ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායවල අධ්‍යක්ෂවරුන් වශයෙන් හෝ විගණන කමිටුවල උපදේශකවරුන් වශයෙන් කටයුතු කළහ.

එම කාලසීමාව තුළ අධ්‍යක්ෂ මණ්ඩලයට ආරාධිතයෙකු වූ ටි.ජේ.එස්. රාජාකාරිය මහතා, ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විගණනය කරන වෘත්තීය ගණකාධිකාරීවරුන්ගේ සමාගමක හවුල්කරුවෙකු ලෙස කටයුතු කරන ලද අතර මණ්ඩලයේ ආරාධිතයෙකු ලෙස කටයුතු කරන එච්.එම්.ඒ. ජයසිංහ මහතා ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායවල අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කලහ. තවද, එම කාලය තුළ, කේ.වී.සී. දිල්රුක්ෂි මහත්මිය සහ ඇයගෙන් පසුව පත් වූ එම්.ටී.අයි.වී. අමරසේකර මහත්මිය, මණ්ඩලයේ නිරීක්ෂක ලෙස කටයුතු කළාය.

මණ්ඩලයේ ස්වාධීනත්වය සහතික කිරීම සඳහා, මණ්ඩලයේ සියලුම සාමාජිකයින්, ආරාධිතයින් මෙන්ම නිරීක්ෂකයින් ද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය සහ විගණකවරුන් සමඟ ඔවුන්ගේ සම්බන්ධිත පාර්ශ්ව සබඳතා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලයට කාර්තුමය පදනමින් හෙළිදරව් කරයි. ඒ අනුව, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායක හෝ එහි විගණකවරයාට සම්බන්ධ කරුණුවලට අදාළ සියලුම ලේඛන අදාළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය හෝ එහි විගණකවරයා සමඟ සම්බන්ධයක් ඇති සාමාජිකයින් වෙත යවනු ලබන ලේඛනවලින් ඉවත් කර ඇති අතර එවැනි සාමාජිකයෝ එම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය හෝ විගණකවරුන් සම්බන්ධ විෂයයන් පිළිබඳ සාකච්ඡා සඳහා සහභාගී නොවෙති.

මණ්ඩලය විසින් නියමිත පරිදි රැස්වීම් කැඳවූ අතර, වර්ෂය තුළ මණ්ඩලය මගින් රැස්වීම් 8ක් පවත්වන ලදී.

වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාකච්ඡා මගින් සමස්ත මෙහෙයුම් දර්ශක අනුව කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය සහ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය සහ විගණකවරුන් සම්බන්ධ සැලකිය යුතු තාක්ෂණික ගැටළු විසඳීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ආවරණය කරන ලදී. නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් සහ විගණකවරුන් විසින් ප්‍රමිතීන්ට අනුකූල නොවීම, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, වාර්ෂික අයවැය සහ මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්ම අනුමත කිරීම සම්බන්ධ ගැටළු කෙරෙහිද මණ්ඩලය සිය අවධානය යොමු කරන ලදී. තවද, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් එහි ඵලදායී ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීමේ කටයුතුවල ප්‍රගතිය සමාලෝචනය කිරීමේ කටයුතුවල සහ දැනට සංශෝධනය කරමින් පවතින සහ සංශෝධනයේ අවසන් අදියරේ පවතින ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනතට කරන ලද සංශෝධන සමාලෝචනය කිරීමේ කාර්යයේ ද නිරත විය.

තවද, තාක්ෂණික කාර්යයන් මෙන්ම ප්‍රධාන පරිපාලන කාර්යයන් ඉටු කිරීම සඳහා සුදුසු වෘත්තීය කාර්ය මණ්ඩලයක් ආකර්ෂණය කර ගැනීමට නොහැකි වීම සම්බන්ධයෙන් අඛණ්ඩව පවතින ගැටළුව විසඳීමට සහ සුදුසු කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම සඳහා පිරිනමන ලද වැටුප් පරිමාණවල අඩු ආකර්ෂණීය බව පිළිබඳ ගැටළු විසඳීමට මණ්ඩලය සාමූහික උත්සාහයක් ගන්නා ලදී. මෙම ක්‍රියාවලියේදී, මණ්ඩලය මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ සන්නිවේදන කටයුතු ගණනාවක් පැවැත්වූ අතර අධීක්ෂණ කාර්යයන් නිපුණතාවයක් සහිතව ඉටු කිරීම සඳහා කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ විකල්ප ක්‍රම සමාලෝචනය කරන ලදී.

මණ්ඩලයේ කාර්ය ප්‍රතිපත්තියට අනුව, තොරතුරු එක්රැස් කිරීම, මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය, විගණන පරීක්ෂා කිරීම, විමර්ශන පැවැත්වීම සහ මහජනතාව දැනුවත් කිරීමේ කටයුතු සිදුකිරීම වැනි ප්‍රමිතීන්ට අනුකූලතාව අධීක්ෂණය කිරීමට අදාළ නිරන්තර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්

# ක්‍රියාකාරකම් වාර්තාව - 2024

සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් දෙදෙනාගේ අධීක්ෂණය සහ මඟ පෙන්වීම යටතේ දැනට සේවයේ නිරතව සිටින කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලදී.

## 9. මූල්‍ය කාර්යසාධනය

වසර තුළ, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලයේ ප්‍රධාන මූල්‍යකරණ මූලාශ්‍රය රජය විසින් සපයන ලද අරමුදල් විය. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. යේ ක්‍රියාකාරකම් රජයේ අරමුදල් හරහා මූල්‍යකරණය කරනු ලැබුවද, මණ්ඩලයේ වියදම් මූල්‍යකරණය කිරීමේ විකල්පයක් ලෙස, වත්මන් පනත යටතේ ගරු මුදල් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පරිදි, කොටස් හිමියන්ගේ හිමිකම් හෝ බදු පසු ලාභය යන දෙකෙන් වැඩි අගයේ ප්‍රතිශතයක් ලෙස ගණනය කළ සෙස් බද්දක් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙතින් අය කළ හැකි වේ. කෙසේ වුවද, මෙම විකල්පය මුදල් අමාත්‍යාංශය විසින් අනුමත නොකළ අතර 2008 ජනවාරි 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන කාලසීමා සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ සෙස් බද්ද ගරු අමාත්‍යවරයා විසින් 2008 ඔක්තෝබර් 7 දින ඉවත් කර ගන්නා ලදී.

මුදල් අමාත්‍යාංශය සමඟ ඇති කර ගත් පූර්ව එකඟතාවක් පරිදි, ප්‍රමිති සැකසීමේ ක්‍රියාකාරකම් සඳහා මූල්‍යකරණය කිරීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් වාර්ෂික ප්‍රදානයක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට ලබා දෙන ලදී. ඒ අනුව වසර තුළ දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට රු. මිලියන 2ක වාර්ෂික ප්‍රදානයන් දෙන ලදී. පසුගිය වසරේ මෙන්ම, අයවැය සීමාවන් හේතුවෙන්, මෙම වසරේ ප්‍රදානය ද පෙර වසරවල ලබා දුන් වාර්ෂික ප්‍රදානයන්ගෙන් 50% කින් අඩු කරන ලදී.

2021 වර්ෂයේ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද වැටුප් ව්‍යුහය මත පදනම්ව 2023 අවසාන කාර්තුවේදී සම්මත කරන ලද වැටුප් වැඩිවීම් ක්‍රියාත්මක වූ පළමු සම්පූර්ණ වර්ෂය වන්නේ 2024 වන බැවින්, කාර්ය මණ්ඩල පිරිවැය ඉහළ යාම හේතුවෙන්, වසර තුළ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් මෙහෙයුම් කටයුතු සඳහා වැය කළ රු.104,668,457/-, 2023 වර්ෂය සඳහා මෙහෙයුම් වියදම වූ රු. 71,544,975/- ට වඩා වැඩි විය. මෙම වැඩිවීමට තව හේතුවක් වූයේ අමාත්‍යාංශයේ අවශ්‍ය අනුමැතිය සහිතව, වෘත්තීය කාර්ය මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුට දිගු කලක් මුළුල්ලේ ගෙවිය යුතුව පැවති හිඟ වැටුප් ගෙවීම හේතුවෙන් කාර්ය මණ්ඩල පිරිවැය වැඩිවීමය.

2024 වර්ෂයේ සිට කුලී වියදම් සඳහා 18% ක අගය එකතු කළ බදු අදාළ වීම හේතුවෙන් කුලී වියදම් වැඩිවීම, කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු ගෙවිය යුතු වන ඉහළ සහාය සහ නඩත්තු වියදම්, බාහිර සමාලෝචකයින් සඳහා වෘත්තීය ගාස්තු වැඩිවීම, වාහන සහ උපකරණ පැරණි වීම හේතුවෙන් වාහන සහ උපකරණ නඩත්තු වියදම් වැඩිවීම සහ පිරිවැය වැඩිවීම හේතුවෙන් පරිගණක නඩත්තු වියදම් වැඩිවීම මෙහෙයුම් වියදම්වල ඉහත වැඩිවීමට හේතු වී තිබේ.

තවද, සම්පූර්ණ කරන ලද මෘදුකාංග වැඩි දියුණු කිරීම ක්‍රමක්ෂය කිරීම ආරම්භ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, වසර තුළ ක්ෂය කිරීමේ සහ ක්‍රමක්ෂය කිරීමේ වියදම්වල සැලකිය යුතු වැඩිවීමක් දක්නට ලැබුණි.

කෙසේ වෙතත් වර්තමාන වැටුප් පරිමාණයන් තාක්ෂණික වශයෙන් කුසලතා පූර්ණ වරළත් ගණකාධිකාරීන් බඳවා ගැනීම පිණිස ආකර්ෂණීය නොවීම නිසා, පුරප්පාඩු පිරවීමේ උත්සාහයන් ව්‍යර්ත වීම හේතු කරගෙන 2024 වසරේ අඩු පුරප්පාඩු සංඛ්‍යාවක් ප්‍රචාරය කිරීම නිසා පුවත්පත් දැන්වීම් සහ ප්‍රචාරණ වියදම් අඩු වූ බැවින් ඇතැම් මෙහෙයුම් වියදම් වසර තුළ අඩු වූ අතර කාර්ය මණ්ඩල පිරිවැයට ඇතුළත් කාර්ය මණ්ඩල දිරි ගැන්වීම්, සංශෝධිත වැටුප් සම්මත කිරීමෙන් පසු වෘත්තීය කාර්ය මණ්ඩලය සඳහා ක්‍රියාත්මක නොවන තත්ත්වයට පත් වූ බැවින්, මෙහෙයුම් වියදම් සැලකිය යුතු ලෙස අඩු විය.

මෙහෙයුම් වියදම්වලින්, 2023 වර්ෂයේ කාර්ය මණ්ඩල පිරිවැය වූ රු. 35,050,482/- හා සැසඳීමේ දී, වර්ෂය තුළ කාර්ය මණ්ඩල පිරිවැය රු. 53,418,460/- ක් විය. ඉහත පැහැදිලි කළ පරිදි, 2023 වර්ෂයේ දී සිදු කරන ලද වැටුප් වැඩිවීම්වල සම්පූර්ණ බලපෑම හේතුවෙන් පෙර වර්ෂයට සාපේක්ෂව 52% ක වැඩිවීමක් පෙන්නුම් කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. හි කාර්ය මණ්ඩල පිරිවැය 2024 වසරේ මෙහෙයුම් වියදම්වලින් 51%ක් නියෝජනය කළ අතර එය ඉකුත් වර්ෂයට වඩා 3%ක වැඩි වීමකි.

## 10. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.යේ කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) සංවර්ධනය කිරීම

2023 වසර තුළ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් භෞතිකව පවත්වාගෙන යනු ලබන ලේඛන ප්‍රමාණය අවම කිරීම, තොරතුරු ගබඩාව වැඩිදියුණු කිරීම සහ අභ්‍යන්තර කාර්ය මණ්ඩලය අතර මෙන්ම ප්‍රධාන කොටස්කරුවන්, එනම් ආයතන සහ ඒවායේ විගණකවරුන් අතර කාර්යක්ෂම ලෙස තොරතුරු හුවමාරු කිරීම සඳහා එහි මෙහෙයුම් කටයුතු සඳහා මධ්‍යගත කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම සම්පූර්ණ කරන ලදී. මෙම ක්‍රියාවලිය මගින් වෘත්තීය කාර්ය මණ්ඩලය සාමාන්‍ය දත්ත සමුදා කළමනාකරණ ක්‍රියාකාරකම්වලින් නිදහස් කර ගැනීමටත්, නියාමන යාන්ත්‍රණය කෙරෙහි වෘත්තීය නිපුණතා උපයෝගී කර ගැනීම උපරිම කිරීම සඳහා ඔවුන්ට හැකියාව ලබා දීමටත් අපේක්ෂා කෙරේ.

2024 වර්ෂය මෙහෙයුම්වල පළමු වසර වූ බැවින්, පද්ධතිය වැඩිදියුණු කිරීම සම්බන්ධ ගැටළු ගණනාවක් පරිශීලකයින් විසින් සටහන් කර ඇති අතර සංවර්ධකයා විසින් වෙනස්කම් ඉල්ලීම් (CR) හරහා ඒවා නිවැරදි කර ඇත. කැට්ජහ (Legacy System) තොරතුරු තවදුරටත් සංක්‍රමණය කිරීම ද සංවර්ධකයා විසින් සිදු කරන ලදී. ඒ අනුව, එවැනි සේවාවන් සඳහා සංවර්ධකයාට රු. 2,579,900/- ක මුදලක් ගෙවන ලදී. තවද, එම පද්ධතියේ සහාය සහ නඩත්තු කිරීමේ පළමු වසරේ රු. 1,632,333/- ක මුදලක් වැය කරන ලදී.

## 11. පනත සඳහා සිදු කිරීමට නියමිත සංශෝධන

වසර තුළ, 1995 අංක 15 දරන පනත අවලංගු කරමින් නව පනතක් ලෙස සම්මත කිරීමට නියමිත පනත් කෙටුම්පත සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියේ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. ක්‍රියාකාරීව නිරත විය. දැනට අදාළ වන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිතීන් සමීක්ෂණය කිරීමට අමතරව, නිශ්චිත ආයතන සහ නිශ්චිත ආයතනවල විගණකවරුන් විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා තිරසාරත්ව (Sustainability) ප්‍රමිතීන් අධීක්ෂණය කිරීම සඳහා වන නියාමන බලතල ද ඇතුළත් කර කෙටුම්පතක් වශයෙන් සකසා දැනට මුදල් අමාත්‍යාංශයේ පවතින නව පනත මඟින් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලයේ බලතල පුළුල් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

# 2024 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම්

## 1. දළ විශ්ලේෂණය

විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් (SBEs) විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය (ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම.) අඛණ්ඩව අධීක්ෂණය කරයි. එකී කාර්යය ඉටු කිරීමේදී, රටේ මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය ඉහළ නැංවීම පිණිස අදාළ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීමට එම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් පෙළඹවීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් එම මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරයි.

## 2. ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය (ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.) විසින් මූල්‍ය ප්‍රකාශන අධීක්ෂණය කිරීම

වසර තුළ, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. ය විසින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් (SBEs) 381ක් නියෝජනය කරන මූල්‍ය ප්‍රකාශන කට්ටල 388ක සමාලෝචන සම්පූර්ණ කරන ලදී. වසර තුළ මූල්‍ය ප්‍රකාශන ආවරණය සුදුසු බව සහතික කිරීම සඳහා, සමාලෝචනය සඳහා මූල්‍ය ප්‍රකාශන තෝරා ගැනීම සඳහා ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. විසින් අවදානම් පාදක ප්‍රවේශයක් අනුගමනය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, වසර තුළ නිම කරන ලද සමාලෝචනවලට කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කර ඇති ආයතන 120ක් ඇතුළත් වූ අතර, සමස්තයක් වශයෙන්, සමාලෝචනය කරන ලද ආයතනවලින් 60%ක් නියාමනය කරන ලද ආයතන නියෝජනය කරන ලද අතර ඉතිරිය ආර්ථිකමය වැදගත්කමින් වැඩි පෞද්ගලික ආයතන නියෝජනය විය. එමගින් පෞද්ගලික ආයතනවල සමාලෝචන වසර 3-5 චක්‍රය තුළ ආවරණය කිරීමට පහසුකම් සැලසේ.

ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. විසින් අවදානම් පාදක නිර්ණායක මත පදනම්ව සමාලෝචනය සඳහා මූල්‍ය ප්‍රකාශන තෝරා ගන්නා ලදී.

ඒ අනුව, සෑම වසර 3කට වරක් ඉහළ අවදානම් සහිත පෞද්ගලික ආයතන ආවරණය කිරීම සඳහා වර්ෂය තුළ අවධානය යොමු කරන ලදී. එබැවින්, සමාලෝචනය කරන ලද මුළු පෞද්ගලික ආයතනවලින් 98% ක් පසුගිය වසර තුනක සමාලෝචන චක්‍රය තුළ සමාලෝචනය නොකළ විශාල පෞද්ගලික ආයතන විය.

සමාලෝචන කාර්යය ඉටු කිරීමේදී, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. පහත (3) වගන්තියේ විස්තර කර ඇති සමාලෝචන ප්‍රවේශයන් අනුගමනය කර ඇති අතර එමගින් පනතේ නිශ්චිතව ව්‍යාපාරික ව්‍යවසාය ලෙස දක්වා ඇති සියලුම කාණ්ඩ නියෝජනය කෙරෙන පසුබිමක් ඇතිවීමට හේතු වේ.

## 3. අධීක්ෂණය සඳහා මූල්‍ය ප්‍රකාශන තෝරා ගැනීම

මෙම වසරේදීත්, ගෝලීය මනා භාවිතයන්ට අනුකූලව සමාලෝචන ආවරණය ඵලදායී ආකාරයකින් වැඩිදියුණු කිරීමේ පියවරක් ලෙස  සඳහා විදේශීය උපදේශක විසින් නිර්දේශ කරන ලද පෙර වසර තුළ අනුගමනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචන ක්‍රමවේදය ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. විසින් අඛණ්ඩව අනුගමනය කරන ලදී. ඒ අනුව, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. විසින් සමාලෝචනය සඳහා මූල්‍ය ප්‍රකාශන තෝරා ගැනීම සඳහා මිශ්‍ර ආකෘතියක් අනුගමනය කරන ලද අතර, අවදානම් පාදක ප්‍රවේශයක් අහඹු සහ භ්‍රමණ ප්‍රවේශයන් සමඟ ඒකාබද්ධ කරන ලදී. වර්ෂය තුළ, අවදානම් පාදක ප්‍රවේශය යටතේ, කර්මාන්ත කේන්ද්‍රීය කරගත් අවදානම් නිර්ණායක මත පදනම්ව පූර්වයෙන් තීරණය කරන ලද තේමා මත සමාලෝචන පවත්වන ලදී. තවද, එම කර්මාන්ත කේන්ද්‍රීය අවදානම් නිර්ණායකවලට යටත් නොවන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් තෝරාගනු ලබන්නේ එම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය සම්බන්ධයෙන් චක්‍රීය ආවරණයක් සිදු කරන ආකාරයට එම තෝරා ගැනීම අහඹු පදනමක් මත සිදු කරමිනි.

ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන සමාලෝචන කාර්යය සඳහා අනුගමනය කරන ප්‍රවේශයන් පහත පරිදි සිදුවේ;

- මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සවිස්තරාත්මක සමාලෝචනය
- කර්මාන්තය කේන්ද්‍ර කරගත් අවදානම් නිර්ණායක මත පදනම් වූ තේමා කේන්ද්‍රීය සමාලෝචනය

## 4. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLAS/LKAS) අනුකූල වීම නිරීක්ෂණය කිරීම පිළිබඳ ප්‍රතිඵල

2024 වර්ෂය තුළ සමාලෝචන සොයාගැනීම් මගින් හෙළි වූයේ සමාලෝචනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් 51% ක් අනුකූල බවත්, මූල්‍ය ප්‍රකාශනවලින් 49% ක් ප්‍රමිතීන්ට අනුකූල වුවද, අනුකූලතාවන් වැඩිදියුණු කිරීම පිණිස නිරීක්ෂණ, උපකාරක ලිපි ලෙස සන්නිවේදනය කරන ලද බවත්ය. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන කට්ටල 190 ක් සම්බන්ධයෙන් වසර තුළ කරන ලද නිරීක්ෂණ උපකාරක ලිපි මගින් සන්නිවේදනය කර ඇත.

## 5. නීතිපතිවරයා වෙත යොමු කරන ලද කරුණු

### 5.1 එකඟතාවන්

2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඇඩම් කැපිටල් පීඑල්සී හි මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණනය කිරීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් ඇඩම් කැපිටල් පීඑල්සී හි විගණකවරුන්ට එරෙහිව මෙන්ම, ව්‍යවස්ථාවෙන් අවශ්‍ය වන පරිදි ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන විගණනය කර ඇති බව සහතික කිරීමට අවශ්‍ය සියලු පියවර ගැනීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් ඇඩම් කැපිටල් පීඑල්සීට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ ක්‍රියාවලිය ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. විසින් අඛණ්ඩව සිදු කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. යේ නීති උපදේශකයින් ලෙස නීතිපතිවරයා විසින් පැමිණිල්ල අවසන් කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටියි.

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අසම්පූර්ණ සහ සාවද්‍ය තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීම සහ විගණකවරුන් විගණන මතය

# 2024 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම්

ව්‍යවනය කිරීමත් සමඟ නිසි ගිණුම් පොත් පවත්වාගෙන යෑමට අපොහොසත් වීම සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ උපදෙස් මත පදනම්ව, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සීට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ කටයුතු කරමින් සිටී. දැනට ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. විසින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය සාක්ෂි රැස් කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී.

## 6. ප්‍රමිතීන්ට අනුකූලතා දැක්වීම් වැඩි දියුණු කිරීම සඳහා නිරීක්ෂණ ලෙස සන්නිවේදනය කළ සමාලෝචනවල සොයාගැනීම්

SLFRSs/LKASs වලින් අනාවරණය කරගත් අපගමනය ප්‍රමාණාත්මක නොවූ නමුත්, ව්‍යවස්ථාපිත විධිවිධාන භාවිත කරමින් ක්‍රියාපටිපාටි භාවිත කිරීම අවශ්‍ය නොවූ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙත එම හඳුනාගැනීම් නිරීක්ෂණ ලෙස සහාය ලිපි මගින් දැනුම් දෙන ලදී. එමඟින්, එම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්වලටම අනාගතයේ දී ඒවායේ අනුකූලතාව වැඩි දියුණු කිරීමට කටයුතු කළ හැකි වේ.

මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවන කරුණු සම්බන්ධයෙන් මූලික සොයාගැනීම් පහත දක්වා ඇත

- ආයතනය නිරාවරණය වන මූල්‍ය උපකරණවලින් පැන නගින අවදානම්වල ස්වභාවය සහ ප්‍රමාණය, සහ අපේක්ෂිත ණය අලාභවලින් පැන නගින ප්‍රමාණ පිළිබඳ ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු, වාර්තාකරණ කාල සීමාව අවසානයේ ප්‍රමාණවත් ලෙස හෙළිදරව් නොකිරීම (යොමුව: SLFRS 7 හි ඡේද 31 සිට 42 දක්වා).
- මූල්‍ය වගකීම්වල වට්ටම් නොකළ මුදල් ප්‍රවාහයන් කල් පිරීමේ විශ්ලේෂණයේදී අනාවරණය කර නොමැති අතර කල් පිරීමේ විශ්ලේෂණයේදී මූල්‍ය වගකීම්වල කල් පිරීමේ කාලය තුළ යෝග්‍ය වර්ගීකරණයක් සිදු නොකිරීම (යොමුව; SLFRS 7 හි ඡේද 39 (අ)).
- මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් සම්බන්ධයෙන් හානිකරණය පිළිබඳ වෛෂයික සාක්ෂි පවතින විට, ක්‍රමක්ෂය කළ පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම්වල අපේක්ෂිත ණය පාඩු සඳහා අලාභ දීමනාව හඳුනා ගෙන නොතිබීම (යොමුව: SLFRS 9 හි 5.5.1 ඡේදය).
- භාවිත කරන ලද තක්සේරු ශිල්පීය ක්‍රම, තක්සේරු ක්‍රම සඳහා යෙදවුම්, භාවිතා කරන ලද සැලකිය යුතු ලෙස නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් පිළිබඳ ප්‍රමාණාත්මක තොරතුරු, යෙදවුම් සඳහා සිදු කරන ලද ප්‍රමාණාත්මක ගැළපීම් සහ සාධාරණ වටිනාකමට මනිනු ලබන වත්කම් සහ වගකීම්වල එක් එක් පන්තිය සඳහා සාධාරණ වටිනාකම් ධුරාවලිය ප්‍රමාණවත් ලෙස අනාවරණය කර නොමැතිවීම. (යොමුව - ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 13 හි 93 වන ඡේදය)
- භාණ්ඩ හෝ සේවා සඳහා හුවමාරුව සඳහා ආයතනය හිමිකම් ලැබීමට අපේක්ෂා නොකරන ප්‍රතිශ්ඨාවක් පිළිබිඹු කරන පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා පාරිභෝගිකයින්ට මාරු කිරීම නිරූපණය කරමින් ආදායම හඳුනා ගැනීම (යොමුව; ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 15 හි ඡේදය 2).
- සාමාන්‍ය පරිදි කාර්යසාධන බැඳීම් ඉටු වූ විට, වැදගත් ගෙවීම් නියමයන්, පොරොන්දු වූ භාණ්ඩ/සේවාවල ස්වභාවය, ආපසු එවීමේ/ආපසු ගෙවීමේ වගකීම් සහ වගකීම් වර්ග යනාදී විස්තර වැනි පාරිභෝගිකයන් සමඟ ඇති ගිවිසුම්වලට අදාළ කාර්යසාධන බැඳීම් පිළිබඳ තොරතුරු ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කර නොතිබුණි (යොමුව: ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 15 හි 119 වන ඡේදය).
- මූල්‍යකරණ ක්‍රියාකාරකම් තුළ කල්බදු වගකීමේ පොලී කොටසට අදාළ මුදල් ගෙවීම් වර්ගීකරණය කිරීම (යොමුව; ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 16 හි ඡේදය 50).
- ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවල විශ්වාසදායක සහ සැසඳිය හැකි තොරතුරු හෙළි නොකිරීම. (යොමුව; ශ්‍රී.ලං.ගි.ප්‍ර. 1 හි ඡේද 117).
- මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම සහ මිනුම් පදනම්වලින් සමන්විත වන විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ/හෝ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා අදාළ වන අනෙකුත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදු කර නොමැත (යොමුව: ශ්‍රී.ලං.ගි.ප්‍ර. 1 හි 112 සහ 117 වන ඡේද).
- බදු වියදම් සහ ගිණුම්කරණ ලාභය අතර සම්බන්ධතාව ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කිරීම සහ බදු පාඩු හේතුවෙන් පැන නගින විලම්බිත බදු වත්කම් හඳුනා ගැනීමට සහාය වන සාක්ෂි ඉදිරිපත් කර නොමැත. (යොමුව: ශ්‍රී.ලං.ගි.ප්‍ර. 12 හි 81 සහ 82 වන ඡේදය)
- අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම වත්කමක ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය නොකිරීම (යොමුව; ශ්‍රී.ලං.ගි.ප්‍ර. 16 හි ඡේදය 51).
- සම්බන්ධිත පාර්ශව ස්වභාවය මෙන්ම, සම්බන්ධිත පාර්ශව සමඟ සිදු කළ ගනුදෙනු පිළිබඳ තොරතුරු ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කර නොතිබිම (යොමුව; ශ්‍රී.ලං.ගි.ප්‍ර. 24 හි ඡේදය 18).
- එක් එක් මුදල් උත්පාදන ඒකකය (Cash Generating Unit) හෝ ඒකක සමූහයකට වෙන් කරන ලද කීර්තිනාමයේ හෝ අවිනිශ්චිත ප්‍රයෝජනවත් ආයු කාල සහිත අස්පෘශ්‍ය වත්කම්වල ධාරණ අගය, ආයතනයේ මුළු කීර්තිනාමයේ හෝ අවිනිශ්චිත ප්‍රයෝජනවත් ආයුකාල සහිත අස්පෘශ්‍ය වත්කම්වල ධාරණ අගය හා සැසඳීමේ දී එය ප්‍රමාණවත් වන අවස්ථාවල එක් එක් මුදල් උත්පාදන ඒකක සඳහා හෙළිදරව් ප්‍රමාණාත්මකව නොකිරීම. (යොමුව: ශ්‍රී ලං.ගි.ප්‍ර.36 හි ඡේදය 134)
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ වෙත ළඟා වීමේදී ලාභයට හෝ අලාභයට ගැළපීම්වල අඩුපාඩු පැවතීම (යොමුව; ශ්‍රී.ලං.ගි.ප්‍ර. 7 හි ඡේදය 20).

## 2024 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම්

- ප්‍රත්‍යාගණනය කරන ලද දේපළ, පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබීම (යොමුව; ශ්‍රී.ලං.ගි.ප්‍ර. 16 හි ඡේදය 77).

# 2024 වසර තුළ නීති උපදෙස් සඳහා යොමු කිරීම්

### ඇඩම් කැපිටල් පොදු සමාගම

සමාගම නිසි ගිණුම් පොත් සහ අදාළ වාර්තා පවත්වා ගැනීමට අපොහොසත් වූ අවස්ථාවක විගණකවරයා විසින් තත්ත්වාගණනය නොකළ විගණන මතයක් නිකුත් කර ඇති බැවින්, 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නැවත විගණනය කරන ලෙස ඇඩම් කැපිටල් පොදු සමාගම වෙත මණ්ඩලය විසින් නියෝග යක් නිකුත් කළ ද, නැවත විගණනය කිරීම සඳහා වන අමතර වියදම් දැරීමට සමාගම කැමත්තක් නොදැක්වීය.

2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඇඩම් කැපිටල් පොදු සමාග මේ මූල්‍ය ප්‍රකාශන විගණනයේදී එම විගණකවරයා විසින් විගණන ප්‍රමිතීන් අඛණ්ඩව උල්ලංඝනය කිරීම නිරීක්ෂණය කළ ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. නීතිපතිවරයාගේ උපදෙස් මත පදනම්ව, 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණනය කිරීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් විගණකවරයාට එරෙහිව සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන විගණනය කර ඇති බව සහතික කිරීමට අවශ්‍ය සියලු පියවර ගැනීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් ඇඩම් කැපිටල් පොදු සමාගමට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතු කර ඇත.

### බිම්පුත් ෆිනෑන්ස් පොදු සමාගම

කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත මූල්‍ය සේවා සපයන සමාගමක් වන බිම්පුත් ෆිනෑන්ස් පොදු සමාගම, 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල අසම්පූර්ණ සහ සාවද්‍ය තොරතුරු ප්‍රකාශයට පත් කර ඇති බව ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. විසින් නිරීක්ෂණය කර තිබුණි. ඒ අනුව, 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාග මේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය කාර්යසාධනය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ඉදිරිපත් කිරීමට සමාගම අපොහොසත් වී ඇති අතර එමඟින් 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනතේ 6 (1) වගන්තිය මගින් නියම කර ඇති පරිදි, 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා නිසි ගිණුම් පොත් පවත්වා ගැනීමට සමාගම අපොහොසත් වී ඇත.

එකී මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකවරයා විසින් ව්‍යවනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි.

නීතිපතිවරයාගේ උපදෙස් මත ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම., බිම්පුත් ෆිනෑන්ස් පොදු සමාගමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ ක්‍රියාවලියක නිරතව සිටින අතර නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය සාක්ෂි රැස් කිරීමේ ක්‍රියාවලියක ද නිරතව සිටියි.

# 2024 වර්ෂයේ විගණන පරීක්ෂණ වල සොයා ගැනීම්

**1. දළ විශ්ලේෂණය**

ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය (ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.) විසින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි (SBEs) විගණකවරුන් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි (SBEs) මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේ දී, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති (SLAuS) වලට අනුකූල වීම පිළිබඳව අධීක්ෂණය කිරීමේ කාර්යය අඛණ්ඩව සිදු කරන ලදී. දිවයින තුළ විගණනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ සමස්ත අරමුණින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි (SBEs) විගණන පරීක්ෂණ සිදු කරනු ලබයි. එසේ කිරීමේදී, අවදානම් මත පදනම් වූ ප්‍රවේශයක් මගින් මෙන්ම අහඹු තේරීම් ප්‍රවේශයක් මගින් පරීක්ෂා කිරීම සඳහා විගණන තෝරා ගනු ලැබේ.

ඒ අනුව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් වසර තුළදී පරීක්ෂා කිරීම සඳහා විගණන තෝරා ගැනීමේ දී අවදානම් මත පදනම් වූ ප්‍රවේශය අහඹු නියැදි ප්‍රවේශයක් සමඟ ඒකාබද්ධ කළ මිශ්‍ර ආකෘතියක් මත පදනම්ව කටයුතු කරන ලදී.

බැංකු සහ මූල්‍ය සමාගම්වල ණය සහ අත්තිකාරම් හානිකරණ පිළිබඳ තනි සහ සාමූහික තක්සේරුවකට අදාළව ගිණුම්කරණ ඇස්තමේන්තු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් විගණන පරීක්ෂණ සිදු කරන ලදී. ඉහත සඳහන් විගණන පරීක්ෂණ ක්ෂේත්‍රවලට අමතරව, මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේදී විගණකවරුන් විසින් භාවිතා කරන ලද වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබව තක්සේරු කිරීම සඳහා ඇතැම් විගණන පරීක්ෂණ සිදු කරන ලදී.

**2. අඛණ්ඩ විගණන පරීක්ෂණ**

ඉකුත් වර්ෂය තුළදී පරීක්ෂා කරන ලද සමාගම් 6ක් විසින් සිදු කරන ලද විගණන 16 සමඟ සැසඳීමේදී, වසර තුළදී, විගණන ආයතන 6ක් විසින් සිදු කරන ලද විගණන 22 ක් පරීක්ෂාවට ලක් කරන ලදී. වර්ෂය තුළ පරීක්ෂා කරන ලද විගණනවලින් 15ක් ජාත්‍යන්තර ජාලවල සාමාජිකයන් වන සමාගම් 5ක් විසින් සිදු කරන ලදී.

පරීක්ෂණ සොයාගැනීම් අතරින්, විගණන 19ක් පරීක්ෂණවලදී අවධානය යොමු කරන ලද ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති (SLAuSs) සමඟ අනුකූල විය. ඉතිරි පරීක්ෂණ 3 හි සොයාගැනීම් සම්බන්ධයෙන් ව්‍යවස්ථාව යටතේ වැඩිදුර ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය නොවන අතර එම සොයාගැනීම් නිරීක්ෂණ ලිපි මගින් අදාළ විගණකවරුන්ට දැනුම් දෙන ලදී.

**3. බලාත්මක කිරීම**

**3.1. බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ දළ විශ්ලේෂණය**

විගණන පරීක්ෂා කිරීම්වලදී සිදු කරන ලද නිරීක්ෂණවල ප්‍රබලතාව මත පදනම්ව, ශ්‍රී ලංකාවේ විගණනයේ ගුණාත්මක පරිසරය වැඩිදියුණු කිරීමේ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. හි පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා විගණකවරුන් තමා විසින්ම වැඩිදියුණු කර ගැනීම දිරිගැන්වීම පිණිස ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරයි. නිත්‍ය විගණන පරීක්ෂණවලදී ව්‍යවස්ථාව යටතේ වැඩිදුර ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය නොවන, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති (SLAuSs) සමඟ අනුකූල නොවීම් නිරීක්ෂණය වූ අවස්ථාවල දී, එවැනි අඩුපාඩු "නිරීක්ෂණ ලිපි" ලෙස හඳුන්වන සහාය ලිපියක් මගින් විගණන ආයතන වෙත දැනුම් දෙනු ලැබේ. විගණනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා වැඩිදියුණු කිරීම් සිදු කිරීම අවශ්‍ය වූ අවස්ථාවල දී, එවැනි වැඩිදියුණු කිරීම් "වැඩිදියුණු කිරීම සඳහා යෝජනා" ලෙස සන්නිවේදනය කෙරේ.

එයට අමතරව, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායක (SBEs) විගණනයක් පැවැත්වීමේදී, මූලික ආචාරධර්ම මූලධර්ම ක්‍රියාත්මක කිරීමට විගණකවරයා අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය වූ අවස්ථාවල දී, අනාගතයේදී මූල්‍ය ප්‍රකාශන විගණන සිදු කරන විට, අදාළ විගණන ප්‍රමිතිවල අවශ්‍යතාවලට අනුකූලව අනලස්ව කටයුතු කළ යුතු බවට නියම කරමින් මණ්ඩලයේ අනුමැතිය සහිතව අදාළ විගණන ආයතනයට අනතුරු ඇඟවීමේ ලිපියක් (Letter of Warning) නිකුත් කරනු ලැබේ. තවද, අවශ්‍ය අවස්ථාවලදී, විගණනයේ ගුණාත්මකභාවයේ අඩුපාඩු පවතින විට, ගැටළුවල වැදගත්කම මත පදනම්ව, එවැනි කරුණු විගණකවරුන්ගේ බලපත්කරණ අධිකාරිය වන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය වෙත සහ අදාළ වන පරිදි විගණනය කරනු ලබන ආයතනය පාලනය කරන වෙනත් ඕනෑම නියාමකයෙකුට යොමු කරනු ලැබේ.

**3.2. වර්ෂය තුළ ගන්නා ලද බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග**

**3.2.1 සහාය ලිපිය**

වර්ෂය තුළ, විගණන කටයුතු 3ක් සම්බන්ධයෙන් සමාගම් 3කට "නිරීක්ෂණ ලිපි" ලෙස හඳුන්වන සහාය ලිපි නිකුත් කරන ලද අතර, එම අනුකූලතා නොමැතිකම හේතුවෙන් ව්‍යවස්ථාව යටතේ තවදුරටත් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය නොවන විගණන කටයුතු සිදු කිරීමේ දී, නිරීක්ෂණය වූ, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති සමඟ අනුකූල නොවීම් පිළිබඳව දැනුම් දෙන ලදී. සංසන්දනය කිරීමේදී, 2024 තුළ විගණකවරුන් 3 දෙනෙකු විසින් පවත්වන ලද විගණන 3කදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව නිරීක්ෂණ ලිපි නිකුත් කරන ලදී.

**4. වැදගත් සොයාගැනීම්**

වර්ෂය තුළ විගණකවරුන් වෙත සන්නිවේදනය කරන ලද වැදගත් සොයාගැනීම් පහත දැක්වේ.

**4.1. මූල්‍ය ප්‍රකාශන විගණනයක් සැලසුම් කිරීම**

විගණනය ඵලදායී ආකාරයකින් සිදු කිරීම සඳහා විගණකවරයා විසින් SLAuS 300 ට අනුකූලව සමස්ත විගණන උපාය මාර්ග යක් සහ විගණන සැලැස්මක් සකස් කිරීම අවශ්‍ය වේ. නමුත් විගණකවරයා සමස්ත විගණන උපාය මාර්ගයක් සහ යථෝක්ත විගණනය සඳහා විගණන සැලැස්මක් සකස් කර නොමැති බව නිරීක්ෂණය විය.

**4.2. අවදානම් තක්සේරු කිරීම**

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශවල අවදානම හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම සඳහා විගණකවරයා අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටි සිදු කළ යුතු අතර, ආයතනයේ අභ්‍යන්තර පාලන ඇතුළුව, එහි පරිසරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම තුළින් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශවල තක්සේරු කරන ලද අවදානම් සඳහා ප්‍රතිචාර සැලසුම් කිරීම සඳහා පදනමක් සැපයීමට විගණකවරයාට හැකි වේ.

එවැනි අවදානම් තක්සේරු ක්‍රියා පටිපාටි සිදු කිරීම සම්බන්ධයෙන් සන්නිවේදනය කරන ලද අඩුපාඩු වන්නේ;

- සවිස්තරාත්මක අවදානම් තක්සේරුවක් සිදු කර නොමැතිවීම.
- වංචා හේතුවෙන් ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනවල අවදානම හඳුනා ගැනීම සඳහා ප්‍රමාණවත් විගණන ක්‍රියා පටිපාටි සිදු නොකිරීම.

# 2024 වර්ෂයේ විගණන පරීක්ෂණ වල සොයා ගැනීම්

- ආයතනයේ ජර්නල් සටහන් වාර්තා කිරීමේ ක්‍රියාවලිය සහ ජර්නල් සටහන් සම්බන්ධ ක්‍රියාත්මක කර ඇති පාලනයන් පිළිබඳ අවබෝධයක් විගණක විසින් ලබා නොතිබුණි.

### 4.3. තක්සේරු කළ අවදානම් සඳහා විගණකගේ ප්‍රතිචාර

විගණකවරයා විසින් ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනවල තක්සේරු අවදානම විසඳීම සඳහා සුදුසු ප්‍රතිචාර සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

තක්සේරු කළ අවදානම් සම්බන්ධයෙන් විගණකවරයාගේ ප්‍රතිචාරවලට අදාළව සන්නිවේදනය කරන ලද අඩුපාඩු පහත පරිදි වේ.

- සමාගමේ තොරතුරු තාක්ෂණ (IT) පද්ධතියේ අභ්‍යන්තර පාලනයන් සහ යෙදුම් පාලනයන් පරීක්ෂා නොකිරීම
- විවිධ ආදායම් ප්‍රවාහයන් සඳහා ජනනය කරන ලද විවිධ ඉන්වොයිසි කෙරෙහි අවධානය යොමු කරමින් ආදායම පිළිබඳ සුදුසු කඩඉම් පරීක්ෂණයක් සිදු නොකිරීම.
- වසර අවසානයේ සම්මත කරන ලද ජර්නල් සටහන් කෙරෙහි අවධානය යොමු කරමින් විගණකවරයා ජර්නල් සටහන් ප්‍රමාණවත් ලෙස පරීක්ෂා නොකිරීම.
- ඒකක ප්‍රාග්ධන ශේෂයට අදාළව බාහිර තහවුරු කිරීමේ ක්‍රියා පටිපාටිය හරහා විගණන සාක්ෂි ලබා ගැනීමට සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර ඇති ඕනෑම වාර්තා නොවූ ගනුදෙනු හෝ ඒකක ප්‍රාග්ධන ශේෂයේ කිසියම් සාවද්‍ය ප්‍රකාශ හඳුනා ගැනීමට ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට සැලසුම් කර ඇති විගණන ක්‍රියා පටිපාටිය ක්‍රියාත්මක නොකිරීම.
- ලබාගත් විගණන සාක්ෂි වංචා හේතුවෙන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනවල අවදානම පිළිබඳ අවබෝධයක් ලබා දෙන්නේ ද යන්න ඉන්වොයිස් අංක නොමැති අවස්ථාවල අතිරේක හෝ වෙනස් විගණන ක්‍රියා පටිපාටි සිදු කිරීමේ අවශ්‍යතාවයක් තිබේද යන්න ඇගයීමට ලක් නොකිරීම.

### 4.4. විගණන සාක්ෂි

විගණකවරයාගේ මතය පදනම් කර ගැනීම සඳහා සාධාරණ නිගමනවලට එළඹීමට හැකි වන පරිදි ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට විගණකවරයාට හැකි වන පරිදි විගණකවරයා විසින් විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

විගණන සාක්ෂි රැස් කිරීමට අදාළව පහත සඳහන් අඩුපාඩු සන්නිවේදනය කරන ලදී.

- විගණකවරයා විසින් වෙළඳ ලැබිය යුතු දෑ, ස්වේච්ඡා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම පිරිවැය, තොගයේ ශුද්ධ උපලබ්ධිත වටිනාකම සහ බැංකු ශේෂයන්ට අදාළ විගණන ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීම මගින් ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂි ලබාගෙන නොතිබීම.
- සමාගම විසින් කාර්යසාධන බැඳීම් තෘප්තිමත් කිරීමේ කාලය හඳුනා ගැනීමෙන් ආදායම් හඳුනා ගැනීම සඳහා ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂි ලබාගෙන නොතිබීම.

### 4.5 නියැදිය තේරීම

නියැදිය තෝරාගෙන ඇති සංගහනය පිළිබඳව නිගමනවලට එළඹීමට විගණකවරයාට සාධාරණ පදනමක් සැපයීම සඳහා විගණකවරයා විසින් සංඛ්‍යාන සහ සංඛ්‍යාන නොවන නියැදි භාවිතා කරමින් සංගහනය නියෝජනය කරන නියැදියක් සැලසුම් කර තෝරා ගැනීම අවශ්‍ය වේ.

නියැදි තේරීමට අදාළව හඳුනාගත් අඩුපාඩු වන්නේ;

- ඒකක ප්‍රාග්ධන ශේෂය පිළිබඳ විස්තර පරීක්ෂා කිරීම සඳහා නියැදිය තෝරා ගැනීමට භාවිතා කරන පදනම පිළිබඳ විගණන වැඩ පත්‍රිකාවල සාක්ෂි නොමැති වීම.
- නියැදිය ලෙස එක් ජර්නල් සටහනක් තෝරා ගැනීමට භාවිත කළ පදනම සහ තෝරාගත් නියැදිය සංගහනය නියෝජනය කළේද යන්න පිළිබඳ සාක්ෂි නොතිබීම.

### 4.6. පාලනය කරන පාර්ශව සමඟ සන්නිවේදනය කිරීම (TCWG)

මූල්‍ය ප්‍රකාශන සහ විගණනයට අදාළ විගණකවරයාගේ වගකීම්, පාලනය කරන පාර්ශව සමඟ සන්නිවේදනය කිරීම, විගණනවල සැලසුම් කළ විෂය පථය සහ කාලය තීරණය පිළිබඳ දළ විශ්ලේෂණයක් සැපයීම සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා ඔවුන්ගේ වගකීමට සැලකිය යුතු හා අදාළ නිරීක්ෂණ සැපයීම සහ විගණකවරයා සහ පාලනය කරන පාර්ශව අතර ඵලදායී ද්වි-මාර්ග සන්නිවේදනයක් ප්‍රවර්ධනය කිරීම අවශ්‍ය වේ.

විගණකවරයා පාලනය කරන පාර්ශව සමඟ ඵලදායී ද්වි-මාර්ග සන්නිවේදනයක් ඇති බවට සාක්ෂි නොමැති වීම සම්බන්ධයෙන් නිරීක්ෂණ සන්නිවේදනය කරන ලදී.

### 4.7. තත්ත්ව පාලනය

විගණන වාර්තාව සකස් කිරීමේදී නිරතවීමේ කණ්ඩායම විසින් කරන ලද වැදගත් විනිශ්චයන් සහ එළඹුණු නිගමන පිළිබඳ විෂයගත ඇගයීමක් සිදු කිරීම සඳහා විගණකවරයා විසින් නිරත වීමේ තත්ත්ව පාලන සමාලෝචකයෙකු (EQCR) සම්බන්ධ කර ගැනීම අවශ්‍ය වේ. ලැයිස්තුගත ආයතනයක මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා නියැලීමේ තත්ත්ව පාලන සමාලෝචකයෙකු පත් කිරීමට අපොහොසත් වීම මගින් තත්ත්ව පාලන සමාලෝචනයෙහි නියැලීමට අදාළ ඌනතාවය නිරීක්ෂණය විය.

### 4.8. විගණකවරයාගේ වාර්තාව

විගණකවරයා විසින් ලබා ගත් විගණන සාක්ෂිවලින් එළැඹෙන ලද නිගමන ඇගයීමක් මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් සකස් කර ලිඛිත වාර්තාවක් මගින් එම මතය පැහැදිලිව ප්‍රකාශ කළ යුතු වේ.

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- විගණන මතය වෙනස් කිරීමට හේතු වන කරුණු සඳහා නිසි විස්තරයක් ලබා දීමට අපොහොසත් වීම.
- සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අපොහොසත් වීම.
- සුදුසු උප මාතෘකාවක් භාවිතා කරමින් ප්‍රධාන විගණන කරුණු විස්තර කිරීමට අපොහොසත් වීම.

### 4.9. අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී කළමනාකරණය විසින් ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම භාවිත කිරීමේ යෝග්‍යතාවය පිළිබඳව විගණකවරයා විසින් ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මත පදනම්ව, අඛණ්ඩ පැවැත්මක් ආයතනයට පවතින

# 2024 වර්ෂයේ විගණන පරීක්ෂණ වල සොයා ගැනීම්

හැකියාව පිළිබඳව අවිනිශ්චිතතාවයක් පවතින්නේද යන්න නිගමනය කිරීමට සහ විගණක වාර්තාව සඳහා සිදු විය හැකි බලපෑම් පිළිබඳව නිශ්චය කිරීම අවශ්‍ය වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්මේ පදනම භාවිත කිරීමේ යෝග්‍යතාවය ඇගයීමට අදාළව පහත සඳහන් අඩුපාඩු සන්නිවේදනය කරන ලදී.

- මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී, ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්මේ පදනම කළමනාකරණය විසින් භාවිත කිරීමේ යෝග්‍යතාවය සම්බන්ධයෙන් ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට සහ නිගමනය කිරීමට අපොහොසත් වීම.

### 5. වැඩිදියුණු කිරීම් සඳහා යෝජනා

විගණනයේ ගුණාත්මකතාව වැඩිදියුණු කිරීමේ අරමුණින්, වැඩි දියුණු කිරීම සඳහා යෝජනා හඳුනාගත් විට, ඒවා විගණක වෙත දැනුම් දෙනු ලබන අතර, අනාගතයේ දී ඔවුන්ගේ විගණන සිදු කරන විට විගණකවරයා එම යෝජනා වැඩි දියුණු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### 6. විගණන ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් ගන්නා ලද අනෙකුත් ක්‍රියාමාර්ග

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ මහජන විශ්වාසය ගොඩනැගීමේ ප්‍රධාන සාධකයක් වන්නේ විගණනයේ ගුණාත්මකභාවයයි. ඒ අනුව, දිවයිනේ විගණන ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

### 6.1. විගණන පරීක්ෂණවල සොයාගැනීම් විගණන කමිටු වෙත සන්නිවේදනය කිරීම

විගණන කමිටුව, පාලනය භාරව සිටින අයගෙන් කොටසක් වන අතර, ආයතනයේ උපායමාර්ගික දිශාව සහ ආයතනයේ වගවීමට අදාළ බැඳීම් අධීක්ෂණය කිරීමේ වගකීම ඔවුන් සතු වේ. ඒ අනුව, සමාගමක මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේ ගුණාත්මක බව සහතික කිරීම සහ විගණකවරයා සමඟ යෝග්‍ය සබඳතා පවත්වා ගැනීමේදී, විගණන කමිටුව සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි. මූල්‍ය වාර්තාකරණයේ ගුණාත්මකභාවය සහ විගණන පරිසරය වැඩි දියුණු කිරීම සඳහා පාලනය භාරව සිටින පාර්ශවය වශයෙන් විගණන කමිටුවල දායකත්වය ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් අඛණ්ඩව හඳුනා ගනී. ඒ අනුව, මූල්‍ය වාර්තාකරණයේ ඵලදායි අධීක්ෂණය වර්ධනය කිරීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කර ඇති සමාගම්වල විගණන පරීක්ෂණවල අදාළ ප්‍රතිඵල විගණන කමිටු සභාපතිවරුන් වෙත අඛණ්ඩව සන්නිවේදනය කරයි.

### 6.2. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. යේ පාර්ශවකරුවන්ට විගණන පරීක්ෂණවල සොයාගැනීම් පිළිබඳව සන්නිවේදනය කිරීම

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන්නන්, විගණකවරුන්, සම නියාමකයින්, ශ්‍රී ලංකා රජය සහ සාමාන්‍ය ජනතාව එහි පාර්ශවකරුවන් ලෙස හඳුනා ගනී. පාර්ශ්වකරුවන්ගේ දැනුම වැඩි දියුණු කිරීම මගින් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. ශ්‍රී ලංකාවේ මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය ඉහළ නැංවීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මඟ පෙන්වයි. ඒ අනුව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම., ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සකසන්නා සහ විගණකවරුන්ගේ බලපත්කරණ අධිකාරිය වන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය සමඟ සහයෝගීතාවයෙන්, මෑත වසරවලදී සිදු කරන ලද විගණන පරීක්ෂණවලදී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. යේ පොදු සොයාගැනීම් බෙදාගැනීම සඳහා එහි පාර්ශවකරුවන් සඳහා සැසියක් පවත්වන ලදී. නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි (SBEs) විගණන සිදුකරන විගණකවරුන් මෙන්ම විගණකවරයා සමඟ ඵලදායී සන්නිවේදනයක් සිදු කරන විගණන කමිටු සාමාජිකයින් දැනුවත් කිරීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. සිය පාර්ශවකරුවන් සමඟ මෙවැනි සොයාගැනීම් බෙදාගැනීමේ කටයුතු අඛණ්ඩව සිදු කිරීමට අපේක්ෂා කරයි.

### 6.3. විගණනයේ ගුණාත්මකභාවයට සහාය දැක්වීම සඳහා පවතින ජාත්‍යන්තර අනුබද්ධතා

2007 වසරේ පවත්වන ලද පළමු පූර්ණ රැස්වීමේ සිට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. ජාත්‍යන්තර ස්වාධීන විගණන නියාමක සංසදයේ (IFIAR) සාමාජිකයෙකු වන අතර, වසර පුරා අථත්‍ය රැස්වීම් ලෙස පවත්වන ලද IFIAR සැසිවලට සහභාගී වූ අතර, IFIAR හි තොරතුරු රැස් කිරීමේ ක්‍රියාකාරකම් සඳහා දායක වන අතර එහි සාමාන්‍ය සමීක්ෂණවලටද සහභාගී විය.

### 6.4. ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදයෙහි (IFIAR) 25% අඩු කිරීමේ ප්‍රයත්නය සඳහා සහභාගී වීම

ගෝලීය වශයෙන් විගණනවල ගුණාත්මනාකභාවය ඉහළ දැමීමේ අරමුණ ඇතිව IFIAR විසින් වසර 4 තුල විගණන ප්‍රමිතීන්ගෙන් බැහැරවීම්වල අනුපාතය 25%කින් අඩු කිරීම සඳහා දියත් කල වැඩසටහන 2023 වසර මූලික කරගෙන ආරම්භ කර ඇත. ඒ අනුව, BDO, Deloitte, Ernst & Young, Grant Thornton, KPMG සහ Pricewaterhouse Coopers යන ගෝලීය මහජන ප්‍රතිපත්ති කමිටුවට (GPPC) අයත් ආයතන මහජන ඇල්ම ඇති ලැයිස්තුගත සමාගම් වල විගණන කිරීම් වලදී නියාමනයන්ගේ සොයාගැනීම් එකක් හෝ වැඩි සංඛ්‍යාවක් තිබෙන අවස්ථා සමීක්ෂණය කරගෙන යන අතර ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස මණ්ඩලයද එයට සහභාගි විමට එකඟ වී තිබේ.

ඒ අනුව දේශීය මට්ටමින්, එම ජාත්‍යන්තර ජාලයන්හි දේශීය සමාගම් සම්බන්ධයෙන් සමීක්ෂණ කාලය තුළ අවසන් කරන ලද විගණන පරීක්ෂණවලින් ලබා ගත් අදාළ සොයා ගැනීම්, වාර්ෂික පදනමින් IFIAR වෙත ඉදිරිපත් කිරීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. එකඟ වී තිබේ.

## ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයෙහි 2025 වර්ෂයේ කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා අනුගමනය කළ යුතු කෙටි කාලීන සහ මධ්‍ය කාලීන පියවර

| ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලද ක්ෂේත්‍ර | කෙටි කාලීන පියවර | මධ්‍ය කාලීන පියවර |
|---|---|---|
| නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය යන නිර්වචනය තුළට ගැනෙන සියලුම ආයතන ආවරණය වන පරිදි මූල්‍ය ප්‍රකාශන ලැබීම පුළුල් කිරීම | • සම-නියාමකයින් හෝ අනෙකුත් ආයතන මගින් ප්‍රකාශයට පත් කරන ලද ලැයිස්තු පසු විපරම් කිරීම සහ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් හඳුනා ගැනීම / නිශ්චය කර ගැනීම<br>• නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි නිර්ණායක සපුරා තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා හඳුනාගත් ආයතන පිළිබඳව පසු විපරම් කිරීම.<br>• මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය ප්‍රචාරය කිරීම සඳහා සම-නියාමකයින් සහ අනෙකුත් ආයතන සමඟ සම්බන්ධ වීම.<br>• නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි පරිපාලන නිලධාරියාට සහාය වීම සඳහා සහායකයෙකු බඳවා ගැනීම. | • නව පනත ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී ඒ පිළිබඳව කටයුතු කිරීම. |
| කාර්ය මණ්ඩල හිඟය පිළිබඳ අර්බුදයට විසඳුම් සෙවීම | • වෘත්තීය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සාර්ථක කර ගැනීම සඳහා යෝජිත වැටුප් ව්‍යුහය පිළිබඳ අනුමැතිය ලබා ගැනීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව (PED) සමඟ සාකච්ඡා අඛණ්ඩව සිදු කිරීම.<br>• මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සඳහා තාක්ෂණික කාර්ය මණ්ඩලයට සහාය වීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආයතනික මට්ටමේ සිසුන් සහ උපාධි අපේක්ෂකයින් සීමාවාසිකයින් ලෙස සම්බන්ධ කර ගැනීම.<br>• මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සිදු කිරීම සඳහා බාහිර සමාලෝචකයින් බඳවා ගැනීම සහ පුහුණු කිරීම.<br>• වැඩ සුවිශේෂී පුහුණු සහ පුද්ගලික සංවර්ධන වැඩසටහන් මගින් දැනුම වැඩි දියුණු කිරීම. | • රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව (PED) වෙත ඉදිරිපත් කරන ලද වැටුප් පරිමාණයන්හි අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් පසුව සියලුම තාක්ෂණික කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම<br>• වත්මන් කාර්ය මණ්ඩලය රඳවා තබා ගැනීමේ ක්‍රමයක් ලෙස -<br>- බැඳුම්කර විධිවිධාන සමඟ විදේශ පුහුණු අවස්ථා ලබා දීම<br>- විදේශ සම නියාමකයින් සමඟ කටයුතු කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ හැකියා තක්සේරු කිරීම |
| මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සහ විගණන පරීක්ෂණ පැවැත්වීම සඳහා සම්පත් ප්‍රශස්ත කිරීම | • කර්මාන්ත අවදානම් නිරාවරණය මත පදනම්ව සමාලෝචන සඳහා මූල්‍ය ප්‍රකාශන තෝරා ගැනීම සඳහා අවදානම් පාදක ක්‍රමවේදයක් සකස් කිරීම.<br>• තෝරාගත් මූල්‍ය ප්‍රකාශන මගින් නියමිත කාල සීමාවක් තුළ සියලුම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් ආවරණය වන ක්‍රියාවලියක් අනුගමනය කිරීම.<br>• වාර්ෂික පදනමින් විගණන පරීක්ෂණ පැවැත්වීම සඳහා ඉහළ අවදානම් විගණන තෝරා ගැනීම. | |
| පාර්ශවකරුවන්ට කාලීන තොරතුරු සැපයීම | • මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සහ විගණන පරීක්ෂණවලින් සොයාගැනීම් පිළිබඳ වාර්ෂික නියාමන ක්‍රියාකාරකම් වාර්තාව ප්‍රකාශයට පත් කිරීම අඛණ්ඩව සිදු කිරීම<br>• වාර්ෂික ප්‍රකාශනවලට අමතරව, එක් එක් අවධානය යොමු කරන ක්ෂේත්‍රයන්හි මූල්‍ය ප්‍රකාශන සමාලෝචනවල සොයාගැනීම් පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීම<br>• පිළියෙළ කරන්නන් සහ විගණකවරුන් දැනුවත් කිරීමේ යාන්ත්‍රණයක් ලෙස, ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන්ට අනුකූල නොවීම පිළිබඳ ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. යේ පොදු සොයාගැනීම් පිළිබඳ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සමඟ සහයෝගයෙන් සැසි පැවැත්වීම අඛණ්ඩව සිදු කිරීම.<br>• ගනු ලැබූ බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග නියමිත කාල සීමාවක් තුළ ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. යේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කිරීම අඛණ්ඩව සිදු කිරීම. | • ප්‍රකාශනයට පත් කරනු ලබන ඊළඟ මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ නිවැරදි කිරීම් පිළිබිඹු කිරීමට හැකි වන පරිදි මූල්‍ය ප්‍රකාශන සමාලෝචන කාලානුරූපව සිදු කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම. |
| සමාලෝචන කාර්යය වැඩිදියුණු කිරීම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියේ (MIS) දෙවන අදියර ක්‍රියාත්මක කිරීම. | • MIS හි දෙවන අදියර සඳහා අවශ්‍ය ප්‍රධාන ලක්ෂණ හඳුනා ගැනීම | • MIS ව්‍යාපෘතියේ දෙවන අදියර සංවර්ධනය ක්‍රියාත්මක කිරීම |

# කාර්යසාධන ලකුණු පත

## 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කාර්යසාධනය

මූල්‍ය ප්‍රකාශන පරිශීලක දෘෂ්ටිකෝණය - අපගේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා, මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන් අපව දැකිය යුත්තේ කෙසේද?

| ඉලක්ක | ක්‍රියාමාර්ග | ඉලක්කය | තථ්‍ය | |
|---|---|---|---|---|
| | | වාර්ෂික | වාර්ෂික | ඉලක්කයේ % ක් ලෙස |
| සත්‍ය සහ සාධාරණ මතයක් ඉදිරිපත් කිරීම සඳහා නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි මූල්‍ය ප්‍රකාශන | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලද යන්න තීරණය කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම | මූල්‍ය ප්‍රකාශන කට්ටල 500ක් (සටහන 1) | -- | -- |
| | | මූල්‍ය ප්‍රකාශන කට්ටල 375ක් (සටහන 2) | මූල්‍ය ප්‍රකාශන කට්ටල 388ක් සම්පූර්ණ කරන ලදී | 103% ක් (සම්පූර්ණ කර ඇත) |
| | | | (මූල්‍ය ප්‍රකාශන කට්ටල 05 ක් සමාලෝචනය කරමින් පවතී) | 1% (එකතුව) |
| | ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලද යන්න තීරණය කිරීම සඳහා විගණන සමාලෝචනය කිරීම | විගණන 24ක් | 22 (සටහන 3) | 92% |

**නියාමනයට භාජනය වූ අස්ථිත්ව දෘෂ්ටිකෝණය:** අපගේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා, නියාමනයට භාජනය වූ ආයතන අපව දැකිය යුත්තේ කෙසේද?

| ඉලක්ක | ක්‍රියාමාර්ග | ඉලක්කය | තථ්‍ය | |
|---|---|---|---|---|
| | | වාර්ෂික | වාර්ෂික | ඉලක්කයේ % ක් ලෙස |
| මූල්‍ය ප්‍රකාශන රැස් කිරීම | ලැබුණු මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 1,707 | 1,718 (නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සංඛ්‍යාව 1,708) | 101 |

# කාර්යසාධන ලකුණු පත

**අභ්‍යන්තර ක්‍රියාවලි දෘෂ්ටිකෝණය:** අපගේ පාර්ශවකරුවන් තෘප්තිමත් කිරීම සඳහා අප විශිෂ්ටත්වය දැක්විය යුත්තේ කුමන අභ්‍යන්තර ක්‍රියාවලියක් සම්බන්ධයෙන් ද?

| ඉලක්ක | ක්‍රියාමාර්ග | ඉලක්කය | තථ්‍ය | |
|---|---|---|---|---|
| | | වාර්ෂික | වාර්ෂික | ඉලක්කයේ % ක් ලෙස |
| සේවක කාර්යසාධනය | වර්ෂය සඳහා ඉලක්කගත කාර්යසාධන අත්පත් කර ගැනීම | 25,272 * | 11,486 ** | 45 ** |
| දැනුම වැඩි දියුණු කර ගනිමින් වර්තමාන මෙහෙවර ඉලක්කයන් ළඟාකර ගැනීමට ඇති බාධක ඉවත් කිරීම | සතිපතා කෙරෙන ඉගෙනුම් ක්‍රියාකාරකම (අභ්‍යන්තර) | 30 | 55 (සටහන 4) | 183 |
| කාලානුරූප ප්‍රතිචාර | පැමිණිලි පිළිබඳව කටයුතු කිරීම, ඉල්ලීම් කරන ලද පැහැදිලි කිරීම් සහ ලැබුණු තොරතුරු. | ලැබුණු දිනය සහ ප්‍රතිචාර දක්වන දිනය හැර සාමාන්‍ය දින 5ක් ඇතුළත | - | - |

*2024 අප්‍රේල් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ අධීක්ෂණ (DS) 6 දෙනෙකු සහ සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ (ADS) 6 දෙනෙකු විසින් සමාලෝචන සිදු කරනු ඇතැයි යන උපකල්පනය මත පදනම්ව.

**2024 දෙසැම්බර් 31 දිනට සේවයේ නියුතු කාර්ය මණ්ඩලයේ තථ්‍ය සංඛ්‍යාව අධ්‍යක්ෂ අධීක්ෂණ (DS) දෙදෙනෙකු සහ සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ (ADS) 3 ක් විය.

**සටහන 1**: බාහිර සමාලෝචකයින් 10 දෙනෙකුගේ සහාය ඇතිව, අධ්‍යක්ෂ අධීක්ෂණ (DS) 4 දෙනෙකු සහ සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ (ADS) 3 දෙනෙකු (II ශ්‍රේණිය) විසින් සිදු කළ යුතු මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සංඛ්‍යාව 500 ක් ලෙස සැලසුම් කරන ලදී.

**සටහන 2**: ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. බාහිර සමාලෝචකයින් 10 දෙනෙකු සහ අධ්‍යක්ෂ අධීක්ෂණ (DS) 2 දෙනෙකු සහ සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ (ADS) 3 දෙනෙකු (II ශ්‍රේණිය) සමඟ වසර පුරා අඛණ්ඩව කටයුතු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, පවතින කාර්ය මණ්ඩලය සහ බාහිර සමාලෝචකයින් සමඟ වසර තුළ ළඟා කර ගත හැකි ඉලක්කය පහත පරිදි වේ;

| | |
|---|---|
| මුළු වාර්ෂික ඉලක්කය | 500 |
| අඩු කළා: නව බාහිර සමාලෝචක මඬුල්ල මගින් සමාලෝචනය කිරීමට සැලසුම් කළ සංඛ්‍යාව | (125) |
| (උදා: විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික කාර්ය මණ්ඩලය ඇතුළු අනෙකුත් බාහිර සමාලෝචකයන්) | |
| දැනට සිටින කාර්ය මණ්ඩලය සහ බාහිර සමාලෝචකයන් විසින් ළඟා විය යුතු ඉලක්කය | 375 |

**සටහන 3**: විගණන පරීක්ෂණ සිදු කිරීමට සිටින කාර්ය මණ්ඩලය අඩු වීම හේතුවෙන්

**සටහන 4**: නව කාර්ය මණ්ඩලය පුහුණු කිරීම හේතුවෙන්

# 2024 වර්ෂයේ දී සමාලෝචනය කරන ලද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් (SBE) ලැයිස්තුව

| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය | මූල්‍ය වර්ෂයේ අවසානය |
|---|---|---|
| 1 | ඒ ජී මෙල්කෝ එලිවේටර් කම්පැනි ලංකා (පෞද්) සමාගම | 2023 දෙසැම්බර් 31 |
| 2 | අබාන්ස් පොදු සමාගම | 2024 මාර්තු 31 |
| 3 | ඒස් පවර් ඇඹිලිපිටිය (පෞද්) සමාගම | 2023 මාර්තු 31 |
| 4 | ඇකියුටි සෙකියුරිටීස් සමාගම* | 2023 දෙසැම්බර් 31 |
| 5 | ඇකියුටි ස්ටොක්බ්‍රෝකර්ස් (පෞද්) සමාගම | 2023 දෙසැම්බර් 31 |
| 6 | අගලවත්ත ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම | 2023 දෙසැම්බර් 31 |
| 7 | ඇග්ස්ටාර් පොදු සමාගම | 2024 මාර්තු 31 |
| 8 | ඒඅයිඒ ඉන්ෂූරන්ස් ලංකා සමාගම | 2023 දෙසැම්බර් 31 |
| 9 | එයිට්කන් ස්පෙන්ස්  ට්‍රැවල්ස් (පෞද්) සමාගම | 2023 මාර්තු 31 |
| 10 | ඇල්ෆා වෙල්ත් සමාගම | 2022 දෙසැම්බර් 31 |
| 11 | ඇලුමෙක්ස් පොදු සමාගම | 2024 මාර්තු 31 |
| 12 | ඇමරිකන් ඇන්ඩ් එෆර්ඩ් ලංකා (පෞද්) සමාගම | 2023 සැප්තැම්බර් 30 |
| 13 | ඇම්සේෆ් බ්‍රිඩ්පෝර්ට් (පෞද්) සමාගම | 2023 දෙසැම්බර් 31 |
| 14 | ඇන්සෙල් ටෙක්ස්ටයිල්ස් ලංකා (පෞද්) සමාගම | 2023 ජුනි 30 |
| 15 | ආර්පිකෝ අටාරැක්සියා  ඇසට් මැනේජ්මන්ට් (පෞද්) සමාගම | 2023 මාර්තු 31 |
| 16 | ආර්පිකෝ අටාරැක්සියා ශ්‍රී ලංකා බොන්ඩ් ෆන්ඩ් | 2023 මාර්තු 31 |
| 17 | ඇසෝසියේටඩ් මෝටර්වේස් (පෞද්) සමාගම | 2023 දෙසැම්බර් 31 |
| 18 | ඇස්ට්‍රා ඇල්ෆා ෆන්ඩ් | 2023 මාර්තු 31 |
| 19 | බලංගොඩ ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම | 2023 දෙසැම්බර් 31 |
| 20 | බෙන්ජි ලිමිටඩ් | 2023 දෙසැම්බර් 31 |
| 21 | බීපීපීඑල් හෝල්ඩින්ස් පොදු සමාගම | 2024 මාර්තු 31 |
| 22 | බ්‍රැන්ඩික්ස් ඇපරල් (පෞද්) සමාගම | 2023 මාර්තු 31 |
| 23 | බ්‍රවුන්ස් ඇග්‍රි සොලූෂන්ස් (පෞද්) සමාගම | 2024 මාර්තු 31 |
| 24 | කැම්සෝ ට්‍රේඩින් (පෞද්) සමාගම | 2023 දෙසැම්බර් 31 |
| 25 | කැපිටල් එලායන්ස් කෝපරේට් ට්‍රෙෂෙරි ෆන්ඩ් | 2023 මාර්තු 31 |
| 26 | කැපිටල් එලායන්ස් ෆික්ස්ඩ් ඉන්කම් ඔපර්චුනිටීස් ෆන්ඩ් | 2023 මාර්තු 31 |
| 27 | කැපිටල් එලායන්ස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම | 2023 මාර්තු 31 |
| 28 | කැපිටල් එලායන්ස් මීඩියම් රිස්ක් ඩෙට් ෆන්ඩ් | 2023 මාර්තු 31 |
| 29 | කැපිටල් එලායන්ස් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 30 | කැපිටල් එලායන්ස් සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2023 මාර්තු 31 |
| 31 | කාර්ගිල්ස් කන්වීනියන්ට් ෆුඩ්ස් සමාගම | 2024 මාර්තු 31 |
| 32 | කාර්ල්ටන් ගාර්මන්ට්ස් (පෞද්) සමාගම | 2023 දෙසැම්බර් 31 |
| 33 | සීබීසී ෆිනෑන්ස් ලිමිටඩ් | 2023 දෙසැම්බර් 31 |
| 34 | සීබීඑල් ෆුඩ්ස් ඉන්ටර්නැෂනල් (පෞද්) සමාගම | 2023 මාර්තු 31 |
| 35 | සෙන්ටල් ඉන්ඩස්ට්‍රීස් පොදු සමාගම | 2024 මාර්තු 31 |
| 36 | සෙවා ලොජිස්ටික්ස් ලංකා (පෞද්) සමාගම | 2024 මාර්තු 31 |
| 37 | සීබෑන්ක් සෙන්චරි ග්‍රෝත් ෆන්ඩ් | 2023 මාර්තු 31 |

| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය | මූල්‍ය වර්ෂයේ අවසානය |
|---|---|---|
| 38 | සීබෑන්ක් යුනික් ට්‍රස්ට් ෆන්ඩ් | 2023 මාර්තු 31 |
| 39 | සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් සමාගම | 2023 දෙසැම්බර් 31 |
| 40 | සෙලින්කෝ හෝම්ස් ඉන්ටර්නැෂනල් (ලෝටස් ටවර්) ලිමිටඩ් | 2023 මාර්තු 31 |
| 41 | සිලෝන් ඇසට් මැනේජ්මන්ට් කම්පැණි ලිමිටඩ් | 2022 දෙසැම්බර් 31 |
| 42 | සිලෝන් බෙවරේජ් හෝල්ඩින්ග්ස් පොදු සමාගම | 2024 මාර්තු 31 |
| 43 | සිලෝන් බිස්කට්ස් සමාගම | 2023 මාර්තු 31 |
| 44 | සිලෝන් චොකලට්ස් සමාගම | 2021 මාර්තු 31 |
| 45 | සිලෝන් ග්‍රේන් එලිවේටර්ස් පොදු සමාගම | 2023 දෙසැම්බර් 31 |
| 46 | සිලෝන් ඉන්කම් ෆන්ඩ් | 2022 දෙසැම්බර් 31 |
| 47 | සිලෝන් ඉන්වෙස්ට්මන්ට් පොදු සමාගම | 2024 මාර්තු 31 |
| 48 | සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ් | 2023 දෙසැම්බර් 31 |
| | 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනතේ 23 වගන්තියට අනුව, මණ්ඩලයේ කාර්යය වන්නේ නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය (SBEs) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ විගණන ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරන බව අධීක්ෂණය කිරීමයි. ඒ අනුව, මණ්ඩලය විසින් එකතුව 1,708 ක් වූ නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් සංඛ්‍යාවක් පනත යටතේ නියම කර ඇති නිර්ණායක සපුරාලන බව හඳුනාගෙන තිබුණි. ඉහත දක්වා ඇති අරමුණ සඳහා සමාලෝචිත වර්ෂය තුළ මෙම නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන්වලින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 500 ක් සමාලෝචනය කිරීමට මණ්ඩලය සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, මණ්ඩලය විසින් සැලසුම් කළ මූල්‍ය ප්‍රකාශන කට්ටලවලින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 112 ක් හෝ සියයට 22 ක් 2024 දෙසැම්බර් 31 වන විට සමාලෝචනය කර නොතිබුණි. | ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. විසින් මිශ්‍ර ආකෘතියක් මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සඳහා නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් (SBEs) තෝරා ගන්නා අතර එය අහඹු සහ වටමාරු ප්‍රවේශයන් සහිත අවදානම් පාදක ප්‍රවේශයක එකතුවකි. ගෝලීය වශයෙන් කිසිදු නියාමකයෙකු 100% ආවරණයක් අපේක්ෂා නොකරයි.<br><br>එම නිසා, වාර්ෂිකව මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සංඛ්‍යාව සහ අවදානම් පදනම් කරගත්, අහඹු, වටමාරු ප්‍රවේශයක් මත සිදු කළ යුතු විගණන පරීක්ෂණ සංඛ්‍යාව තීරණය කරයි. මෙම ඉලක්ක සකසා ඇත්තේ පවතින සම්පත් සමග ප්‍රශස්ත මට්ටමක් මත ය - එනම් කාර්ය මණ්ඩලය ලබා ගත හැකි වීම මතය. විගණන වාර්තාවේ 2.3.2 ඡේදයේ පෙන්වා දී ඇති පරිදි, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. හි කාර්ය මණ්ඩලයේ තනතුරු 18 ක් පුරප්පාඩුව පැවතුන අතර, එයට අධීක්ෂක තනතුරු 13 ක් ඇතුළත් වේ. මෙම කාර්ය මණ්ඩලයේ පැවති හිඟය සිදු කරන ලද සමාලෝචන සංඛ්‍යාව අඩු වීමට සෘජුවම දායක විය. 2024 සඳහා, සැලසුම් කරන ලද අවස්ථාවේ සිටි කාර්ය මණ්ඩලය (අධ්‍යක්ෂ-අධීක්ෂණ (DS) 2) සහ වසර ආරම්භයේදී අතිරේක අධ්‍යක්ෂ-අධීක්ෂණ (DS) දෙදෙනෙකු සහ සහකාර අධ්‍යක්ෂ-අධීක්ෂණ (ADS) තිදෙනෙකු බඳවා ගැනීමට අපේක්ෂා කිරීම මත පදනම්ව, මූල්‍ය ප්‍රකාශන කට්ටල 500 ක් සමාලෝචනය කිරීමට ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. සැලසුම් කරන ලදී.<br><br>කෙසේ වුවද, 2024 මාර්තු-අප්‍රේල් කාලය තුළ එක් අධ්‍යක්ෂ අධීක්ෂණ නිලධාරියකු සහ සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ නිලධාරීන් තිදෙනෙකු පමණක් බඳවා ගැනීමට ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. ට හැකි විය. තවද, මෙම කාලය තුළ ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ අධීක්ෂණ තනතුරු දැරූ නිලධාරීන් අතරින් එක් නිලධාරියෙකු ඉල්ලා අස්විය. නව කාර්ය මණ්ඩලය ප්‍රමිති සහ සමාලෝචන ක්‍රියාවලිය පිළිබඳව පුහුණුව ලබා දීම අවශ්‍ය විය. තවද, එම පුහුණු කාලසීමාව තුළ ඔවුන්ට සම්පූර්ණ කළ හැකි වූ සමාලෝචන ප්‍රමාණය ඉතා අඩු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, මුලින් සැලසුම් කළ සමාලෝචන සංඛ්‍යාව සාක්ෂාත් කර ගැනීමට නොහැකි විය. අභ්‍යන්තර කාර්ය මණ්ඩලය මගින් සමාලෝචන 375 ක් සම්පූර්ණ කර ගැනීමට සහ ඉතිරි සමාලෝචන 125 බාහිර සහභාගීත්වයෙන්, එනම් විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් විශ්‍රාම ගන්නා කාර්ය මණ්ඩලයේ සේවය ලබා ගැනීම මගින් සහ තවත් බාහිර සමාලෝචකයින් බඳවා ගැනීම මගින් සම්පූර්ණ කිරීමට හැකි වන පරිදි මණ්ඩලය විසින් සැලැස්ම පසුව සංශෝධනය කරන ලදී. කෙසේ වුවද, මෙම කාර්යය අපේක්ෂා කළ පරිදි ක්‍රියාත්මක නොවූ අතර, බාහිර සමාලෝචකයින් 2024 දෙසැම්බර් මාසයේදී පමණක් සම්බන්ධ කර ගත හැකි විය. පරිපාලන කාර්ය මණ්ඩලය නොමැති විට, කළමනාකාරිත්වය ඔවුන්ගේ නිත්‍ය රාජකාරිවලට අමතරව, දැන්වීම පළ කිරීම අවසන් කිරීම, තාක්ෂණික තක්සේරු විභාග පැවැත්වීම සහ තෝරා ගන්නා ලද අපේක්ෂකයින් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම ඇතුළු බඳවා ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ වී තිබුණි.<br><br>මෙම සීමාවන් මධ්‍යයේ වුවද, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. 2024 වර්ෂයේ දී සමාලෝචන 388 ක් සාර්ථකව සම්පූර්ණ කළ අතර, මුල් ඉලක්කයෙන් 77.6% ක් අත්කර ගෙන තිබුණි. |

# විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී ඇති ගැටළු සම්බන්ධයෙන් පවතින වත්මන් තත්ත්වය පිළිබඳව ලබා දෙන ලද පිළිතුරු

| අංකය | 2025 සැප්තැම්බර් 8 දිනැති විගණන වාර්තාවේ නිරීක්ෂණ | කළමනාකාරිත්වය විසින් ලබා දුන් පිළිතුරු |
|---|---|---|
| 2.2.2. (අ) | මාගේ ඉකුත් විගණන වාර්තාවල සඳහන් කළ පරිදි, මණ්ඩලය විසින් 2019 ජනවාරි 30 දින ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමඟ මණ්ඩලයේ කාර්යාල පරිශ්‍රයේ අභ්‍යන්තර කටයුතු සැලසුම් කිරීම සහ අධීක්ෂණය කිරීම සම්බන්ධ උපදේශන සේවා සඳහා ගිවිසුමකට එළඹ තිබුණි. උපදේශන ගාස්තුව මුළු ඉදිකිරීම් පිරිවැයෙන් සියයට 7 ක් ලෙස එකඟතාවකට පැමිණ තිබුණි. 2021 ඔක්තෝබර් 21 දිනට රු. 1,1797,874 ක මුළු මුදලක් ගෙවා තිබුණු අතර, උපදේශන සේවා සංවර්ධන අදියර දක්වා පමණක් සපයා තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, ඉතිරි වැඩ විෂයපථය 2025 මැයි 31 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. | පෙර අවස්ථාවලදී පැහැදිලි කළ පරිදි, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. සහ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (SEC) යන දෙඅංශයේම පාලනයෙන් ඔබ්බට පැවති තත්ත්වයන් හේතුවෙන් අභ්‍යන්තර කටයුතු සැලසුම් කිරීම සහ අධීක්ෂණය සම්පූර්ණ කිරීමට නොහැකි විය. ප්‍රධාන වශයෙන්, මෑත අතීතයේ දී ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ දැඩි අරමුදල් වෙන් කිරීමේ ප්‍රතිපත්ති හේතුවෙන් මෙය සිදු විය.<br><br>2025 මාර්තු මාසයේදී අයවැය අනුමත කිරීමත් සමඟ, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (SEC) සමඟ සාකච්ඡා නැවත ආරම්භ කරන ලදී. වර්තමානයේ, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (SEC) ප්‍රමාණ පත්‍ර (BoQ) ඇතුළුව අවශ්‍ය ලියකියවිලි සකස් කර ඇති අතර, අපි ඉක්මනින් ලංසු කැඳවීමට අදහස් කරමු. |
| 2.3 | වෙනත් කරුණු | |
| (අ) | 2024 දෙසැම්බර් 31 වන විට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති පාරිතෝෂික ප්‍රතිපාදනය රු. 9,761,906 කි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු රජයේ ප්‍රදාන භාවිතා කරමින් රු. 5,100,000 ක් පාරිතෝෂික අරමුදලට මාරු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ පාරිතෝෂික අරමුදල් ශේෂය රු. 18,920,955 ක් වූ අතර, එමඟින්, 2024 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික ප්‍රතිපාදනයට සාපේක්ෂව රු. 9,1 59,048 ක අතිරික්තයක් පැවතීම හෝ අරමුදල ආසන්න වශයෙන් දෙගුණයක් වී තිබුණි. තවද, එම මුදල පාරිතෝෂික අරමුදලට මාරු කිරීම තීරණය කිරීම සඳහා ලේඛනගත පදනමක් හෝ ස්ථාපිත ක්‍රමවේදයක් නොමැති බව සටහන් විය. ඒ අනුව, මාරු කරන ලද මුදල තීරණය කිරීම කිසිදු වෛෂයික තාර්කිකත්වයකින් හෝ සහායක නිර්ණායකයකින් තොරව කළමනාකරණයේ අභිමතය පරිදි පමණක් සිදු කරන ලද බව දක්නට ලැබුණි. | 2013 වර්ෂයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය මත පදනම්ව, වසර පහකට වැඩි කාලයක් සේවය කිරීමෙන් පසු ඉල්ලා අස්වන කාර්ය මණ්ඩලයට පාරිතෝෂික ගෙවීම් සඳහා භාවිතා කිරීම සඳහා වෙනම අරමුදලක් පිහිටුවීමට මණ්ඩලය තීරණය කරන ලදී.<br><br>2022-2023 කාලසීමාව තුළ, දිගු කාලීනව සේවය කළ වෘත්තීය කාර්ය මණ්ඩලයේ වැඩි සංඛ්‍යාවක් ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. වෙතින් ඉල්ලා අස්වූ අතර, ඔවුන්ගේ හිමිකම් පියවීමට අවශ්‍ය මුදල් පිටතට ගලායාම හේතුවෙන් පාරිතෝෂික අරමුදල සැලකිය යුතු ලෙස අඩු විය. එතැන් සිට, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. විසින් සෑම වසරකම ආරම්භයේදී වසර පහකට වැඩි කාලයක් සේවය කර ඇති සියලුම කාර්ය මණ්ඩලය සඳහා සැබෑ වගකීම ගණනය කිරීමෙන් පාරිතෝෂික අරමුදලේ ප්‍රමාණවත් බව තක්සේරු කිරීමේ පරිචය අනුගමනය කර ඇත. 2024 සඳහා සිදු කරන ලද තක්සේරුව මගින් 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති පාරිතෝෂික වගකීමට සාපේක්ෂව ආසන්න වශයෙන් රුපියල් මිලියන 1.8 ක හිඟයක් අනාවරණය විය.<br><br>පාරිතෝෂිතය සඳහා ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. අරමුදල් ඉල්ලා සිටියද, පුනරාවර්තන වියදම් සඳහා අරමුදල් නිකුත් කිරීමේදී මහා භාණ්ඩාගාරය අනුගමනය කරන දැඩි ප්‍රතිපත්තිය නිසා ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. අතීතයේ අනුගමනය කරන ලද පරිචය වූ කාර්තුමය පදනමක් මත මාරුකිරීම් සිදු කිරීම වළක්වයි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 දී, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. අතිරේක අරමුදල් ඇති සෑම අවස්ථාවකම පාරිතෝෂික අරමුදලට මාරුකිරීම් කරන ලදී. තථ්‍ය වගකීම ඉක්මවා යන මෙම අතිරේක මාරු කිරීම් සිදු කර ඇත්තේ කාලෝචිත ආකාරයකින් පාරිතෝෂික බැඳීම් සපුරාලීම සඳහා ප්‍රමාණවත් අරමුදල් ලබා ගත හැකි බව සහතික කිරීමේ අරමුණින් බව අපි පිළිගනිමු.<br><br>කෙසේ වුවද, එවැනි මාරුකිරීම් කාර්ය මණ්ඩලයට ගෙවිය යුතු තථ්‍ය වගකීමට දැඩි ලෙස සීමා වන බව අපි සහතික කරමු. |

# විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී ඇති ගැටළු සම්බන්ධයෙන් පවතින වත්මන් තත්ත්වය පිළිබඳව ලබා දෙන ලද පිළිතුරු

| අංකය | 2025 සැප්තැම්බර් 8 දිනැති විගණන වාර්තාවේ නිරීක්ෂණ | කළමනාකාරීත්වය විසින් ලබා දුන් පිළිතුරු |
|---|---|---|
| (ආ) | විගණනය වෙත ලබා දුන් තොරතුරුවලට අනුව, පාරිතෝෂික ප්‍රතිපාදන සහ අරමුදල් ගිණුමේ ඇති ශේෂය අතර හඳුනාගත් හිඟය සඳහා මණ්ඩලයට කාර්තුමය පදනමක් මත මහා භාණ්ඩාගාරයෙන් අරමුදල් ඉල්ලා සිටීම අවශ්‍ය වේ. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය විසින් නියම කරන ලද පදනමට අනුකූල නොවී රු. 5,100,000 ක මුළු මුදලක් පාරිතෝෂිත අරමුදලට මාරු කර තිබුණි. | පාරිතෝෂික අරමුදලට මාරු කිරීම සඳහා කාර්තුමය පදනමක් මත මහා භාණ්ඩාගාරයෙන් අරමුදල් ඉල්ලා සිටින බව දැක්වෙන තොරතුරු පදනම් වී ඇත්තේ පාරිතෝෂික ඉතිරිකිරීමේ ගිණුමට ආයෝජන විධිමත් කිරීම සඳහා අප විසින් සකස් කරන ලද අභ්‍යන්තර ලේඛනයක් මත ය. කෙසේ වුවද, අරමුදල් නිකුත් කිරීමේදී අමාත්‍යාංශය විසින් අනුගමනය කරන ලද දැඩි ක්‍රියාවලීන් හේතුවෙන් මෙම ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීම ප්‍රායෝගිකව කළ නොහැකි වී තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, කාර්තුමය මාරු කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය නොකළ අතර, අතිරික්ත අරමුදල් ඇති සෑම අවස්ථාවකම අරමුදල් මාරු කර ඇත. එබැවින්, දැඩි කාර්තුමය පදනමක් මත මාරු කිරීම් සිදු කිරීම සැමවිටම ප්‍රායෝගික නොවන බැවින්, සැබෑ පරිචය වඩාත් නිවැරදිව පිළිබිඹු කිරීම සඳහා අපි අභ්‍යන්තර ලේඛනය යාවත්කාලීන කරන්නෙමු. |
| 2.3.2 | මානව සම්පත් කළමනාකරණය | |
| | 2024 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 33 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 15 ක් විය. එමගින්, මේ වන විට පුරප්පාඩු 18 ක් පවතී. ඒ අතරින්, නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරක් ඇතුළුව පුරප්පාඩු 16 ක් මණ්ඩලය ආරම්භ කළ දින සිට පුරප්පාඩු වී තිබුණි. ඊට අමතරව, 2024 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ අධීක්ෂණ තනතුරු 4 ක්, නියෝජ්‍ය අධ්‍යක්ෂ අධීක්ෂණ තනතුරු 6 ක්, සහකාර අධ්‍යක්ෂ තනතුරු 4 ක් සහ එක් විධායක නිලධාරී තනතුරක් පුරප්පාඩු වී තිබුණි. විධායක මට්ටමේ තනතුරුවල ඉතිරිව ඇති මෙම පුරප්පාඩු මගින් මණ්ඩලයේ සඵලදායි ක්‍රියාකාරීත්වයට බලපෑමක් ඇති විය හැකිය. | ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. යේ තනතුරු සඳහා පවතින ඉහළ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව පසුගිය වසර කිහිපය තුළ විගණකවරුන් විසින් නිරන්තරයෙන් ඉස්මතු කර දක්වා ඇත. සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලය ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. විවිධ උපාය මාර්ග අඛණ්ඩව ගවේෂණය කර ඇත.<br><br>මෙම පුරප්පාඩු පිරවීම සඳහා, අපි විධිමත්ව පුවත්පත් සහ බහු මාධ්‍ය වේදිකා හරහා දැන්වීම් පළ කර ඇති අතර, ඒ සඳහා 2025 වර්ෂය තුළ රු. මිලියන 1.4 ක මුළු පිරිවැයක් දැරීමට සිදු විය.<br><br>ඊට අමතරව, අධීක්ෂක තනතුරු වඩාත් ආකර්ෂණීය කිරීම සඳහා පහත පියවර ගන්නා ලදී. මේවාට ඇතුළත් වන්නේ:<br><br>• සහකාර අධ්‍යක්ෂ-අධීක්ෂණ තනතුර සඳහා ඇතුළත් කර ගැනීමේ සුදුසුකම් අවශ්‍යතාවය පූර්ණ සුදුසුකම් ලත් වරලත් ගණකාධිකාරීවරයෙකුගේ සිට අවසන් වසර වරලත් ගණකාධිකරණ අපේක්ෂකයකු වීම දක්වා අඩු කිරීම.<br><br>• අධ්‍යක්ෂ-අධීක්ෂණ තනතුර සඳහා අවශ්‍ය පළපුරුද්ද ලබා සිටිය යුතු වර්ෂ සංඛ්‍යාව, මුලින් අවුරුදු 13 සිට අවුරුදු 8 දක්වා සහ පසුව අවුරුදු 6 දක්වා අඩු කිරීම.<br><br>අධීක්ෂණ තනතුරු සඳහා අපගේ නවතම දැන්වීමට ප්‍රතිචාර දැක්වූ අපේක්ෂකයින් තේරීම සහ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියක අපි දැනට නිරතව සිටිමු.<br><br>සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ - නීති තනතුර සම්බන්ධයෙන්, අප විසින් සුදුසු අපේක්ෂකයෙකු මුලින් තෝරාගෙන තිබුණද, පත්වීම් ලිපිය නිකුත් කරන අවස්ථාවේදී ඇය එම පිරිනැමීම ප්‍රතික්ෂේප කළාය. පසුව, ඊළඟ හොඳම අපේක්ෂකයා ද පිරිනැමීම ප්‍රතික්ෂේප කර තිබුණි. |

## විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී ඇති ගැටළු සම්බන්ධයෙන් පවතින වත්මන් තත්ත්වය පිළිබඳව ලබා දෙන ලද පිළිතුරු

| අංකය | 2025 සැප්තැම්බර් 8 දිනැති විගණන වාර්තාවේ නිරීක්ෂණ | කළමනාකාරිත්වය විසින් ලබා දුන් පිළිතුරු |
|---|---|---|
| | | ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. හි කුඩා සේවක සංඛ්‍යාව සහකාර අධ්‍යක්ෂ - මූල්‍ය හා පාලන (අත්) තනතුරෙන් අඛණ්ඩව ඉවත්ව යෑම් අත්විඳිමින් සිටින අතර, මෑතකදී බඳවා ගත් නිලධාරීන් ඉතා කෙටි සේවා කාලයකින් පසු (උදා: දින 3 සහ මාස 5) ඉල්ලා අස්විය. තවද, 2025 අගෝස්තු 1 වන දින රාජකාරි භාර ගැනීමට නියමිතව සිටි සහකාර අධ්‍යක්ෂ - මූල්‍ය හා පාලන (ADFA), ඇයගේ වත්මන් සේවායෝජකයාට ඇයව රාජකාරිවලින් නිදහස් කිරීමට නොහැකි බැවින්, එම තනතුර භාර ගැනීමට නොහැකි බව ඇය අප වෙත දන්වා ඇත. තාවකාලික පියවරක් ලෙස, සහකාර අධ්‍යක්ෂ - මූල්‍ය හා පාලන (ADFA) සේවා 2024 දෙසැම්බර් සිට 2025 ජූනි දක්වා බැහැරින් ලබා ගැනීමට අපි කටයුතු කළෙමු. කෙසේ වුවද, මෙම තනතුර සඳහා බැහැරින් සේවා ලබා ගැනීම ඉතා මිල අධික බව සනාථ වී ඇත. දැනට එම තනතුර සඳහා නැවත දැන්වීම් පළ කර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසාන දිනය 2025 සැප්තැම්බර් 28 වේ.<br><br>ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. යේ සේවක සංඛ්‍යාවේ දැනට ෂක්ෂ නිලධාරී තනතුරක් පවතින අතර, එම පුරප්පාඩුව 2024 අප්‍රේල් මාසයේදී එකඟ වූ වැටුපකට කොන්ත්‍රාත් පදනමක් මත පුරවා ඇත. |

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | සටහන | 2024 දෙසැම්බර් 31 දිනට රු. | 2023 දෙසැම්බර් 31 දිනට රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 3 | **23,007,860** | 25,781,785 |
| අස්පෘශ්‍ය වත්කම් | 4 | **30,640,720** | 33,718,500 |
| තැන්පතු | 5 | **6,979,736** | 6,979,736 |
| නිර්වචිත ප්‍රතිලාභ වගකීම් | 6 | **9,159,048** | 6,333,836 |
| | | **69,787,364** | 72,813,857 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 7 | **538,840** | 728,079 |
| ලැබිය යුතු ගිණුම් | 8 | **3,926,146** | 3,136,467 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 9 | **1,804,772** | 3,327,422 |
| | | **6,269,758** | 7,191,968 |
| **මුළු වත්කම්** | | **76,057,122** | 80,005,825 |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විලම්භිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන | 10 | **69,787,364** | 72,813,857 |
| | | **69,787,364** | 72,813,857 |
| **ජංගම වගකීම්** | | | |
| විලම්භිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන | 11 | **1,242,873** | 5,318,539 |
| ගෙවිය යුතු ගිණුම් | 12 | **5,026,885** | 1,873,429 |
| | | **6,269,758** | 7,191,968 |
| **මුළු වගකීම්** | | **76,057,122** | 80,005,825 |

50 වන පිටුවේ සිට 57 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සංකලනිත කොටසකි.
මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ වගකීමකි.

මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඒ වෙනුවෙන් අත්සන් කරන ලද්දේ

සභාපති
කේ.එම්.ඒ.එන්. දවුලගල

සාමාජික
එස්.එම්.එස්.එස්. බණ්ඩාර

අධ්‍යක්ෂ ජනරාල්
ඒ.අයි. මොහොට්ටි

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය හා පරිපාලන)
ආශා අහමද්

2025 ජනවාරි 27

# මූල්‍ය කාර්යසාධනය හා අනෙකුත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| රාජ්‍ය ප්‍රදාන | 13 | 106,668,457 | 73,544,975 |
| අඩුකලා: ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට නිදහස් කළ ප්‍රදාන | | 2,000,000 | 2,000,000 |
| | | 104,668,457 | 71,544,975 |
| **මෙහෙයුම් වියදම්** | | | |
| මණ්ඩලයේ සාමාජිකයන්ගේ දීමනා | | (1,480,474) | (1,690,300) |
| විගණකවරුන්ගේ පාරිශ්‍රමික | 14 | (400,000) | (353,030) |
| කාර්ය මණ්ඩල පිරිවැය | 15 | (53,418,460) | (35,050,482) |
| ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය | | (127,550) | (144,720) |
| පුවත්පත් නිවේදන | | (570,789) | (1,281,482) |
| කුලි හා ගොඩනැගිලි සේවා ගාස්තු | | (16,858,862) | (13,963,891) |
| ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම් | 3 සහ 4 | (12,312,430) | (5,468,883) |
| විදුලිය | | (1,974,714) | (2,006,648) |
| සමාලෝචකයින් සඳහා වූ වෘත්තීය ගාස්තු | | (584,000) | (188,000) |
| අන්තර්ජාතික සාමාජිකත්වයන් | | (2,868,450) | (2,467,303) |
| පොත් හා වාර සඟරා | | (749,455) | (996,410) |
| පුහුණුව ස සංවර්ධනය | | (638,292) | (58,992) |
| බලපත්‍ර හා රක්ෂණ | | (1,087,126) | (1,120,870) |
| ලිපිද්‍රව්‍ය | | (656,525) | (699,324) |
| කළමනාකරණ තොරතුරු පද්ධතියට සහාය සහ නඩත්තුව | | (1,632,333) | - |
| වෙනත් පරිපාලන වියදම් | 16 | (9,308,997) | (6,054,640) |
| | | - | - |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| නිශ්චිත ප්‍රතිලාභ වගකීම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් වූ ලාභය / (පාඩුව) | | (1,666,589) | (6,812,305) |
| නිශ්චිත ප්‍රතිලාභ වගකීම් ප්‍රත්‍යාගණනය කිරීමට අදාළ රජයේ ප්‍රදාන | | 1,666,589 | 6,812,305 |
| | | - | - |
| **වර්ෂයේ ශුද්ධ අතිරික්තය / (හිඟය)** | | - | - |

50 වන පිටුවේ සිට 57 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සංකලනිත කොටසකි.

# ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

| | සමුච්චිත අරමුදල (රු) |
|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය | - |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය / (හිඟය) | - |
| 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය | - |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය / (හිඟය) | - |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - |

50 වන පිටුවේ සිට 57 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සංකලනිත කොටසකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය / (හිඟය) | | - | - |
| ගැළපීම්: | | | |
| වර්ෂය තුළ ලද රාජ්‍ය ප්‍රදාන | | 101,232,887 | 89,412,934 |
| මුළු විස්තිර්ණ ආදායම් වලට මාරුකළ විලම්භිත රාජ්‍ය ප්‍රදාන | 13 | (109,937,046) | (80,357,280) |
| ක්ෂය කිරීම හා ක්‍රමක්ෂය කිරීම | 3 සහ 4 | 12,312,430 | 5,468,883 |
| පාර්තෝෂික අරමුදල් ආයෝජනයෙන් ලද පොළිය | | (928,215) | (1,047,684) |
| නිශ්චිත ප්‍රතිලාභ (වත්කම්) / වගකීම් | 15.1 | 2,274,788 | 6,509,764 |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර වියදමට වඩා ආදායමේ / (ආදායමට වඩා වියදමේ) අතිරික්තය | | 4,954,843 | 19,986,617 |
| තොග අඩුවීම / (වැඩිවීම) | | 189,239 | 78,029 |
| ලැබිය යුතු ගිණුම් අඩුවීම / (වැඩිවීම) | | (789,679) | (60,684) |
| ගෙවිය යුතු ගිණුම් (වැඩිවීම) / අඩුවීම | | 3,153,456 | (2,198,064) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | | 7,507,859 | 17,805,898 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම | | (2,278,825) | (1,281,600) |
| මෘදුකාංග සංවර්ධනය සඳහා කරන ලද ගෙවීම් | | (2,579,900) | (13,560,500) |
| පාර්තෝෂික අරමුදලේ ආයෝජනය | | (5,100,000) | (3,950,000) |
| පාර්තෝෂික අරමුදල් සඳහා වෙන් කල තැන්පතුවලින් හා ආරක්ෂිත සේප්පුව සම්බන්ධ ආයෝජනවලින් ලද පොලිය | | 928,215 | 1,047,684 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ | | (9,030,510) | (17,744,416) |
| ශුද්ධ මුදල් ප්‍රවාහ | | (1,522,649) | 61,482 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | - | - |
| **මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** | | (1,522,649) | 61,482 |
| වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන දෑ | | 3,327,422 | 3,265,940 |
| **වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ** | 9 | 1,804,772 | 3,327,422 |

50 වන පිටුවේ සිට 57 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සංකලනිත කොටසකි.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

## 01 ආයතනික තොරතුරු

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2025 ජනවාරි 27 දින එහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතයක් මගින් නිකුත් කිරීම සඳහා අවසර දෙන ලදී. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

මණ්ඩලයේ කාර්යය වන්නේ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතේ විධිවිධාන යටතේ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායවල මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම, ඉදිරිපත් කිරීම සහ විගණනය කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වීම සහ එම මූල්‍ය ප්‍රකාශනවල විගණන ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූල වීම සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීමයි.

2024 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් ස්ථිර සේවකයින් 14 දෙනෙකු සහ කොන්ත්‍රාත් පදනම මත එක් සේවකයෙකු සේවයේ යොදවා තිබුණි. (2023 දෙසැම්බර් 31 දිනට ස්ථිර සේවකයින් 11 දෙනෙකු සිටියහ).

## 02 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### පිළියෙළ කිරීමේ පදනම

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණයේ උපචිත පදනම මත ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම මත සකස්කර ඇති අතර ගිණුම්කරණ ප්‍රතිපත්ති කාල සීමාව පුරාවට අඛණ්ඩව යොදාගෙන ඇත.

### වාර්තා කිරීමේ දිනට පසු සිදුවීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට පසුව සිදුවන සියලුම වැදගත් සිදුවීම් සලකා බලනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ගැළපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

### දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂයකිරීම් අඩු කළ පිරිවැයට දක්වනු ලැබේ. ක්ෂයකිරීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වනු ලැබේ. වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයුකාලය පුරා සරල මාර්ග පදනම මත කාර්යසාධනය පහත පරිදි වේ.

| වත්කම | ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයුකාලය |
|---|---|
| මෝටර් වාහන | අවුරුදු 15 යි |
| කාර්යාල උපකරණ | අවුරුදු 4-25 |
| ගෘහභාණ්ඩ, වැද්දුම් හා සවිකිරීම් | අවුරුදු 6-30 |
| පොත් හා ප්‍රකාශන | අවුරුදු 3 යි |

භාවිතා කරන කාලසීමාව මත පදනම්ව මිලදී ගත් වර්ෂයේ සහ විකුණුම් වර්ෂයේ ක්ෂයකිරීම් සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ. මිලදී ගත් මාසයේ සම්පූර්ණ ක්ෂයකිරීම් සඳහා ප්‍රතිපාදන සලසනු ලබන අතර විකුණුම් මාසයේ කිසිදු ක්ෂයකිරීමක් සඳහා ප්‍රතිපාදන සලසනු නොලැබේ.

පිරිවැය රු.25,000/- නොඉක්මවන මුදලකට මිල දී ගත් පොත් සහ ප්‍රකාශන හැර අනෙකුත් අයිතම, සියලුම ගිණුම් ප්‍රමිති සහ විගණන ප්‍රමිති සහ පිරිවැය රු.10,000/- නොඉක්මවන අනෙකුත් ප්‍රකාශන මිල දී ගත් වර්ෂයේ වියදම් ලෙස දක්වනු ලැබේ.

### අස්පෘශ්‍ය වත්කම්

ආයතනයට අනාගත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට හැකි නම් සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති SLPSAS 20 අස්පෘශ්‍ය වත්කම්වලට අනුකූලව වත්කම්වල පිරිවැය විශ්වසනීයව මැනිය හැකි වේ නම් අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනු ලැබේ. සීමිත ප්‍රයෝජනවත් ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ පාඩු අඩු කර පිරිවැයට මනිනු ලැබේ.

වත්කම් ලෙස හඳුනාගෙන ඇති මෘදුකාංග සංවර්ධන පිරිවැය, වසර 10 ක් නොඉක්මවන ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ.

### තොග

තොග පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් අතරින් අඩු වටිනාකමට අගය කරනු ලැබේ. තොග පිරිවැය පළමු ගැනුම්, පළමු නිකුතු (FIFO) පදනම භාවිතා කිරීමෙන් මනිනු ලැබේ.

### ලැබිය යුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම් උපලබ්ධි වීමට ඇස්තමේන්තු කර ඇති මුදල් ප්‍රමාණයට දක්වා ඇති අතර අවශ්‍ය අවස්ථාවල දී බොල් සහ අඩමාණ ණය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.

### මුදල් සහ මුදල් හා සමාන දෑ

අතැති මුදල් සහ බැංකුවල ඇති මුදල් සහ කෙටි කාලීන තැන්පතු පිරිවැයට ගණනය කරනු ලැබේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ සංයුක්ත වූ අතැති මුදල් සහ බැංකු තැන්පතු, හිඟහිටි බැංකු අයිරාවලට හිලව් කර ලැබෙන ශුද්ධ වටිනාකමින් සමන්විත වේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

## 02 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### ගෙවිය යුතු ගිණුම්

ගෙවිය යුතු ගිණුම් සඳහා වන වගකීම් ගෙවීමට අපේක්ෂිත මුදල් හා මුදල් සමාන දෑ ප්‍රමාණය අනුව ගණනය කෙරේ.

### නිශ්චිත ප්‍රතිලාභ බැදීම්

1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීමේ පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාමික පාරිතෝෂික සඳහා වන නිශ්චිත ප්‍රතිලාභ බැඳීම, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති අතර, නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම නියෝජනය කරයි. මූල්‍ය කාර්ය සාධන හා අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ සියලුම ආයුගණක ලාභ සහ අලාභ වහාම හඳුනා ගැනේ.

### රාජ්‍ය ප්‍රදාන

ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රදාන අදාළ වියදම් හඳුනාගෙන ඇති කාලසීමාව තුළ ආදායම ලෙස හඳුනා ගැනේ.

පසුකාලීනව වියදම් කරනු ලබන වත්කම් අත්පත් කර ගැනීම සඳහා භාවිත කරන රජයේ ප්‍රදාන විලම්භිත ආදායමක් ලෙස හඳුනාගැනේ. මුදල් සහ මුදල් හා සමාන දෑ ඇතුළු අනෙකුත් වත්කම්වලින් වගකීම් අඩු කර නියෝජනය වන රජයේ ප්‍රදාන (ලැබෙන ප්‍රදාන නිසා ඇතිවන වගකීම් හැර) වගකීම් ලෙස හඳුනා ගැනේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

### 3. දේපළ, පිරියත සහ උපකරණ

| දිනට | මෝටර් වාහන | | කාර්යාල උපකරණ | | ලී බඩු, හා සවිකිරීම් | | පුස්තකාල පොත් | | කෙරීගෙන යන වැඩ | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 31-දෙසැ-24 රු. | 31-දෙසැ-23 රු. | 31-දෙසැ-24 රු. | 31-දෙසැ-23 රු. | 31-දෙසැ-24 රු. | 31-දෙසැ-23 රු. | 31-දෙසැ-24 රු. | 31-දෙසැ-23 රු. | 31-දෙසැ-24 රු. | 31-දෙසැ-23 රු. | 31-දෙසැ-24 රු. | 31-දෙසැ-23 රු. |
| **පිරිවැය** | | | | | | | | | | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | **51,160,000** | 51,160,000 | **14,168,643** | 12,887,043 | **12,710,538** | 12,710,538 | **3,224,599** | 3,224,599 | **1,641,054** | 1,641,054 | **82,904,834** | 81,623,234 |
| එකතු කිරීම් | **-** | - | **1,597,820** | 1,281,600 | **678,505** | - | **2,500** | - | **-** | - | **2,278,825** | 1,281,600 |
| වර්ෂය අවසානයේ | **51,160,000** | 51,160,000 | **15,766,463** | 14,168,643 | **13,389,043** | 12,710,538 | **3,227,099** | 2,278,825 | **1,641,054** | 1,641,054 | **85,183,659** | 82,904,834 |
| **සමුච්චිත ක්ෂය** | | | | | | | | | | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | **31,510,667** | 28,100,000 | **10,928,025** | 9,691,736 | **11,461,562** | 10,648,367 | **3,222,795** | 3,214,063 | **-** | - | **57,123,049** | 51,654,166 |
| වර්ෂය සඳහා ක්ෂයකිරීම් | **3,410,667** | 3,410,667 | **1,342,017** | 1,236,289 | **298,484** | 813,195 | **1,582** | 8,732 | **-** | - | **5,052,750** | 5,468,883 |
| වර්ෂය අවසානයේ ශේෂය | **34,921,334** | 31,510,667 | **12,270,042** | 10,928,025 | **11,760,046** | 11,461,562 | **3,224,377** | 3,222,795 | **-** | - | **62,175,799** | 57,123,049 |
| වර්ෂය අවසානයේ ලියා අඩු කළ අගය | **16,238,666** | 19,649,333 | **3,496,421** | 3,240,618 | **1,628,997** | 1,248,976 | **2,722** | 1,804 | **1,641,054** | 1,641,054 | **23,007,860** | 25,781,785 |

3.1. කෙරීගෙන යන ප්‍රාග්ධන කටයුතුවලට 2019 සහ 2021 කාලය තුළ කාර්යාල අවකාශයට අදාළව සිදු කරන ලද අභ්‍යන්තර ඉදිකිරීම් කටයුතු සඳහා උපදේශකයාට ගෙවන ලද ගාස්තු ඇතුළත් වේ. රජය විසින් ප්‍රාග්ධන වියදම් කප්පාදු කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය කල් දමා ඇති අතර 2025 වර්ෂයේ දී නැවත ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

3.2. භාවිතයේ ඇති සමහර ගෘහ භාණ්ඩ, වැද්දුම් හා සවිකිරීම් භාවිතා කළ හැකි තත්ත්වය මත පදනම්ව, ගෘහ භාණ්ඩ, වැද්දුම් හා සවිකිරීම්වල ප්‍රයෝජනවත් ආයු කාලය අවුරුදු 6-25 සිට අවුරුදු 6-30 දක්වා වෙනස් කිරීමට කළමනාකාරිත්වය විසින් තීරණය කරන ලදී. ක්ෂයකිරීම් වියදම් මත මෙම වෙනස්කම්වල බලපෑම පහත පරිදි වේ;

| | 2024 | 2025 | 2026 | 2026 වර්ෂයෙන් පසුව |
|---|---|---|---|---|
| ක්ෂයකිරීම් වියදම් අඩුවීම/(වැඩිවීම) | 563,240 | 9,618 | (153,041) | (419,811) |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

| | දිනට | 2024 දෙසැ 31 රු. | 2023 දෙසැ 31 රු. |
|---|---|---|---|
| 4 | **අස්පෘශ්‍ය වත්කම්** (මෘදුකාංග සංවර්ධනය) | | |
| | වර්ෂය ආරම්භයේදී ශේෂය | 33,718,500 | 20,158,000 |
| | වර්ෂය තුළ දරන ලද පිරිවැය | 4,181,900 | 13,560,500 |
| | වර්ෂය තුළ ක්‍රමක්ෂය | (7,259,680) | - |
| | වර්ෂය අවසානයේ ශේෂය | 30,640,720 | 33,718,500 |
| 5 | **තැන්පතු (ජංගම නොවන)** | | |
| | කුලී තැන්පතු | 6,879,736 | 6,879,736 |
| | ආරක්ෂක සේප්පු තැන්පතු | 100,000 | 100,000 |
| | | 6,979,736 | 6,979,736 |
| 6 | **නිර්වචිත ප්‍රතිලාභ (වත්කම්) / වගකීම්** | | |
| | වර්ෂය ආරම්භයේදී ශේෂය | 8,086,804 | 2,580,610 |
| | වර්ෂය සඳහා අය කිරීම | 670,620 | 459,937 |
| | වර්ෂය සඳහා පොළිය | 865,794 | 285,206 |
| | ආයුගණක (ලාභය) / අලාභ | 1,666,589 | 6,812,305 |
| | | 11,289,807 | 10,138,059 |
| | වර්ෂය තුළ ගෙවීම් | (1,527,900) | (2,051,255) |
| | | 9,761,907 | 8,086,804 |
| | පාරිතෝෂික අරමුදල (සටහන 6.1) | (18,920,955) | (14,420,640) |
| | වර්ෂය අවසානයේ ශේෂය | (9,159,048) | (6,333,836) |

පහත උපකල්පන භාවිත කරමින් බැඳීමේ වර්තමාන වටිනාකම මනිනු ලැබීය.

| | 2024 | 2023 |
|---|---|---|
| අපේක්ෂිත වැටුප් වර්ධක | 2% | 2% |
| වට්ටම් / පොළී අනුපාතය | 11.5% | 13.5% |
| කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය | 9% | 9% |

*පාරිතෝෂික කොටසක් සඳහා අරමුදල් සම්පාදනයක් කර ඇත.*

| | | 2024 දෙසැ 31 රු. | 2023 දෙසැ 31 රු. |
|---|---|---|---|
| 6.1 | **පාරිතෝෂික අරමුදල** | | |
| | වර්ෂය ආරම්භයේදී ශේෂය | 14,420,640 | 11,474,211 |
| | වර්ෂය තුළ සිදු කරන ලද ආයෝජන | 5,100,000 | 3,950,000 |
| | වර්ෂය තුළ ලැබුණු පොළිය | 928,215 | 1,047,684 |
| | වර්ෂය තුළ ගෙවීම් | (1,527,900) | (2,051,255) |
| | වර්ෂය අවසානයේ ශේෂය | 18,920,955 | 14,420,640 |
| 7 | **තොග** | | |
| | ලිපි ද්‍රව්‍ය | 538,840 | 728,079 |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

| | දිනට | 2024 දෙසැ 31 රු. | 2023 දෙසැ 31 රු. |
|---|---|---|---|
| **8** | **ලැබිය යුතු ගිණුම්** | | |
| | පෙරගෙවීම් | 3,921,146 | 3,131,467 |
| | තැන්පතු | 5,000 | 5,000 |
| | | 3,926,146 | 3,136,467 |
| **9** | **මුදල් සහ මුදල් හා සමාන දෑ** | | |
| | අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | 1,804,772 | 3,327,422 |
| | | 1,804,772 | 3,327,422 |
| **10** | **විලම්භිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන (ජංගම නොවන)** | | |
| | වර්ෂය ආරම්භයේ ශේෂය | 72,813,857 | 66,000,405 |
| | ජංගම නොවන වත්කම් අත්පත් කරගැනීම සඳහා ලැබුණු හා භාවිත කළ ප්‍රදාන | 6,460,725 | 14,842,100 |
| | ලැබුණු ප්‍රදාන සහ පාරිතෝෂික අරමුදලෙහි ආයෝජනය කළ ප්‍රදාන | 5,100,000 | 3,950,000 |
| | වර්ෂය සඳහා ක්ෂය කිරීම් හා ක්‍රමක්ෂය වියදම් | (12,312,430) | (5,468,883) |
| | පාරිතෝෂික අරමුදලෙන් ලැබුණු පොළිය | 928,215 | 1,047,684 |
| | වර්ෂයට අදාළ නිර්වචිත ප්‍රතිලාභ වගකීම්වලට අදාළ වියදම් | (3,203,003) | (7,557,449) |
| | වර්ෂය අවසානයේ ශේෂය | 69,787,364 | 72,813,857 |
| | නියෝජනය වන්නේ: | | |
| | දේපළ, පිරියත සහ උපකරණ | 23,007,860 | 25,781,785 |
| | අස්පෘශ්‍ය වත්කම් | 30,640,720 | 33,718,500 |
| | තැන්පතු (ජංගම නොවන) | 6,979,736 | 6,979,736 |
| | පාරිතෝෂික සඳහා වූ අරමුදලේ අතිරික්තය | 9,159,048 | 6,333,836 |
| | වර්ෂය අවසානයේ ශේෂය | 69,787,364 | 72,813,857 |
| **11** | **විලම්භිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන (ජංගම)** | | |
| | වර්ෂය ආරම්භයේ ශේෂය | 5,318,539 | 3,076,338 |
| | තොග සහ ලැබිය යුතු ගිණුම්වල වැඩිවීම් / (අඩුවීම්) | 600,440 | (17,345) |
| | මුදල් සහ මුදල් හා සමාන දෑ වල වැඩිවීම් / (අඩුවීම්) | (1,522,650) | 61,482 |
| | ගෙවිය යුතු ගිණුම්වල (වැඩිවීම) / අඩුවීම් | (3,153,456) | 2,198,064 |
| | වර්ෂය අවසානයේ ශේෂය | 1,242,873 | 5,318,539 |
| | නියෝජනය වන්නේ: | | |
| | තොග | 538,840 | 728,079 |
| | ලැබිය යුතු ගිණුම් | 3,926,146 | 3,136,467 |
| | මුදල් සහ මුදල් හා සමාන දෑ | 1,804,772 | 3,327,422 |
| | අඩු කළා: ගෙවිය යුතු ගිණුම් | (5,026,885) | (1,873,429) |
| | වර්ෂය අවසානයේ ශේෂය | 1,242,873 | 5,318,539 |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

| | දිනට | 2024 දෙසැ 31 රු. | 2023 දෙසැ 31 රු. |
|---|---|---|---|
| **12** | **ගෙවිය යුතු ගිණුම්** | | |
| | විගණකවරුන්ගේ පාරිශ්‍රමික | **700,000** | 300,000 |
| | ගෙවිය යුතු සේ.අ.අ. | **976,265** | - |
| | ගෙවිය යුතු සේ.භා.අ. | **146,440** | - |
| | MIS සම්පූර්ණ කිරීම සඳහා උපදේශන ගාස්තුව | **1,602,000** | - |
| | සමාලෝචකයින් සඳහා ගෙවිය යුතු වෘත්තීය ගාස්තු | **400,000** | - |
| | ගෙවිය යුතු කාර්ය මණ්ඩල දිරි දීමනා | **39,000** | 34,667 |
| | උපචිත අභ්‍යන්තර විගණන ගාස්තු | **260,000** | 250,000 |
| | උපචිත වාර්ෂික වාර්තා වියදම් | **400,000** | 400,000 |
| | ගෙවිය යුතු උපයෝගිතා වියදම් | **245,421** | 354,537 |
| | ගෙවිය යුතු බැහැරින් ලබා ගත් සේවා | **107,940** | 105,550 |
| | වෙනත් ගෙවිය යුතු මුදල් | **149,819** | 428,675 |
| | | **5,026,885** | 1,873,429 |

| | දිනට | 2024 දෙසැ 31 රු. | 2023 දෙසැ 31 රු. |
|---|---|---|---|
| **13** | **රජයේ ප්‍රදාන** | | |
| | වර්ෂය තුළ ලැබුණු රජයේ ප්‍රදාන | **101,232,887** | 89,412,934 |
| | ලැබුණු ප්‍රදාන සහ පාරිතෝෂික අරමුදලේ ආයෝජනය කළ ප්‍රදාන | **(5,100,000)** | (3,950,000) |
| | ප්‍රාග්ධන වියදම් සඳහා වැය කළ ප්‍රදාන | **(6,460,725)** | (14,842,100) |
| | ශුද්ධ ජංගම වත්කම් මූල්‍යකරණය සඳහා වැය කළ ප්‍රදාන | **4,075,666** | (2,242,201) |
| | වර්ෂය සඳහා ක්ෂය වියදම් සහ ක්‍රමක්ෂ වියදම් | **12,312,430** | 5,468,883 |
| | පාරිතෝෂික අරමුදලින් ලැබුණු පොලිය | **(928,215)** | (1,047,684) |
| | වර්ෂය සඳහා නිර්වචිත ප්‍රතිලාභ වගකීම් | **1,536,414** | 745,143 |
| | මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයේ දැක්වෙන ප්‍රදාන | **106,668,457** | 73,544,974 |
| | වෙනත් විස්තීර්ණ ආදායම් තුළ දැක්වෙන නිර්වචිත ප්‍රතිලාභ වගකීම් යළි ගණනය කිරීමට අදාළ වූ ප්‍රදාන | **1,666,589** | 6,812,305 |
| | වර්ෂය තුළ ගෙවිය යුතු මුදල් ලෙස භාවිතා කළ යුතු ප්‍රදාන | **1,602,000** | - |
| | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා ඇති මුළු විස්තීර්ණ ආදායම්වලට මාරු කරන ලද මුළු ප්‍රදාන | **109,937,046** | 80,357,280 |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| 14 | **විගණකවරුන්ගේ පාරිශ්‍රමික** | | |
| | ජංගම වර්ෂය | 400,000 | 300,000 |
| | පසුගිය වසරේ (අධි) / ඌන වෙන් කිරීම් | - | 53,030 |
| | | 400,000 | 353,030 |
| 15 | **කාර්ය මණ්ඩල පිරිවැය** | | |
| | කාර්ය මණ්ඩල පාරිශ්‍රමික | 40,922,211 | 23,233,105 |
| | සේවක අර්ථසාධක අරමුදල් | 4,447,533 | 2,307,530 |
| | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් | 1,111,883 | 576,883 |
| | නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් (සටහන 15.1) | 608,199 | (302,541) |
| | වෙනත් බාහිරින් ලබා ගත් සේවා සඳහා ගෙවීම් | 1,991,945 | 2,066,720 |
| | කාර්ය මණ්ඩල දිරි දීමනා | 544,882 | 4,617,167 |
| | කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය රක්ෂණය | 1,543,084 | 750,636 |
| | කාර්ය මණ්ඩල සුබසාධනය | 1,170,193 | 1,124,294 |
| | වෙනත් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ | 1,078,530 | 676,688 |
| | | 53,418,460 | 35,050,482 |
| 15.1 | **නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්** | | |
| | වර්ෂය සඳහා ගාස්තු | 670,620 | 459,937 |
| | වර්ෂය සඳහා ශුද්ධ පොළිය | (62,421) | (762,478) |
| | | 608,199 | (302,541) |
| | වෙනත් විස්තීර්ණ ආදායම් ලෙස හෙළිදරව් කළ ආයුගණක ලාභ / අලාභ | 1,666,589 | 6,812,305 |
| | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් කළ නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් | 2,274,788 | 6,509,764 |
| 16 | **වෙනත් පරිපාලන වියදම්** | | |
| | පරිගණක නඩත්තු වියදම් | 899,022 | 158,383 |
| | උපකරණ නඩත්තු වියදම් | 1,395,106 | 850,865 |
| | වාහන නඩත්තු වියදම් | 2,145,616 | 1,548,125 |
| | සන්නිවේදන වියදම් | 1,723,140 | 1,439,876 |
| | වාහන ගාල් කිරීමේ වියදම් | 528,082 | 404,738 |
| | ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් සහ කාර්යාල උපකරණ රක්ෂණය | 202,402 | 159,279 |
| | බැංකු ගාස්තු | 85,708 | 138,454 |
| | ගමන් වියදම් | 125,490 | 138,277 |
| | කාර්යාල වියදම් | 842,294 | 629,154 |
| | වාර්ෂික වාර්තා | 329,788 | (268,559) |
| | නෛතික හා වෘත්තීය ගාස්තු | 516,148 | 359,750 |
| | අභ්‍යන්තර විගණන ගාස්තු | 516,201 | 496,298 |
| | | 9,308,997 | 6,054,640 |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

**17. ප්‍රාග්ධන බැඳීම්**

17.1 2019 වර්ෂයේ දී සහ 2021 වර්ෂයේ සැලැස්ම ආරම්භ කර තිබියදීත්, අරමුදල් සීමා කිරීම් හේතුවෙන් ඉදිකිරීම් කටයුතු සිදු නොවූ බැවින්, කාර්යාල අවකාශයේ අභ්‍යන්තර සැලසුම සහ කොටස් කිරීමේ සැලසුම් සහ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. වර්තමාන මිල ගණන් මත පදනම්ව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 52 කි (බදු හැර).

17.2 ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සම්බන්ධයෙන් ගිවිසුම්ගත වී ඇති අතිරේක ප්‍රාග්ධන වියදම රු. 147,007/- කි.

**18. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු**

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සිදු වී නොතිබුණි.

**19. අසම්භාව්‍ය වගකීම්**

2024 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් නොතිබුණි. (2023 දෙසැම්බර් 31 දිනට - කිසිදු අසම්භාව්‍ය වගකීමක් නොතිබුණි.)

**20. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට පසු සිදුවීම්**

මූල්‍ය ප්‍රකාශනවල යම් ගැළපීමක් හෝ හෙළිදරව් කිරීමක් සිදු කිරීම අවශ්‍ය වන වැදගත් සිදුවීම් කිසිවක් වාර්තා කළ දිනට පසුව සිදු වී නොතිබුණි.

# කාර්යසාධනයේ දස වසරක සාරාංශය

| | ප්‍රගතිය පිළිබඳ අයිතම | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **ප්‍රධාන/නියාමන ක්‍රියාකාරකම්** | | | | | | | | | | |
| 1 | **හඳුනාගත් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් සංඛ්‍යාව (කාල පරිච්ඡේදය අවසානයට)** | 1,410 | 1485 | 1559 | 1579 | 1608 | 1657 | 1680 | 1671 | 1707 | 1,708 |
| 2 | **ලැබුණු මූල්‍ය ප්‍රකාශන** | | | | | | | | | | |
| | ප්‍රකාශන සංඛ්‍යාව | 1,430 | 1,536 | 1,643 | 1,567 | 1,635 | 1,232 | 1,830 | 1,738 | 1,732 | 1,718 |
| | නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් සංඛ්‍යාව | 1,345 | 1,412 | 1,479 | 1,457 | 1,521 | 1,194 | 1,517 | 1,564 | 1,566 | 1,708 |
| 3 | **මූල්‍ය ප්‍රකාශන සමාලෝචන** | | | | | | | | | | |
| | නිම කරන ලද සමාලෝචන සංඛ්‍යාව | 1,122 | 731 | 518 | 638 | 720 | 732 | 552 | 541 | 261 | 388 |
| | නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් සංඛ්‍යාව | 1,068 | 678 | 459 | 608 | 699 | 694 | 525 | 534 | 261 | 381 |
| 4 | **මූල්‍ය ප්‍රකාශන සමාලෝචනවල සොයා ගැනීම්** | | | | | | | | | | |
| | ප්‍රමිතීන්ට අනුකූල වූ මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 553 | 436 | 324 | 430 | 450 | 437 | 312 | 344 | 192 | 200 |
| | ප්‍රමිතීන්ට අනුකූල වූ නමුත් නිරීක්ෂණ උපකාරක ලිපි මගින් සන්නිවේදනය කළ මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 567 | 291 | 185 | 202 | 267 | 293 | 237 | 194 | 66 | 188 |
| | ප්‍රමිතීන්ට අනුකූල නොවූ මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 2 | 4 | 9 | 6 | 2 | 2 | 3 | 2 | 2 | - |
| | අනතුරු ඇඟවීම් නිකුත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | - | - | - | - | - | - | - | - | 1 | - |
| | නීතිපතිවරයාට යොමු කරන ලද මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | - | - | - | - | 1 | - | - | 1 | - | - |
| | | 1,122 | 731 | 518 | 638 | 720 | 732 | 552 | 541 | 261 | 388 |
| 5 | **විගණන පරීක්ෂණ සොයා ගැනීම්** | | | | | | | | | | |
| | නිම කරන ලද විධිමත් විගණන පරීක්ෂණ සංඛ්‍යාව | 91 | 99 | 85 | 31 | 33 | 27 | 34 | 33 | 16 | 22 |
| | නිම කරන ලද තේමාත්මක විගණන පරීක්ෂණ සංඛ්‍යාව | - | - | 15 | 19 | 12 | - | - | - | - | - |
| | නිම කරන ලද විගණන සමාගම් පරීක්ෂණ සංඛ්‍යාව | - | - | - | 2 | - | - | - | - | - | - |
| | පරීක්ෂණ නිම කරන ලද විගණන අයත් විගණන සමාගම් සංඛ්‍යාව | 29 | 14 | 13 | 10 | 7 | 7 | 17 | 9 | 6 | 6 |
| 6 | **විගණන පරීක්ෂණ - විධිමත් පරීක්ෂණවල සොයා ගැනීම්** | | | | | | | | | | |
| | ප්‍රමිතීන්ට අනුකූල වූ විගණන සංඛ්‍යාව | 35 | 41 | 40 | 19 | 18 | 23 | 21 | 23 | 13 | 19 |
| | ප්‍රමිතීන්ට අනුකූල වූ නමුත් නිරීක්ෂණ උපකාරක ලිපි ලෙස සන්නිවේදනය කළ විගණන සංඛ්‍යාව | 56 | 55 | 42 | 11 | 13 | 3 | 12 | 9 | 3 | 3 |
| | ප්‍රමිතීන්ට අනුකූල නොවූ විගණන සංඛ්‍යාව | - | 2 | 2 | - | - | - | - | - | - | - |
| | අනතුරු ඇඟවීම් නිකුත් කරන ලද විගණන සංඛ්‍යාව | - | 1 | - | - | - | 1 | - | - | - | - |
| | විමර්ශනයට යොමු කරන ලද විගණන සංඛ්‍යාව | - | - | 1 | 1 | 2 | - | 1 | 1 | - | - |
| | | 91 | 99 | 85 | 31 | 33 | 27 | 34 | 33 | 16 | 22 |
| 7 | **ලැබු හා අවධානය යොමු කරන ලද මහජන පැමිණිලි සංඛ්‍යාව** | - | 1 | 1 | 2 | 2 | 1 | - | - | - | - |
| 8 | **නිකුත් කරන ලද පැහැදිලි කිරීම් සංඛ්‍යාව** | 7 | 5 | 6 | 2 | 6 | 4 | 2 | - | 4 | - |
| | | 7 | 6 | 7 | 4 | 8 | 5 | 2 | - | 4 | - |
| | **මෙහෙයුම් කටයුතුවල ක්‍රියාකාරකම්** | | | | | | | | | | |
| 9 | **පැවැත්වූ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව** | 8 | 13 | 12 | 12 | 10 | 9 | 14 | 9 | 15 | 7 |
| | පැමිණීම 90% -100% | 4 | 3 | 3 | 1 | 5 | 5 | 4 | 3 | 1 | 1 |
| | පැමිණීම 80% -90% | 3 | 1 | - | 3 | - | 3 | 3 | 2 | 2 | 2 |
| | පැමිණීම 70% -80% | 1 | 3 | 1 | 1 | 2 | 2 | 2 | 2 | 3 | 3 |
| | පැමිණීම 70% කට වඩා අඩු | 3 | 4 | 7 | 6 | 9 | 3 | 5 | 6 | 7 | 7 |
| 10 | **කාර්ය මණ්ඩලයේ දැනුම් වර්ධන ක්‍රියාකාරකම් සංඛ්‍යාව** | 46 | 13 | 48 | 48 | 41 | 37 | 47 | 33 | 19 | 55 |

# කාර්යසාධනයේ දස වසරක සාරාංශය

| | ප්‍රගතිය පිළිබඳ අයිතම | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 11 | ජාත්‍යන්තර සංවිධානවල රැස්වීම් සහ වෙනත් සැසි සඳහා සහභාගී වීම | 6 | 19 | 9 | 8 | 8 | - | 4 (අතථ්‍ය) | 2 (අතථ්‍ය) | - | - |
| 12 | මුළු කාර්ය මණ්ඩලය (කාලපරිච්ඡේදය අවසානයට) | 20 | 21 | 22 | 21 | 17 | 18 | 17 | 16 | 10 | 15 |
| 13 | මුළු තාක්ෂණික කාර්ය මණ්ඩලය (කාලපරිච්ඡේදය අවසානයට) | 14 | 15 | 15 | 14 | 11 | 11 | 10 | 9 | 5 | 7 |
| 14 | මෙහෙයුම් වියදම් රු. 000 වලින් | | | | | | | | | | |
| | - තථ්‍ය | 69,159 | 72,371 | 84,352 | 90,138 | 78,512 | 65,159 | 71,236 | 77,015 | 71,545 | 104,668 |
| | - අයවැයගත | 66,000 | 66,000 | 80,000 | 88,000 | 100,000 | 92,657 | 127,036 | 120,000 | 118,496 | 120,000 |
| | -වැඩිවීම ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී තථ්‍ය පිරිවැයේ % ක් වශයෙන් | 13.5 | 4.6 | 16.6 | 6.9 | -12.9 | -17.0 | 9.3 | 8.1 | -7.1 | 46.3 |
| 15 | කාර්ය මණ්ඩල පිරිවැය රු. 000 වලින් | | | | | | | | | | |
| | - තථ්‍ය | 37,322 | 39,350 | 42,351 | 44,084 | 41,488 | 36,923 | 35,496 | 39,456 | 35,050 | 53,418 |
| | - අයවැයගත | 38,102 | 36,095 | 40,471 | 41,637 | 47,390 | 44,451 | 73,822 | 71,719 | 67,223 | 78,650 |
| | - වැඩිවීම ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී තථ්‍ය පිරිවැයේ % ක් වශයෙන් | 18.0 | 5.4 | 7.6 | 4.1 | -5.9 | -11.0 | -3.9 | 11.2 | -11.2 | 52.4 |
| | - මෙහෙයුම් වියදමේ % වශයෙන් | 54.0 | 54.4 | 50.2 | 48.9 | 52.8 | 56.7 | 49.8 | 51.2 | 49.0 | 51.0 |

# නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්

පනත සහ පනත යටතේ කරනු ලැබූ නියෝග ප්‍රකාර, පහත සඳහන් ආයතන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ලෙස නිර්වචනය කර ඇත.

- බලපත්‍රලාභී බැංකු
- රක්ෂණ ව්‍යාපාර කටයුතු කරගෙන යෑම සඳහා බලය පවරන ලද සමාගම්
- කල්බදු ව්‍යාපාර කටයුතුවල නිරත වී සිටින සමාගම්
- ණය නිශ්කාෂණ සමාගම්
- මූල්‍ය සමාගම්
- ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් ලෙස හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දන් ලෙස ව්‍යාපාර කටයුතු කරගෙන යෑමට බලපත්‍ර ලත් සමාගම්
- ඒකක භාර ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍ර ලත් සමාගම්
- අරමුදල් කළමනාකරණ සමාගම්
- කොටස් හුවමාරුවක් ලෙස ක්‍රියා කිරීමට බලපත්‍ර ලත් සමාගම්
- කොටස් වෙළඳපළේ ලැයිස්තුගත සමාගම්
- වෙනත් සමාගම්
  - (අ) රුපියල් මිලියන 5000ට වැඩි පිරිවැටුමක් සහිත සමාගම්
  - (ආ) පසුගිය මුදල් වර්ෂය අවසානයේ දී කොටස් හිමියන්ගේ ස්කන්ධය රුපියල් මිලියන 1000ට වැඩි සමාගම්
  - (ඇ) පසුගිය මුදල් වර්ෂය අවසානයේ දී මුළු වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 3000ට වැඩි සමාගම්
  - (ඈ) පසුගිය මුදල් වර්ෂය අවසානයේ දී බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවලට රුපියල් මිලියන 1000ට වැඩි බැරකම් ඇති සමාගම්
  - (ඉ) සේවකයින් 1000ට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුතු සමාගම්
- භාණ්ඩ අලෙවියෙහි හෝ සේවා සැලසීමෙහි නියුතු රාජ්‍ය සංස්ථා
- ඉහත සඳහන් කුමන හෝ කාණ්ඩයකට අයත් වන ව්‍යාපාර සමූහයක්. මෙහි දී ව්‍යාපාර සමූහය යන්නෙන් අදහස් වන්නේ සමාගම් පනත යටතේ ගිණුම් ඒකාබද්ධ කළ යුතු එක් පාලක සමාගමක් හා එහි පාලිත සමාගම්ය.

**ආයතනයේ නම**

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

**නෛතික තත්වය**

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත අනුව
සංස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි

**සංස්ථාපිත කරන ලද රට**

ශ්‍රී ලංකාව

**ප්‍රධාන කාර්යාලය**

තෙවන මහල,
293, ගාලු පාර, කොළඹ 03
දුරකථන අංකය: 011 2301210 / ෆැක්ස් අංකය: 011 2301211
විද්‍යුත් තැපෑල - info@slaasmb.gov.lk

**වෙබ් අඩවිය**

www.slaasmb.gov.lk

**විගණකවරුන්**

**ව්‍යවස්ථාපිත විගණකවරුන්**
විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
නො. 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල

**අභ්‍යන්තර විගණකවරුන්**

ඩිලොයිට් රිස්ක් ඇඩ්වයිසරි සර්විසස් (පුද්.) සමාගම
නො. 100, බ්‍රේබෲක් පෙදෙස, කොළඹ 02

**බැංකුකරු**

ලංකා බැංකුව

**නීති උපදේශකවරු**

නීතිපතිතුමා
නීතිපති දෙපාර්තමේන්තුව
කොළඹ 12

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය
3වන මහල, 293, ගාලු පාර, කොළඹ 3, ශ්‍රී ලංකාව.